## දෙවැනි කොටස


| | | | |
|---|---|---|---|
| මහ බැංකුවේ ගිණුම් හා කටයුතු | .. | .. | I - L |
| කාර්ය මණ්ඩල පුවත් | .. | .. | LI - LIII |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | | | පිටුව |
|---|---|---|---|
| ගිණුම් සහ බැංකු කටයුතු | .. | .. | I |
| ව්‍යවහාර මුදල් නිකුතුව | .. | .. | IX |
| බැංකු සංවර්ධන | .. | .. | X |
| බැංකු අධීක්ෂණ | .. | .. | XIV |
| බැංකු නොවන මූල්‍ය ආයතන | .. | .. | XV |
| සංවර්ධන මුදල් | .. | .. | XIX |
| ග්‍රාමීය ණය | .. | .. | XXIX |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | .. | .. | XXX |
| ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය | | .. | XXXIII |
| සේවක අර්ථ සාධක අරමුදල | .. | .. | XXXIV |
| විනිමය පාලන | .. | .. | XXXVI |
| රාජ්‍ය ණය | .. | .. | XLII |
| ප්‍රාදේශීය කාර්යාල - මාතර, අනුරාධපුරය සහ මාතලේ | | .. | XLIII |
| ප්‍රවෘත්ති හා ප්‍රකාශන | .. | .. | XLIV |
| පර්යේෂණ කටයුතු | .. | .. | XLVI |
| කළමනාකාරිත්ව විගණන | .. | .. | XLVI |
| සමීක්ෂණ දත්ත රැස් කිරීම සහ විශේෂ ප්‍රකාශන | | .. | XLVI |
| පුහුණු කිරීම් | .. | .. | XLVIII |
| පරිශ්‍ර | .. | .. | XLVIII |
| සුබ සාධන | .. | .. | L |
| කාර්ය මණ්ඩල පුවත් | .. | .. | LI |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

**ගිණුම් හා බැංකු කටයුතු**

1991 දෙසැම්බර් 31 දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය හා ලාභ අලාභ ගිණුම 2.1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1991 වර්ෂය අවසානය වන විට මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 95,835 ක් විය. මෙය පසුගිය වසර හා සසඳන විට සියයට 23.7 ක වැඩිවීමකි.

වත්කම් අංශය සලකන විට මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත සියයට 79 කින්ද, දේශීය වත්කම් සියයට 12.9 කින්ද, වැඩි වූ අතර අනෙකුත් වත්කම් හා ගිණුම් සියයට 1.3 කින් අඩුවිය. පසුගිය වසර හා සසඳන විට දේශීය වත්කම් අතර මධ්‍යම හා දිගුකාලීන අත්තිකාරම් සියයට 55.2 කින්ද, රජයට සපයන ලද ණය හා අත්තිකාරම් ප්‍රමාණය සියයට 44.4 කින්ද, මූල්‍ය ආයතන සඳහා දායකවීම් සියයට 36.2 කින්ද, භාණ්ඩාගාර බිල්පත් දැරීම් සියයට 10.4 කින්ද වැඩිවිය. කෙසේ වුවද කෙටිකාලීන අත්තිකාරම් ප්‍රමාණය සියයට 70.9 කින් සැලකිය යුතු ලෙස අඩුවීමක් වාර්තා විය.

වගකීම් අංශය සලකන විට කලින් වසරේ ලාභයෙන් රුපියල් දශ ලක්ෂ 250 ක් අතිරික්ත ගිණුමට මාරු කිරීම නිසා ප්‍රාග්ධන ගිණුම සියයට 41.2 ක වැඩිවීමක් පෙන්නුම් කර ඇත. මුළු වගකීම් වල විශාලතම තනි අයිතමය වන සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් ප්‍රමාණය පසුගිය වරසට වඩා සියයට 15.2 ක වැඩිවීමක් පෙන්නුම් කර ඇත. මහ බැංකුව වෙතැති සමස්ත තැන්පතු ප්‍රමාණය සියයට 64.5 කින් ඉහළ නැගුණු අතර, එයට අයත්වන රජයේ තැන්පතු සියයට 150.9 කින්ද, වාණිජ බැංකු තැන්පත සියයට 66.6 කින්ද, ජාත්‍යන්තර ආයතන, විදේශ ආණ්ඩු හා විදේශ බැංකු, ආයතන සතු තැන්පතු සියයට 37. 1 කින්ද වැඩි විය. රජයේ නියෝජිත ආයතන සතු තැන්පතුවල සියයට 51.5ක අඩුවීමක් වාර්තා විය. මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදල සියයට 23.1 ක වැඩිවීමක් වාර්තා කර ඇත. (මහ බැංකුවේ වත්කම් හා වගකීම්වල ප්‍රධාන අංශ පිළිබඳ සැසඳුමක් 2.2 සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත.)

1991 වසරෙහි මහ බැංකුවේ වූ ආදායම රුපියල් දශ ලක්ෂ 8,951 ක් වූ අතර, එය පසුගිය වසරට වඩා සියයට 15.9 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. වියදම් හා සංචිත ගිණුමට කරන ලද වෙන් කිරීම්ද, ක්ෂයවීම් හා අනෙකුත් ගෙවීම්ද වෙන් කළ විට අදාළ වර්ෂය සඳහා මහ බැංකුවේ ශුද්ධ ලාභය රුපියල් දශ ලක්ෂ 1,293 ක් විය. මුදල් නීති පනතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර රුපියල් දශ ලක්ෂ 143 ක් බැංකුවේ අතිරික්ත ගිණුමට මාරු කිරීම සඳහා වෙන් කළ අතර රුපියල් දශ ලක්ෂ 1,150 ක ඉතිරි ශේෂය මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර ඒකාබද්ධ අරමුදලට ගෙවීම සඳහා වෙන් කෙරුණි.

**විදේශ විනිමය කටයුතු**

වාණිජ බැංකු සමග කෙරෙන විනිමය ගණුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලරය සඳහා වූ එකැන් ගැනුම් හා විකුණුම් මිල තීරණය කිරීම තවදුරටත් මහ බැංකුව විසින් කරගෙන යන ලදී. 1991 දෙසැම්බර් 10 දින සිට බල පැවැත්වෙන පරිදි එ. ජ ඩොලරය සඳහා වූ දෛනික විනිමය අනුපාත නියම කිරීමේ නව ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. නව ක්‍රමය යටතේ පහත දැක්වෙන ප්‍රධාන සාධකයන්ට යටත්ව පරාසයක් තුළ එ. ජ. ඩොලරය සඳහා සිය ගැනුම් හා විකුණුම් මිල මහ බැංකුව විසින් පෙරවරුවේදී ප්‍රකාශයට පත් කරණු ලැබේ.

1990. 12. 28 වැනි දින හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ

## වගකීම්

| 1990 දෙසැම්බර් 28 වැනි දින රුපියල් | | | 1991 දෙසැම්බර් 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම** | | |
| 15,000,000 | | ප්‍රාග්ධනය .. | 15,000,000 | |
| 592,000,000 | 607,000,000 | අතිරික්තය .. | 842,000,000 | 857,000,000 |
| | | **සංසරණයේ පවත්නා** | | |
| | | ව්‍යවහාර මුදල් | | |
| 22,869,022,916 | | නෝට්ටු .. | 26,411,240,020 | |
| 1,031,510,896 | 23,900,533,812 | කාසි .. | 1,111,353,950 | 27,522,593,970 |
| | | **තැන්පතු** | | |
| 3,593,301,872 | | රජය .. | 9,016,971,676 | |
| 220,749,507 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන .. | 107,140,735 | |
| 7,457,546,661 | | වෙළඳ බැංකු .. | 12,426,154,793 | |
| 9,481,396,781 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන .. | 12,994,279,929 | |
| 133,632 | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 19,443,650/- හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල .. | 346,094 | |
| 670,247,118 | 21,423,375,571 | අනෙකුත් .. | 704,012,736 | 35,248,905,963 |
| | 999,397 | විදේශීය ණය ගැනීම් .. | | - |
| | 3,250,000,000 | මධ්‍යම හා දීර්ඝ කාලීන ණය අරමුදල .. | | 4,000,000,000 |
| | 372,750,000 | ප්‍රාග්ධන දයක දිමනා ගිණුම | | 507,750,000 |
| | 27,907,282,093 | අනෙකුත් වගකීම් හා ගිණුම් | | 27,698,765,231 |
| | 77,461,940,873 | | | 95,835,015,164 |

1991 දෙසම්බර් 31 වැනි දිනෙන්

| 1990 දෙසැම්බර් 28 වැනි දින රුපියල් | | | 1991 දෙසැම්බර් 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | 6,976,653,959 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා ඉඩම් සහ ගොඩ නැගිලි සහ කාර්යාල උපකරණ සඳහා ක්ෂය කිරීම් ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර කරන ලද වෙන් කිරීම් | | 7,658,214,373 |
| | | 1991 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වර්ෂයේ ශුද්ධ ලාභය | | |
| 250,000,000 | | මූල්‍ය ගැලපීම් ගිණුමට මුදල් නීති පනතේ 39 (අ) වගන්තිය ප්‍රකාර ශේෂය පියවීමට | 143,000,000 | |
| | | මුදල් නීති පනතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයක් වශයෙන් යොදා ගන්නා ලදී. | | |
| 500,000,000 | 750,000,000 | මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට | 1,150,000,000 | 1,293,000,000 |
| | 7,726,653,959 | | | 8,951,214,373 |

එච්. එන් එස් කරුණාතිලක
අධිපති

එම්. බී. දිසානායක
ප්‍රධාන ගණකාධිකාරී

## වත්කම්

| 1990 දෙසැම්බර් 28 වැනි දින රුපියල් | | | 1991 දෙසැම්බර් 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 8,460,710,058 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් .. | 21,318,200,937 | |
| 7,533,610,210 | | *විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් .. | 7,331,728,788 | |
| 16,337,923 | 16,010,658,191 | විශේෂ ගැනීම් හිමිකම් දැරීම | 10,003,786 | 28,659,933,511 |
| | | **දේශීය වත්කම්** | | |
| 11,161,696,884 | | ණය සහ අත්තිකාරම් රජයට .. | 16,117,313,293 | |
| 2,545,258,079 | | අනෙකුත් අයට-මධ්‍යම හා දීර්ඝ කාලීන .. | 3,949,828,378 | |
| 4,785,005,960 | | කෙටි කාලීන .. | 1,394,248,551 | |
| 27,044,307,233 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් .. | 29,863,952,320 | |
| 372,750,000 | 45,909,018,156 | මූල්‍ය සහ අනෙකුත් ආයතන වලට දායක දීමනා | 507,750,000 | 51,833,092,542 |
| | 15,542,264,526 | අනෙකුත් වත්කම් හා ගිණුම්. 1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 5,527,675/- ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 57,450/- ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙළින් රු.2,933,697/- ක් සහ රු. 34,340/- ක් විය.) | | 15,341,989,111 |
| | 77,461,940,873 | | | 95,835,015,164 |

## අවසන්වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

| 1990 දෙසැම්බර් 28 වැනි දින රුපියල් | | | 1991 දෙසැම්බර් 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | 7,726,653,959 | පොළී ආදිය .. | | 8,951,214,373 |
| | 7,726,653,959 | | | 8,951,214,373 |

1991 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්, 1971 අංක 38 දරණ මුදල් පණතේ 13 (1) වගන්තිය සහ 1949 අංක 58 දරණ මුදල්නීති පනතේ 42 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංග්‍රහයේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. එකී මුදල් නීති පනතේ 42 (2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමති තුමා වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරෙනු ඇත.

**එස්. එම්. සබ්රි**
**වැඩබලන විගණකාධිපති**

**1992 අප්‍රේල් මස 15 වැනි දින.**
**කොළඹ 7.**
**විගණකාධිපති දෙපාර්තමේන්තුවේදිය.**

2.2 සංඛ්‍යා සටහන

**1990 හා 1991 මුදල් වර්ෂයත්ගේ අවසාන දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම් හා වගකීම්වල වූ ප්‍රධාන අයිතමයත්ගේ සැසඳීම.**

| අයිතමය | වගකීම් 1990 රුපියල් දශ ලක්ෂ | වගකීම් 1990 % | වගකීම් 1991 රුපියල් දශ ලක්ෂ | වගකීම් 1991 % | අයිතමය | වත්කම් 1990 රුපියල් දශ ලක්ෂ | වත්කම් 1990 % | වත්කම් 1991 රුපියල් දශ ලක්ෂ | වත්කම් 1991 % |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම . . | 607.0 | 0.8 | 857.0 | 0.9 | ජාත්‍යන්තර සංචිතය | 16,010.6 | 20.7 | 28,659.9 | 29.9 |
| සංසරණයේ පවත්නා ව්‍යවහාර මුදල් . . | 23,900.5 | 30.9 | 27,522.6 | 28.7 | | | | | |
| තැන්පතු . . | 21,423.3 | 27.6 | 35,248.9 | 36.8 | දේශීය වත්කම් | 45,909.0 | 59.2 | 51,833.1 | 54.1 |
| විදේශීය ණය ගැනීම් . . | 1.0 | - | - | - | | | | | |
| මධ්‍යම හා දිගුකාලීන ණය . . | 3,250.0 | 4.2 | 4,000.0 | 4.2 | අනෙකුත් වත්කම් | 15,542.3 | 20.1 | 15,342.0 | 16.0 |
| ප්‍රාග්ධන දයක දීමනා ගිණුම . . | 372.8 | 0.5 | 507.7 | 0.5 | | | | | |
| අනෙකුත් වගකීම් . . | 27,907.3 | 36.0 | 27,698.8 | 28.9 | | | | | |
| එකතුව . . | 77,461.9 | 100.0 | 95,835.0 | 100.0. | එකතුව | 77,461.9 | 100.0 | 95,835.0 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) අභ්‍යන්තර විදේශ විනිමය වෙළඳපොලේ විදේශ ව්‍යවහාර මුදල් සඳහා ඇති ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන්
(ආ) ඒක්ෂණ මුදල් වෙළඳපොලේ කටයුතු හා බැංකු ක්‍රමය සතු සමස්ත ද්‍රවශීලතා තත්ත්වය
(ඇ) ප්‍රධාන මූල්‍ය මධ්‍යස්ථානවල විදේශීය විනිමය අන්තර් අනුපාතයන්හි වෙනස්වීම්
(ඉ) රට තුළ පවතින ජාත්‍යන්තර සංචිතයන්හි සමස්ථ තත්ත්වය.

අභ්‍යන්තර විදේශ විනිමය වෙළඳපොල තවදුරටත් වර්ධනය කිරීම සඳහා මහ බැංකුව විසින් මෙම වෙනස්කම් ඇති කරන ලදී.

මහ බැංකුව වානිජ බැංකු සමග අඛණ්ඩව එ. ජ. ඩොලර් ඉදිරි මිලදී ගැනුම් වෙළඳපොලේ කටයුතුවල තව දුරටත් නිරත වූ අතර, එවැනි ආවරණයක් සඳහා වූ කාලය මාස 6 ක් දක්වා විය.

### රත් අලෙවිය

විමසුමට ලක් කරන ලද වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව, එහි තෙවැනි රත් අලෙවි සැල ප්‍රධාන කාර්යාලයෙහි විවෘත කළේය. මෙය කටුනායක පිහිටි, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි ඇති රත් අලෙවි සැල් දෙකට අමතර වශයෙන් විය. මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයෙහි 1991 මාර්තුවල විවෘත කරන ලද රත් අලෙවි සැල, 1991 අගෝස්තු දක්වා, මහ බැංකුව විසින් නියම කරන ලද විදේශීය ව්‍යවහාර මුදල් වලට පමණක් රත්රන් අලෙවි කළ අතර, අනතුරුව විදේශීය ව්‍යවහාර මුදල් සඳහා රත් අලෙවිය අත්හිටුවමින් ශ්‍රී ලංකා රුපියල් සඳහා අලෙවි කිරීම ආරම්භ කළේය. දැන් මෙම අලෙවි සැලෙන් සීමාවකින් තොරව සහනදායී තීරු බදු අනුපාතිකයකට යටත්ව රත් මිලදී ගත හැකිය.

### ආසියාතු නිශ්කාෂණ සංගමය

ආසියාතු නිශ්කාෂණ සංගමය (ආ. නි. සං.) මගින් සිදු කෙරුණ මුළු ගණුදෙනු ප්‍රමාණය පසුගිය වසර තුලවූ රුපියල් දශ ලක්ෂ 11,442 හා සසඳන විට 1991 වසරේදී රුපියල් දශ ලක්ෂ 23,906 ක් විය. 1990 වසරේ රුපියල් දශ ලක්ෂ 4, 401 හා සසඳන විට 1991 දී විදේශ මුදල් වලින් සිදු කෙරුණු ශුද්ධ පියවීම්වල රුපියල් වටිනාකම රුපියල් දශ ලක්ෂ 8,756 ක් විය. 1989 වසරේ හඳුන්වා දෙන ලද සාමාජිකයන් අතර හුවමාරු පහසුකම මේ වසර තුලද තවදුරටත් ක්‍රියාත්මක විය. මේ පහසුකම යටතේ ශ්‍රී ලංකාව, 1991 දී රුපියල් දශ ලක්ෂ 61 කට දායක වී ඇත.

කලාපීය සහයෝගීතාවය සඳහා වූ දකුණු ආසියාතු සංගමය (සාක්) විසින් සාක් ගමන් චවුචර් ක්‍රමය යටතේ ගිණුම් පියවීම සඳහා ආ. නි. සංගම් වැඩපිළිවෙල ප්‍රයෝජනයට ගැනීමට ඉදිරිපත් කළ යෝජනාවට ආ. නි. සංගමයේ සාමාජික රටවල් විසින් ඔවුන්ගේ කැමැත්ත ලබාදී තිබුණි.

### මහ බැංකු පොලී අනුපාතය

රජයේ සුරැකුම්පත් ඇපකර මත හා වාණිජ හා නිෂ්පාදන ණය සම්බන්ධ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපකර මත වාණිජ බැංකු සඳහා සපයන කෙටිකාලීන ණය සහ අත්තිකාරම් සඳහා වූ මහ බැංකු පොලී අනුපාතය (බැංකු පොලිය) 1991 ජනවාරි මස 4 දින සිට සියයට 15 සිට සියයට 17 දක්වා වැඩි කරන ලදී.

**කෙටිකාලීන ණය**

අපනයන ණය ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ (අ.ණ. ප්‍ර. යෝ. ක්‍ර.) මහ බැංකුව, වාණිජ බැංකුවලට ණය පහසුකම් සැපයීමෙහි තව දුරටත් නිරත විය. වර්ෂය තුල පහත දැක්වෙන පරිදි අවස්ථා තුනකදීම පොලී අනුපාතියන් ඉහළ නැගුණි.

**2.3 සංඛ්‍යා සටහන**

**අපනයන ණය ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ සංශෝධිත පොලී අනුපාත** (වර්ෂයකට සියයට)

| ක්‍රියාත්මක වන දිනය | කාණ්ඩ I | | කාණ්ඩ II | |
|---|---|---|---|---|
| | සංශෝධිත අනුපාතය | වාණිජ බැංකු සඳහා ආන්තිකය | සංශෝධිත අනුපාතය | වාණිජ බැංකු සඳහා ආන්තිකය |
| 91.01.04 | 13 | 2 | 8 | 3.8 |
| 91.08.15 | 15 | 3 | 10 | 3.8 |
| 91.12.23 | 17 | 3 | 12 | 3.8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මහ බැංකුව විසින් අපනයන ණය ප්‍රතිමූල්‍ය මත අය කරන ලද පොලියෙන් ප්‍රතිශත අංක 4 ක් ආපසු ගෙවීම තවදුරටත් කරගෙන ගිය අතර එමගින් විනිමය පාලක විසින් නිශ්චය කරන ලද කාලසීමාව තුල අපනයන ඉපැයීම් ලංකාවට ලැබුණු බව සනාථ කරන අපනයනකරුවන් වෙත මෙම ප්‍රතිලාභය පැවරීමට අදාල වාණිජ බැංකුවලට හැකියාව ලැබුණි.

ඉහත කාණ්ඩ දෙක යටතේ සැපයෙන ප්‍රතිමූල්‍ය ප්‍රමාණය සහ ආවරණය සම්බන්ධයෙන් වෙනස්කම් කිහිපයක් හඳුන්වා දෙන ලදී. තේ තොග සහ මසා නිම කළ ඇඳුම් සඳහා කාණ්ඩ 1 යටතේ සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම්, පිළිවෙළින් 1991 මාර්තු 31 හා 1991 අප්‍රියෙල් 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කෙරුණි. වාණිජ බැංකු විසින් දෙනු ලබන ඇසුරුම් ණය ක්‍රමයට අදාලව මහ බැංකුව විසින් මේ කාණ්ඩය යටතේ අනෙකුත් අයිතමයන්ට සපයනු ලබන ප්‍රතිමූල්‍ය ප්‍රමාණය 1991 අප්‍රියෙල් 02 සිට බලපාන පරිදි සියයට 100 සිට සියයට 50 දක්වා අඩු කරන ලදී.

කාණ්ඩ II යටතේ සැපයෙන ප්‍රතිමූල්‍ය ප්‍රමාණය 1991 සැප්තැම්බර් 04 දින සිට බලපාන පරිදි වාණිජ බැංකුව විසින් අපනයනකරු වෙත දෙනු ලබන ණය මුදලින් සියයට 75 කට සීමා කෙරුණි. නමුත් මෙය 1991 ඔක්තෝබර් 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි වාණිජ බැංකු විසින් දෙනු ලබන ණය ප්‍රමාණය නොඉක්මවන සේ ණයවර ලිපියෙහි හෝ ආයතනයේ අපනයන ඇණවුමෙහි නැ. වි. ස. වටිනාකමෙන් සියයට 60 ක් වශයෙන් සංශෝධනය කෙරුණි. කාණ්ඩ II යටතේ අපනයන සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම විධිමත් කිරීමේ අරමුණ ඇතිව මෙම ණය ක්‍රමය තවදුරටත් විමසුමට ලක් කරමින් 1991 සැප්තැම්බර් 4 දින සිට බලපාන පරිදි එම පහසුකම ප්‍රමුඛ හා ඉහළ එකතු කළ අගයක් ඇති කාණ්ඩ සඳහා සීමා කෙරුන අතර, එක් එක් අපනයන අයිතමයන් සම්බන්ධයෙන් එක් එක් තනි අපනයනකරුවෙකුට රුපියල් දශ ලක්ෂ 10 ක උපරිම ණය සීමාවක් පනවන ලදී. ඉහළ එකතු කළ අගයක් සහිත එහෙත් සම්ප්‍රදායික හෝ හොඳින් ව්‍යාප්ත වූ විශේෂිත නිෂ්පාදනයන් සඳහා එක් එක් බැංකුවට වෙන්කර ඇති සීමාවන්ට යටත්ව කාණ්ඩ 1 යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ලදී.

1991 අප්‍රියෙල් 02 දින සිට බලපැවැත්වෙන පරිදි අපයනනාභිමුඛ ගෙවුඩ කර්මාන්තකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ගෙවුඩගල් නැවත සකස් කිරීමට අදාල නව ප්‍රතිමූල්‍ය ක්‍රමයක් හඳුන්වා

දෙනලැබිය. මේ යෝජනා ක්‍රමය යටතේ එක් එක් තෝරාගත් බැංකුවකට රුපියල් දශ ලක්ෂ 25 ක මුදල් ප්‍රමාණයක් වෙන් කරන ලදී. මේ සඳහා වාර්ෂික පොලී අනුපාතය සියයට 13 ක් වශයෙන් නියම කෙරුණු අතර ණය දීමේදී තබා ගතහැකි ආන්තිකය වසරකට සියයට 4 ක් විය.

වී, එළවළු සහ වෙනත් විශේෂිත භෝග නිෂ්පාදිත සම්බන්ධව කටයුතු කරන සමුපාකාර සමිතිවල හෝ පුද්ගලයන්ගේ භාවිතිය පොරොන්දු නෝට්ටු මත සහ සහතික මිල ක්‍රමය යටතේ (ස.මි.ක්‍ර ) හා මහල් මිල ක්‍රමය යටතේ ද්‍රව්‍ය මිලදී ගැනීම හා ගබඩා කිරීම සඳහා සැපයෙන මහ බැංකු ණය අත්තිකාරම් සඳහා වූ වාර්ෂික පොලී අනුපාතය පහත දැක්වෙන පරිදි වැඩි කෙරුණි.

**2.4 සංඛ්‍යා සටහන**

**කෙටිකාලීන පොලී අනුපාත සංශෝධනය - නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය (න.ස.ග්‍රා. ණ. ක්‍ර.) සහ අලෙවිකරණය**

| බලපැවැත්වෙන දිනය | න.ස.ග්‍රා.ණ. | අලෙවිකරණය |
|---|---|---|
| 04.01.91 | 6.5 | 5.0 |
| 15.08.91 | 8.5 | 7.0 |
| 23.12.91 | 8.5 | 9.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මධ්‍ය හා දිගු කාලීන ණය අරමුදල

1990 වසරේ අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 3,250 ක් ව පැවති මධ්‍ය හා දීර්ඝ කාලීන ණය අරමුදල 1991 වසර අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 4,000 දක්වා වැඩි විය.

මධ්‍ය හා දිගු කාලීන ණය අරමුදලේ සියලුම කාණ්ඩ සඳහා පැවති පොලී අනුපාතිකයන් 1991 ජනවාරි 4 දින සිට ප්‍රතිශත අංක 2 කින් ඉහළ ගිය අතර 1991 අගෝස්තු 15 දින සිට තවත් ප්‍රතිශත අංක 2 කින් ඉහල නැගුණි. වර්ෂය තුලදී අදාල ණය දෙන ආයතන සඳහා වූ පොලී අනුපාතික කාණ්ඩ 1 යටතේ වාර්ෂිකව සියයට 7 ක් සහ අනෙකුත් කාණ්ඩ තුන යටතේ වාර්ෂිකව සියයට 4 ක් වශයෙන් නොවෙනස්ව පැවතුනි. සංශෝධිත පොලී අනුපාතිකයන් පහත දැක්වේ.

**2.5 සංඛ්‍යා සටහන**

| | මුළු ව්‍යාපෘති පිරිවැය රුපියල් දශ ලක්ෂ 5ක් හා ඊට අඩු | මුළු ව්‍යාපෘති පිරිවැය රුපියල් දශ ලක්ෂ 5ට වැඩි | ණය දෙන ආයතන වලට ලබාදෙන ආන්තිකය වසරකට සියයට |
|---|---|---|---|
| කාණ්ඩ I | 11% | 11% | 7% |
| කාණ්ඩ II | 9% | 10% | 4% |
| කාණ්ඩ III | 12% | 12% | 4% |
| කාණ්ඩ IV | 14% | 14% | 4% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මෙම ණය ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම 1991 දෙසැම්බර් 23 දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවන ලදී.

**මූල්‍ය සමාගම් සඳහා පහසුකම්**

1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනතේ 20(4) සහ 21 (1) වගන්තිය ප්‍රකාර තාවකාලික ද්‍රවශීලතා ප්‍රශ්න පවතින සහ/හෝ කළමනාකාරිත්වය හා පරිපාලනය මුදල් මණ්ඩලය වෙත පවරාගත් බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා ණය පහසුකම් සැලසීම සඳහා කෙරෙන ණය

සැපයීම වෙනුවෙන් වාණිජ බැංකුවලට පහසුකම් සැලසීම මහ බැංකුව මගින් තවදුරටත් කරගෙන යන ලදී. 1991 අවසාන වන විට මේ යටතේ රුපියල් දශ ලක්ෂ 900 ක් නිකුත් කර තිබුණි.

## සංචිත අවශ්‍යතාවයන්

1991 ජනවාරි 11 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලුම්, කාලීන, සහ ඉතුරුම් තැන්පතු වගකීම් සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 13 ක් වශයෙන් නියම කෙරිණි. එදින වන විට තමන්ගේ සංචිත අවශ්‍යතාවයෙන් කොටසක් වශයෙන් භාණ්ඩාගාර බිල්පත්වලින් පවත්වාගෙන යාමට වාණිජ බැංකුවලට ලබාදුන් පහසුකම ඉවත් කරන ලදී.

## භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ද්විතියක වෙළෙඳපොළ

භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ද්විතීයික වෙළෙඳපලේ මුළු විකුණුම් පිරිවැටුම 1990 දී රුපියල් දශ ලක්ෂ 67,907 සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 78,254 දක්වා වැඩිවිය. වර්ෂය තුළ මිළදී ගැනීම් පිරිවැටුමද රුපියල් දශ ලක්ෂ 21,355 සිට රුපියල් දශ ලක්ෂ 37,486 දක්වා වැඩි විය. බැංකු නොවන අංශයට අදාල ශුද්ධ විකුණුම් පිරිවැටුම 1990 දී රුපියල් දශලක්ෂ 8,132 සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 9,658 දක්වා වැඩි විය.

අදාල වර්ෂය තුල භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ද්විතීය වෙළෙඳ පොලේ කටයුතු සඳහා බලපාන ලද වාර්ෂික වට්ටම් අනුපාතිකය සියයට 12 සිට සියයට 15. 25 දක්වා වෙනස් විය.

## මෙරට හැර යන ඉන්දියානුවන් සඳහා වූ සහනාධාර හා කරුණාසහගත ගෙවීම

1964 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු සම්භවයෙන් පැවත එන වතු කම්කරුවන් ආපසු යැවීම සම්බන්ධ යෝජනාක්‍රමය රජය වෙනුවෙන් මහ බැංකුව විසින් තවදුරටත් පවත්වාගෙන යන ලදී.

## අපනයන කරුවන් සම්බන්ධයෙන් වූ ආනයන තීරුබදු ප්‍රතිදාන

අපනයන කරුවන් සම්බන්ධයෙන් වූ ආනයන තීරුබදු ප්‍රතිදාන සඳහා වාණිජ බැංකු මගින් ඉදිරිපත් කරන ලද හිමිකම් ප්‍රතිපූරණය කිරීම රජය වෙනුවෙන් මහ බැංකුව මගින් තවදුරටත් කරගෙන යන ලදී. ඒ යටතේ 1991 වසර තුල රුපියල් දශ ලක්ෂ 556.5 ක් ප්‍රතිපූරණය කරන ලදී.

## අනිවාර්ය ඉතිරිකිරීම් අරමුදල

1971 අංක 6 දරන අනිවාර්ය ඉතිරිකිරීම් පණතේ සහ 1972 අංක 15 දරණ ආදායම් උපරිම සහ අනිවාර්ය ඉතිරිකිරීම් පණතේ වගන්ති අනුව එකතු කරන ලද මුදල්වල භාරකරු වශයෙන් රජය වෙනුවෙන් මහ බැංකුව තවදුරටත් කටයුතු කරන ලදී. අදාල වර්ෂය තුල අයදුම්පත් 16 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 0.1 ක් (පොලියද ඇතුළුව) දායකයන් වෙත ගෙවන ලදී.

## රජයේ ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුව විසින් රජයේ දෙපාර්තමේන්තු, රජයේ නියෝජිත ආයතන හා ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් පවත්වාගෙන යැම තවදුරටත් කරගෙන යන ලදී. 1991 වසර අග වන විට ක්‍රියාත්මක ගිණුම් සංඛ්‍යාව 187 ක් විය.

# ව්‍යවහාර මුදල් නිකුතුව

පසුගිය වර්ෂවලදී මෙන් 1991 වර්ෂයේදීත් දේශීය ගණුදෙනු සඳහා ව්‍යාවහාර මුදල් නිකුත් කිරීමේ කාර්යභාරය මහ බැංකුව විසින් ඉටු කරනු ලැබිණි. මුදල් කළමනාකාරිත්වයේ සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධව වෙනස්කම් කීපයක් මෙම වර්ෂය තුල සිදු කෙරිණි.

රට තුල ව්‍යවහාරයේ පවත්නා මුදල් නෝට්ටුවල ගුණාත්මක තත්ත්වය උසස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, වාණිජ බැංකුවලද ආධාරය ඇතිව පවිත්‍ර මුදල් නොට්ටු ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවන ලදී. පසුගිය වර්ෂ තුල සංසරණයේ පැවති මුදල් නෝට්ටු පිළිගත් ප්‍රමිති තත්ත්වයන්ට වඩා පහත් මට්ටමක පැවැති බව මහ බැංකුවට හැඟී ගියෙන් මුදල් නෝට්ටු තේරීමේ ප්‍රමිතීන් උසස් කොට එමගින් මහජනයාට වඩාත් හොඳ මුදල් නෝට්ටු, නිකුත් කිරීම මෙහි පරමාර්ථය විය. ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකුවලද සහයෝගය ඇතිව, තම ප්‍රධාන කාර්යාලය හා මාතර හා අනුරාධපුර පිහිටි තම ප්‍රාදේශීය කාර්යාලද මගින් අළුත් ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීමේ ජංගම සේවා දෙකක් අරඹනු ලැබිණ. මේ සමගම ඒ ඒ දිස්ත්‍රික්කවල මහජනතාවට පිරිසිදු මුදල් නෝට්ටු භාවිතා කිරීමේ අවශ්‍යතාවයන් පිළිබඳව දැනුවත් කිරීමේ ව්‍යාපාරයක්ද දියත් කරනු ලැබිණි.

1991 වර්ෂයේදී රට තුළ ව්‍යවහාරයේ පවත්නා මුදල් නෝට්ටුවල මෝස්තරය වෙනස් කිරීමට මහ බැංකුව විසින් පියවර ගනු ලැබිණ. ශ්‍රී ලංකාවේ අගනා පෞරාණික හා ඓතිහාසික උරුමයන් විදහා දක්වන තේමාවන් වලින් නව මුදල් නෝට්ටුවල මෝස්තරය සැකසිණි. අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන පරිදිත්, මහජන පහසුව සඳහාත්, නෝට්ටුවේ කල් පැවැත්ම සහතික කිරීම සඳහාත්, නව නෝට්ටු දැනට ව්‍යවහාරයේ පවත්නා ඒ ඒ වටිනාකමින් යුත් නෝට්ටුවලට වඩා ප්‍රමාණයෙන් මඳක් කුඩාවට මුද්‍රණය කරන ලදී. රු. 1000/-, රු 500/-, හා රු. 100/- වටිනාකමින් යුත් නව මෝස්තරයන් සහිත මුදල් නෝට්ටු 1991 වර්ෂයේදී සංසරණය සඳහා නිකුත් කරන ලදී. රු. 50/-, රු.20 හා රු. 10/- වටිනාකමින් යුත් මුදල් නෝට්ටු 1992 වර්ෂය මුල් භාගයේදී නිකුත් කිරීමට නියමිතව තිබුණි.

1991 වර්ෂය තුල සමරු කාසි තුනක් මහ බැංකුව විසින් නිකුත් කරන ලදී 1991 වර්ෂයේ දෙසැම්බර් මස කොළඹ පැවති දකුණු ආසියාතු සම්මේලන ක්‍රීඩා තරග සැමරීම සඳහා කාසි දෙකක්ද, ගරු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ ජනාධිපති පදවි ප්‍රාප්තවීමේ තුන්වන වසර සැමරීම සඳහා කාසියක්ද නිකුත් කෙරුණි. දකුණු ආසියාතු සම්මේලන ක්‍රීඩා තරගය වෙනුවෙන් රු. 500/- ක වටිනාකමින් යුත් කැරට් 12 රත් ලෝහයෙන් නිම කරන ලද කාසියක්ද රු. 100/- වටිනාකමින් යුත් රිදී ලෝහයෙන් නිම කරන ලද කාසියක්ද ටංකනය කරන ලදී. රු. 500/- වටිනා කාසිය රවුම් හැඩයෙන් යුක්ත වූ අතර පැරණි ලංකාවේ ව්‍යවහාර වූ "කළඳ" නොහොත් "අක" නමැති කාසියට සමානවද, කවාකාර මුළු සහිත හතරැස් හැඩයකින් යුත් රු 100/- වටිනාකමින් යුත් කාසිය ක්‍රි. පූ. 5 වන සියවසේදී ව්‍යවහාර වූ "මසුරන්" නොහොත් "පුරාණ" යන කාසියට සමානවද ටංකනය කරන ලදී.

ගරු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා පදවිප්‍රාප්ත වී තෙවසරක් සම්පූර්ණවීම සැමරීම සඳහා රු 1/- වටිනාකමින් යුත් රිදී කාසියක්ද ටංකනය කරන ලදී. මෙම කාසියේ පසුපස ගරු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ පිළිරුවක්ද, කාසියේ මුහුණත ජනාධිපති කොඩිය ද පිළිබිඹු වේ. මෙම මෝස්තරය සහිතව "නිකල් හා තඹ" ලෝහයෙන් නිමවන ලද එම වටිනාකමින් යුත් කාසියක් මහජන ව්‍යවහාරය සඳහා නිකුත් කිරීමට මහ බැංකුව කටයුතු කරන ලදී. මෙම කාසි 1992 වර්ෂයේ ජනවාරි මාසයේදී නිකුත් කිරීමට නියමිතව තිබුණි.

ව්‍යවහාර මුදල් නිකුතු පරිමාවේ පුළුල්වීමත් සමග මහජනයා වෙත වඩාත් කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා මුදල් නෝට්ටු නිකුත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය විය. මෙම ක්‍රියාවලියට අයත් පහත සඳහන් විශේෂිත කාර්යයන් මෙතෙක් මහ බැංකුව විසින් ඉටු කරනු ලැබුයේ මුළුමනින්ම මිනිස් ශ්‍රමය උපයෝගී කර ගනිමිනි.

1. වාණිජ බැංකු හා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු විසින් මහ බැංකුව වෙත තැන්පත් කරන ලද මුදල් නෝට්ටු ගණන් කිරීම.
2. ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීම සඳහා මෙම නෝට්ටු තේරීම.
3. සේවා නිසි හා සේවා අනිසි වශයෙන් මුදල් නෝට්ටු තේරීම හා එමගින් සේවා නිසි නෝට්ටු නැවත මහජන ව්‍යවහාරයට නිකුත් කිරීම.
4. නැවත නිකුත් කිරීම සඳහා සේවා නිසි මුදල් නෝට්ටු මිටි බැඳීම.
5. ආරක්ෂාකාරී කොන්දේසිවලට අනුකූලව සේවා අනිසි නෝට්ටු විනාශ කිරීම.

මෙම ක්‍රියාවලින් මිනිස් ශ්‍රමයෙන් ඉටුකිරීමට යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් බැංකුව තුල නෝට්ටු තැන්පතු එක්රැස් වෙත බවත්, නෝට්ටු පිළිබඳ මෙම ක්‍රියාවලිය සඳහා වියදම අධික ලෙස වැඩිවන බවත් මහ බැංකුවට අවබෝධ විය. ප්‍රමාණවත් පරිදි පිරිසිදු හා සේවා නිසි මුදල් නෝට්ටු ආර්ථිකයට නිකුත් කිරීම පිළිබඳ මහ බැංකුවේ මූලික වගකීම නිසි ලෙස ඉටු කිරීමට මෙය බාධාවක් විය. මෙම තත්ත්වයන් සැලකිල්ලට ගෙන මුදල් නෝට්ටු තේරීමේ කාර්යය ස්වයංක්‍රියකරණය කිරීමට හා එමගින් වඩාත් හොඳ සේවාවක් මහජනතාවට සැලසීමේ හැකියාව ලබාගැනීමට මහ බැංකුව විසින් තීරණය කරන ලදී. මේ සඳහා (සී. වී. සී. එස්.) නමින් හඳුන්වන මුදල් නෝට්ටු තේරීමේ හා ගණන් කිරීමේ ස්වයංක්‍රීය යන්ත්‍ර පද්ධති දෙකක් මහ බැංකුව තුල ස්ථාපනය කිරීමට කටයුතු යෙදින. ඉහත සඳහන් නෝට්ටු තේරීමේ සියළුම ක්‍රියාවලින් වැඩි වේගයකින්, ස්වයංක්‍රියව කිරීමට මෙම පද්ධති සමත්වන අතර ඒ සඳහා අවශ්‍ය වන්නේ යන්ත්‍ර ක්‍රියාකරවන්නන් ස්වල්ප දෙනෙක් පමණි. මෙම යන්ත්‍ර 1992 වර්ෂය මුලදී ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව විධි විධාන යොදා තිබුණි.

# බැංකු සංවර්ධනය

## ආයතනික පද්ධතිය

1991 වර්ෂය තුළ මෙරට බැංකු ආයතන පද්ධතියෙහි සැලකිය යුතු ප්‍රසාරණයක් දක්නට ලැබුණි. 1991 වර්ෂය තුළ ග්‍රාමීය බැංකු කටයුතු ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව කරගෙන යනු ලැබිණ. මේ අනුව රට තුළ ක්‍රියාත්මක වන මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 15 දක්වා ඉහළ නංවමින් වර්ෂය තුළ නව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු තුනක් ස්ථාපනය කරනු ලැබිණ. 1991 සැප්තැම්බර් මාසයේදී ඇල්ජිමන් නෙදර්ලන්ත (එන්.වී.) බැංකුව සහ ඇම්ස්ටර්ඩෑම් රොටර්ඩෑම් එන්.වී.(ඇම්රෝ බැංකුව) ඒකාබද්ධ කිරීමත් සමහ 1991 දී විදේශීය බැංකු සංඛ්‍යාව 17 දක්වා අඩු වූ අතර මුළු දේශීය වානිජ බැංකු සංඛ්‍යාව 6 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. ඒ අනුව 1991 දී, රට තුල ක්‍රියාකාරී වූ මුළු වානිජ බැංකු සංඛ්‍යාව 23 දක්වා අඩු විය. අන්තර් ජාතික බැංකු කටයුතු පීඩාවට පත් කරමින් ක්‍රෙඩිට් සහ කොමර්ෂ් ඉන්ටනැෂනල් බැංකු සමාගම (බී.සී.සී.අයි.) බිඳ වැටීමත් සමහම ලොව පුරා අත්දුටු බැංකු අර්බුදය සම්බන්ධව ශ්‍රී ලංකාව ක්‍රියාකල ආකාරය වර්ෂය තුළ කැපී පෙනෙන වැදගත් සිදුවීමක් විය. ශ්‍රී ලංකා මහ බැංකුව ක්ෂණික පියවරක් ගනිමින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ බී.සී.සී.අයි. බැංකු ශාඛාවල පාලනය පවරා ගෙන, පසුව බී.සී.සී.අයි. වල දේශීය බැංකු කටයුතු සෙලාන් බැංකු සමාගම යටතට පත් කරන ලදී.

වර්ෂය තුළ බැංකු ශාඛා පද්ධතියෙහි සැලකිය යුතු ව්‍යාප්තවීමක් දක්නට ලැබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය අග වනවිට මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා ගණන 101 සිට 124 දක්වා වැඩි විය. මුළු වානිජ බැංකු ශාඛා ගණන 763 දක්වා වැඩි කරමින් දේශීය බැංකු ශාඛා 738 දක්වා වැඩි වූ අතර, විදේශීය බැංකු ශාඛා 25 දක්වා වැඩි විය. කෙසේ වුවද, වර්ෂය තුළ රාජ්‍ය බැංකු දෙකේ ශාඛා ව්‍යාප්තියේ අඩුවීමක් වාර්තා කරනු ලැබිණ. වසර අග වනවිට නව ශාඛා කාර්යාල දෙකක් විවෘත කරමින් මහජන බැංකුවේ මුළු ශාඛා ගණන 308 දක්වා වැඩි කළ අතර, ව්‍යාප්ති කාර්යාල සහ ගෙවීම් කාර්යාල ඇතුළත්ව ලංකා බැංකුවේ ශාඛා පද්ධතිය 323 සිට 328 දක්වා වැඩිවිය. මේ අතර, පෞද්ගලික දේශීය බැංකු ඔවුනගේ ව්‍යාපාර කටයුතු පිට පළාත්හි පුළුල් කිරීම අඛණ්ඩව කරගෙන යනු ලැබිණ. එහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය පෞද්ගලික බැංකු ශාඛා ගණන 102 දක්වා වැඩිකරමින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, සීමාසහිත ලංකා වානිජ බැංකුව සහ සෙලාන් බැංකු සමාගම පිළිවෙළින් නව ශාඛා 3,2 හා 9 ක් බැගින් විවෘත කරන ලදී. ජාතික ඉතිරි කිරීමේ බැංකුව එහි ශාඛා පද්ධතිය 81 දක්වා වැඩි කරන ලදී. 1991 වර්ෂය තුළ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව එහි දෙවැනි ශාඛාව විවෘත කරන ලදී. ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව වර්ෂය තුළ එහි නියෝජිත කාර්යාලය ශාඛාවක තත්ත්වයට වැඩිදියුණු කරන ලදී.

**ජංගම බැංකු කටයුතු සේවා**

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු, තම කටයුතුවලට අදාළ බල ප්‍රදේශයේ බැංකු කටයුතු අඩු හා බැංකු කටයුතු නැති ප්‍රදේශවලට බැංකු කටයුතු පහසුකම් සැපයීම අරමුණු කොටගෙන තම ජංගම බැංකු සේවා නොකඩවා කරගෙන යනු ලැබිණි. සෙලාන් බැංකුවද කළුතර දිස්ත්‍රික්කයේ අළුබෝමුල්ල සහ සරික්කාමුල්ල, ගම්පහ දිස්ත්‍රික්කයේ යක්කල, සහ කොළඹ දිස්ත්‍රික්කයේ අත්තිඩිය, බොරලැස්ගමුව, කළුබෝවිල සහ කොට්ටාව යන ප්‍රදේශවල ජංගම බැංකු සේවා පවත්වාගෙන යනු ලැබිණ.

**ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සවිකිරීම**

රට තුළ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ක්‍රියා කරන බැංකු ගණන 7 දක්වා වැඩි කරමින් 1991 දී මහජන බැංකුව, ලංකා බැංකුව සහ සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හඳුන්වා දෙන ලදී. මහජන බැංකුව "පෙට්" (PET) නමින් තම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, ශාඛා පහක සවිකරන ලද අතර, ලංකා බැංකුව "සී බැන්ක් කැෂ් පොයින්ට්ස්" (CEY BANK CASH POINTS) නමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සවි කරන ලදී. තවද ලංකා බැංකුව මගින් කොළඹ 13, සීමාසහිත ශ්‍රී ලංකා ව්‍යාපාරික බැංකු ගොඩනැගිල්ලේ සහ කොළඹ 13, සීමාසහිත ලංකා දුම්කොළ සමාගමේ ද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර දෙකක් සවි කරන ලදී. සීමාසහිත හොංකොං සහ ෂැංහයි බැංකු සංස්ථාවද, කොළඹ 3 ලිබර්ටි ප්ලාසා ගොඩනැගිල්ලේද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර දෙකක් සවි කරන ලදී.

**සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය**

ඉතා දුගී ගැමි පවුල් 32870 කට ණය පහසුකම් සැපයීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟාලීමේ අරමුණින්ද, සාමාන්‍යයෙන්, පුත්තලම, ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්කයන්හි ආර්ථික සංවර්ධනයට ආධාර පිණිස ද, 1990 වසරේදී සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන, ණය ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ව්‍යාපෘතියේ, ක්‍රියාකාරී ආයතනය වන අතර, ව්‍යාපෘතියට අරමුදල් සපයනු ලබන්නේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (ඉෆාඩ්) හා කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන සංගමයයි (සීඩා). ව්‍යාපෘතිය සඳහා මුළු අරමුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 754 ක් (ඇ.එ.ජ.ඩොලර් දශ ලක්ෂ 17.859) වන අතර ඉන් සියයට 23 ක් සඳහා ශ්‍රී ලංකා රජය දායක වන අතර, සියයට 3 ක් ප්‍රතිලාභී ඉතුරුම් දායකත්වයක් ද වේ.

ග්‍රාමීය, ඉතා දිළිඳු ජනතාවට ඔවුන්ගේ කෙටිකාලීන හා දිගුකාලීන ණය අවශ්‍යතා සපුරාලීමට කාර්යක්ෂම ආයතනික ණය සම්පාදන වැඩ පිළිවෙලක් සකස් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ශික්ෂණ ක්‍රියාවලියන් පවත්වාගෙන යෑම මගින් සුරැකුම් රහිත ණය සැපයීමත්, කාන්තා සහභාගිත්වය අපේක්ෂිත ඉලක්කයන්ගෙන් සියයට 40 කට නොවැඩි ප්‍රමාණයකට දිරිමත් කිරීමත්, මෙම ව්‍යාපෘතියේ අනෙකුත් අරමුණු වේ. ප්‍රාදේශීය මට්ටමින් නැවත ආයෝජනය කිරීම පිණිස ග්‍රාමීය ඉතුරුම් විශාල වශයෙන් රැස් කිරීම මෙම ව්‍යාපෘතියේ තවත් පුළුල් පරමාර්ථයක් වේ.

මෙම ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපනය කරන ලද මධ්‍යම ව්‍යාපෘති කාර්යාලය මගින් පාලනය කරනු ලැබේ. මෙම ප්‍රධාන කාර්යාලය, අදාල දිස්ත්‍රික්ක 4ක ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ආසන්නව පිහිටුවා ඇති දිස්ත්‍රික්ක කාර්යාල හා අනුයුක්ත කර ඇත. දිස්ත්‍රික් ව්‍යාපෘති කාර්යාලයන් සහ ණය යෝජනා ක්‍රම, නුවර හා පුත්තලම් දිස්ත්‍රික්කයේ 1990 මැයි මසද, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කයන්හි දෙසැම්බර් මාසයේදී ද ආරම්භ කරනු ලැබිණි.

පුත්තලම සහ මහනුවර දිස්ත්‍රික්කවල ඇස්තමේන්තු කරන ලද ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව දළ වශයෙන් 18770 ක් වන අතර ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල 14100 කි. විමසුමට ලක්වන වසර තුලදී නුවර සහ පුත්තලම් දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති ප්‍රතිලාභීන්ට ප්‍රදානය කරන ලද ණය මුදල් සංඛ්‍යාවද, ප්‍රමාණයද, සැළකියයුතු ප්‍රමාණයකින් වැඩි විය. එමෙන්ම ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් රැස්කිරීම්, 1990 වසරේ දෙසැම්බර් මස රුපියල් දශ ලක්ෂ 0.524 සිට 1991 වසර අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 2.7 දක්වා වැඩි විය. පුත්තලම හා මහනුවර දිස්ත්‍රික්කවල ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණය 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 3.9 ක් වූ අතර, 1991 වර්ෂය අවසාන වන විට එය රුපියල් දශ ලක්ෂ 20.2 දක්වා වැඩි වූ අතර 1991 වසර අවසානයේ ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 24.1 ක් විය. ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කයන්හි ණය ලබාදීමේ වැඩපිළිවෙලෙහි ප්‍රගතිය සතුටුදායක වූ අතර 1991 වසරේදී ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 6.9 ක් විය.

ණය ආපසු අයකර ගැනීමේ ප්‍රතිශතය මේ දක්වා සතුටුදායක මට්ටමක පවතින අතර, ඉෆාඩ් හා සීඩා ව්‍යාපෘති පවත්නා දිස්ත්‍රික්කයන්හි මෙම අනුපාතය සාමාන්‍යයෙන් සියයට 91 ක් සහ 99 ක් වේ. දිස්ත්‍රික් හතරේම ප්‍රතිලාභීන් 5372 ක් සඳහා 1991 වසර අවසානයේදී කෙටිකාලීන හා දිගුකාලීන ණය වශයෙන් රුපියල් දශ ලක්ෂ 31.0 ක් ප්‍රදානය කළ අතර එක් ප්‍රතිලාභියකුට සපයන ලද ණය මුදලේ සාමාන්‍යය රු.5,800/-ක් පමණ විය. ඉතිරි කිරීම් එක්රැස්කිරීමේ වැඩකටයුතු ද බෙහෙවින් වැඩිදියුණු වූ අතර 1991 වසර අවසානය වන විට කණ්ඩායම් ඉතුරුම් අරමුදල රුපියල් දශ ලක්ෂ 3.4 දක්වා වැඩි විය.

ප්‍රතිලාභීන් ඒකරාශි කිරීම, සමාජ, ආර්ථික සමීක්ෂණයන් පැවැත්වීම, කණ්ඩායම් සංවිධානය කිරීම, ග්‍රාමීය ඉතුරුම් රාශිකරණය, ප්‍රතිලාභ නිපුණතා වර්ධනය සඳහා පුහුණු පාඨමාලා සංවිධානය කිරීම, ණය ප්‍රදානය හෝ නිර්දේශ කිරීම හා අයකර ගැනීමේදී අවශ්‍ය උපකාරක සේවා සංවිධානය කිරීම ආදී කටයුතුවල නිරතවීමෙන් සහභාගී ආයතන විසින් ඉතා

වැදගත් කාර්‍යභාරයක් ඉටු කරනු ලැබිණ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිදී, පුහුණු කිරීම සඳහා වැදගත් ස්ථානයක් හිමිවූ අතර, නිලධාරීන් හා ප්‍රතිලාභීන් පුහුණු කිරීම උදෙසා රුපියල් දශ ලක්ෂ 35.7 ක මුදලක් ව්‍යාපෘතියෙන් වෙන කර තිබේ. ප්‍රතිලාභීන්ට ණය සපයන කණ්ඩායම් ණය ප්‍රදාන ක්‍රමය ශ්‍රී ලංකාවේ බැංකු විසින් මින් ඉහත ක්‍රියාත්මක කර නොමැති බැවින් බැංකු නිලධාරී හා ප්‍රතිලාභී පුහුණු පාඨමාලාවන් ව්‍යාපෘතියේ සාර්ථකත්වයට බෙහෙවින් වැදගත් වේ. සහභාගී ආයතන, ව්‍යවසායක හා කළමනාකරණ නිපුණතා දියුණු කිරීමටත්, නව තාක්ෂණය ගැමි ජනතාව වෙත රැගෙන යාමටත් ඒ තුළින් ග්‍රාමීය නිෂ්පාදනය හා නිෂ්පාදන හැකියාවන් දියුණු කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබිණි.

රාජ්‍ය නොවන ආයතන වන දිස්ත්‍රික් සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිති, ලංකා මහිලා සමිතිය, ධර්ම විජය පදනමද, විදේශීය ආයතන වන ඇදිහැස හා යුනිසෙප් වැනි ආයතනවල දායකත්වය මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහි ලා උපකාරී වේ. ප්‍රතිලාභීන්ට ණය ලබා දීමේදී සහභාගී ණය දෙන ආයතන වශයෙන් දිස්ත්‍රික් 4 ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වෙත ප්‍රධාන කාර්‍යභාරයක් පැවරුණි.

## බැංකු අධීක්ෂණ

1991 වර්ෂයේ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු 10 ක් සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 3 ක් පරීක්ෂාවට භාජනය කළ අතර, වර්ෂය තුළදී මින් 7 ක පරීක්ෂණ කටයුතු තිම කරන ලදී. මීට අමතරව, 1990 වර්ෂයේදී පරීක්ෂණ ආරම්භ කළ වාණිජ බැංකු 5 ක කටයුතු ද තිම කෙරිණි. විවරණයට භාජනය කරනු ලබන වර්ෂය තුළදී මෙම දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම වරට වණික් බැංකු දෙකක කටයුතු අධීක්ෂණය කිරීම මගින් පරීක්ෂණ කටයුතු පුළුල් කෙරිණි.

වාණිජ බැංකු සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් ඉදිරිපත් කරන ලද මාසික වත්කම් හා බැරකම් ප්‍රකාශනයන් පදනම් කර ගෙන ඒවායේ මූල්‍ය තත්ත්වයන් පරීක්ෂා කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කරගෙන යන ලදී. වාණිජ බැංකු විසින් විදේශීය ව්‍යවහාර මුදල් බැංක ක්‍රමය යටතේ පිහිටුවන ලද විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන් හි ගණුදෙනුද, එම බැංකු ඒකක වලින් ලබා ගත් මාසික වාර්තා පදනම් කර ගෙන අධීක්ෂණය කෙරුණු අතර, විදේශීය ව්‍යවහාර මුදල් ඒකක ඇතුළුව වාණිජ බැංකුවල ලාභදායිත්වය වාර්ෂික වාර්තා පදනම් කර ගෙන විග්‍රහ කෙරිණි.

අධීක්ෂණ කටයුතු වල එක් අංගයක් වශයෙන්, 1989 ජූනි මාසයේදී ප්‍රමුඛ නොවන අංශවලට ණය දීමේදී වාණිජ බැංකු වෙත පනවන ලද ණය සීමා සහ අත්‍යාවශ්‍ය නොවන විශේෂිත ආනයනයන් සඳහා වූ ණයවර ලිපි මත අය කළ යුතු මුදල් ආන්තික අවශ්‍යතා සම්බන්ධයෙන් වාණිජ බැංකු දැක්විය යුතු වූ අනුකූලතාවයන් ඉටු කර තිබේද යන්න මෙම දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කෙරිණි. බැංකු පනත යටතේ නිකුත් කරන ලද නියෝග හා උපදෙස් මාලාවන් වාණිජ බැංකු විසින් විධිමත්ව ක්‍රියාත්මක කරන බවට වග බලා ගැනීම ද මෙම දෙපාර්තමේන්තුවෙහි වගකීම විය. මෙම නියෝගවලට, වාණිජ බැංකු විසින් අවම ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා අනුපාත පවත්වා ගැනීම, එක් ණය කරුවෙකුට දිය හැකි ණය සීමාවන්, අධ්‍යක්ෂවරුන් සහ අධ්‍යක්ෂවරුන් ගේ අවශ්‍යතා මත දිය හැකි ණය සීමාවන් සහ කොටස් දැරීම පිළිබඳ සීමාවන් පැනවීම යනාදිය ඇතුළත් විය. මෙකී නියෝග හා විධිවිධාන කඩ කිරීම පිළිබඳව, වරද කරුවන්ට විරුද්ධව අදාළ ක්‍රියාමාර්ග ගැනීම දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණි.

බැංකු පනතේ විධිවිධාන යටතේ කාලීනව සපයන ලද ද්‍රවශීලතා පිළිබඳ වාර්තා සහ වෙනත් වාර්තා පරීක්ෂා කිරීම මගින් 1991 වර්ෂය තුළ දී වාණිජ බැංකු පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණ කටයුතු තවදුරටත් ශක්තිමත් කෙරිණි. බැංකු පනතෙහි 5 වන කොටස ක්‍රියාත්මක කිරීමත් සමග 1990 සැප්තැම්බර් මාසයේදී හඳුන්වා දෙන ලද "බැංකු සඳහා වූ ගිණුම් ආකෘති" වලට අනුව, සියළුම වාණිජ බැංකු විසින් 1990 වර්ෂය සඳහා වූ ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම, 1991 වර්ෂයේදී ආරම්භ විය.

ආදායම් තත්ත්වය හඳුනා ගැනීම හා නොගෙවූ ණය සඳහා ප්‍රතිපාදන කිරීම සම්බන්ධයෙන් පොදු ප්‍රමිතියක් ඇති කිරීමේ අරමුණෙන් 1991 පෙබරවාරි මාසයේදී දෙපාර්තමේන්තුව විසින් උපදෙස් මාලාවක් නිකුත් කරන ලදී. අවිනිශ්චිත පොලී ප්‍රමාණයන් වෙන් කිරීමේ දී ත්, අකර්මණ්‍ය අත්තිකාරම් වර්ගීකරණය කිරීමේදීත්, බොල් සහ අඩමාන ණය ප්‍රතිපාදනය කිරීමේදීත්, වාණිජ බැංකු විසින් අනුගමනය කළ යුතු අවම අවශ්‍යතාවයන් මෙම උපදෙස් මාලාව මගින් ස්ථාපිත කෙරිණි. සියලුම වාණිජ බැංකු විසින්, 1991 අප්‍රේල් මස 01 වන දින වන විට අදාළ අවිනිශ්චිත පොලී ගිණුම පවත්වා ගත යුතු වූ අතර, 1992 අප්‍රේල් 01 වන දින වන විට අතිකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ යුතු විය.

1987 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබූ තැන්පතු රක්‍ෂණ ක්‍රමය 1991 වර්ෂය තුළ දී ද දෙපාර්තමේන්තුව විසින් නොකඩවා පරිපාලනය කරන ලදී. තම අභිමතය පරිදි ඇතුළත් විය හැකි, මෙම රක්‍ෂණ ක්‍රමයෙන් ආවරණය වීමේ අවස්ථාව, වාණිජ බැංකු, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ සමූපකාර ග්‍රාමීය බැංකු වලට ද සලසන ලද අතර, ඒ යටතේ වාණිජ බැංකු 2 ක් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 3 ක් සහ සමූපකාර ග්‍රාමීය බැංකු 8 ක් ද ඇතුලුව ආයතන 13 ක් 1991 වර්ෂය අවසාන වන විට ලියාපදිංචි වී තිබිණි. 1991 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි තැන්පතු රක්‍ෂණ ක්‍රමය යටතේ ගෙවිය යුතු වාරිකය එක් කාර්තුවකට, රු. 100 ක් සඳහා ශත 3.75 ක් වශයෙන් (එනම් - වර්ෂයකට සෑම රු. 100 කටම ශත 15 ක් වන පරිදි සංශෝධනය කෙරිණි.

සමාලෝචනයට භාජනය වූ වසරේ දෙවන භාගය තුළ දී ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් (ඕවර්සීස්) බැංකුවෙහි කටයුතු පිළිබඳ ප්‍රශ්න ගණනාවක් සම්බන්ධව කෙළින්ම මැදිහත් වීමට මෙම දෙපාර්තමේන්තුවට සිදු විය. ජාත්‍යන්තරව, ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් බැංකුවේ ගණුදෙනු අත්හිටු වීම අනුගමනය කරමින්, මූල්‍ය නීති පනතේ අංක 30 (1) දරණ වගන්තිය ප්‍රකාර මුදල් මණ්ඩලය විසින් එකී බැංකුවෙහි ශ්‍රී ලංකාවේ පිහිටි ශාඛාවන් හි ක්‍රියාකාරිත්වය 1991 ජූලි මස 07 වැනි දින සිට බලපැවැත්වෙන සේ අත්හිටුවන ලදී. සීමාසහිත සෙලාන් බැංකුව සමග ගිවිස ගත් කළමනාකාර ගිවිසුමක් යටතේ මුදල් මණ්ඩලය විසින් ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් බැංකුවෙහි ශාඛාවන් හි පරිපාලනය සීමාසහිත සෙලාන් බැංකුවට පවරන ලද අතර, 1991 ජූලි මස 29 වන දින සිට එහි කටයුතු නැවත ආරම්භ කෙරිණි. 1991 අංක 2 දරණ හදිසි නීති (බැංකු විශේෂ විධිවිධාන) රෙගුලාසි යටතේ ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් බැංකුවේ දේශීය බැංකු කටයුතු, 1992 ජනවාරි මස 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි සෙලාන් බැංකුව වෙත පැවරීමට 1991 දෙසැම්බර් මාසයේදී මුදල් මණ්ඩලය විසින් අනුමැතිය දෙන ලදී. ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් බැංකුවෙහි අනේවාසික හා නිර්නේවාසික ගිණුම් හිමියන් ට සහනයක් සැළසීමේ අරමුණින් එම ගිණුම් හිමියන් ට මුදල් ගෙවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහන ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිණ. මෙම සහන ක්‍රමය යටතේ, මුළු තැන්පතු හිමියන් ගෙන් සියයට 85 ක ට පමණ ඔවුන්ගේ සම්පූර්ණ තැන්පතු මුදලම රුපියල් වලින් ලබා ගැනීමට හැකි වනු ඇත.

## බැංකු නොවන මූල්‍ය ආයතන

1991 වර්ෂය තුළ මුදල් ව්‍යාපාරවල නිරතවීම සඳහා 1988 අංක 78 දරණ මුදල් සමාගම් පනත යටතේ සමාගම් 24 ක් ලියාපදිංචි කොට බලපත් නිකුත් කරන ලදී. එයින් සමාගම් 20 ක් 1990 දෙසැම්බර් මාසයේදී ද, සමාගම් 4 ක් 1991 මුල් මාස කිහිපය තුල ද ලියාපදිංචි කරන ලදී. 1991 වර්ෂය අවසාන වන විට මෙම සමාගම්වල මුළු තැන්පතු වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,647.9 ක් වූ අතර, මෙය 1990.12.31 වන විට තිබූ තැන්පතු වගකීම් ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 29.7 නොහොත් සියයට 0.5 ක වැඩිවීමකි. 1990 දෙසැම්බර් 17 දින මුදල් මණ්ඩලය නිකුත් කළ විධානය අනුව ලියාපදිංචි නොවූ මූල්‍ය සමාගම් සමූහයක් ඔවුන්ගේ මූල්‍ය ව්‍යාපාර අවසතු කිරීමත්, ඔවුන්ගේ තැන්පතු බේරුම් කිරීමත් යන කරුණු ද සැළකිල්ලට ගෙන මෙම වැඩිවීම සමාලෝචනය කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව සතු මුදල් සමාගම් අධීක්‍ෂණය හා පාලනය පිළිබඳ බලය ශක්තිමත් කරනු පිණිස 1991 අංක 23 දරණ මුදල් සමාගම් සංශෝධන පනත මගින් 1988 අංක 78 දරණ මුදල් සමාගම් පනතේ අංක 5, 9, 12, 25, 33, 38 සහ 46 දරණ වගන්ති සංශෝධනය කරන ලදී. ඉහත 12, 25 සහ 46 වගන්ති සඳහා වූ සංශෝධන, මහජන ආරක්ෂක පනතේ (40 වැනි පරිච්ඡේදය) 5 වැනි වගන්තිය යටතේ පිළිවෙලින් 1990 අංක 1, 1990 අංක 2 සහ 1991 අංක 1 දරණ හදිසි ව්‍යවස්ථා යනුවෙන් ජනාධිපති තුමා විසින් මුලින් ප්‍රසිද්ධ කරන ලදී. 1992 වසර

සඳහා මුදල් සමාගම් ලියාපදිංචි කිරීමට පෙරාතුව බලපත්‍ර සඳහා අයදුම්කර තිබූ මුදල් සමාගම් පිළිබඳව සම්පූර්ණ ස්ථානගත පරීක්ෂණ පවත්වන ලදී. ද්‍රවශීලතා ප්‍රශ්න ඇතැයි සඳහන් කරනු ලැබූ ලියා පදිංචි වූ මූල්‍ය සමාගම් 2 ක් ස්වාධීන විගණකවරුන් විසින් විමර්ශනාත්මක විගණන පරීක්ෂණවලට භාජනය කරන ලදී.

## සමාගම් ලියාපදිංචි කිරීම

1990 දෙසැම්බර් 18 වැනි දින වන විට ලියාපදිංචි කර නොමැති මුදල් සමාගම්වලට මුදල් ව්‍යාපාර අවසන් කරන ලෙසත්, 1990 දෙසැම්බර් 17 වැනි දින මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1990 අංක 2 දරණ නියෝගය අනුව තැන්පත්කරුවන්ට ඔවුන්ගේ වගකීම් බේරුම් කරන ලෙසත් නියෝග කරන ලදී. මෙම නියෝගය අනුව මූල්‍ය ආයතන ඔවුන්ගේ තැන්පතු වගකීම් පහත දැක්වෙන ආකාරයට බේරුම් කළ යුතු විය.

i) 1990.12.19 වැනි දිනට රුපියල් දශ ලක්ෂ 40 කට වැඩි තැන්පතු වගකීමක් ඇති මුදල් ආයතන විසින් එකී තැන්පතුවලින් මසකට සියයට 5 කට නොඅඩු ප්‍රමාණයක් ආපසු ගෙවිය යුතුය.

ii) 1990.12.19 වැනි දිනට රුපියල් දශ ලක්ෂ 40 ට නොවැඩි තැන්පතු වගකීම් ප්‍රමාණයක් ඇති මූල්‍ය ආයතන විසින් එම තැන්පතු වගකීම්වලින් මසකට සියයට 8.5 කට නොඅඩු ප්‍රමාණයක් ආපසු ගෙවිය යුතුය.

## මහ බැංකුව විසින් මූල්‍ය සහන සැලසීම

මුදල් මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද තැන්පත්කරුවන්ට සහන සැලසීමේ යෝජනා ක්‍රමය යටතේ සහන සැලසීම, මුදල් මණ්ඩලය විසින් පාලනය හා කළමනාකරණය පවරා ගනු ලැබූ මුදල් සමාගම්වල තැන්පත්කරුවන් සඳහා නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ තැන්පත්කරුවන්ට ගෙවීමේ ප්‍රගතිය 2.6 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## 2.6 සංඛ්‍යා සටහන

### 1991.12.31 දක්වා තැන්පත්කරුවන්ට ගෙවන ලද සහන මුදල් පිළිබඳ ප්‍රගතිය

| සමාගමේ නම | මුළු තැන්පතු සංඛ්‍යාව | ගෙවන ලද තැන්පතු සංඛ්‍යාව | ගෙවන ලද තැන්පතු සංඛ්‍යාව මුළු තැන්පතුවල ප්‍රතිශතයක් ලෙස | ගෙවන ලද මුදල (රුපියල් දහස්) |
|---|---|---|---|---|
| සී/ස යුනියන් ට්‍රස්ට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් | 18,331 | 16,047 | 87.5 | 202,258 |
| සී/ස හිදෙකි පිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් | 4,487 | 4,190 | 93.4 | 44,896 |
| සී/ස හෝම් පිනෑන්ස් | 12,585 | 7,746 | 61.5 | 73,447 |
| සී/ස සාරභූමි ඉන්වෙස්ට්මන්ට් (පුද්ගලික) සමාගම | 401 | 368 | 91.8 | 3,796 |
| සී/ස කාසල් පිනෑන්ස් | 2,756 | 2,698 | 97.6 | 33,223 |
| සී/ස ද සෙවන පිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි | 541 | 260 | 48.1 | 2,039 |
| සී/ස ද යුනයිටඩ් මෝටර් පිනෑන්ස් කම්පැනි (ලංකා) සමාගම | 1,343 | 945 | 70.4 | 9,830 |
| සී/ස ද වුැවල් බෑග් ඉන්වෙස්ට්මන්ට් (පුද්ගලික) සමාගම | 146 | 41 | 28.1 | 481 |
| එකතුව | 40,590 | 32,295 | 79.6 | 369,970 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1991 වසර තුළදී ද්‍රවශීලතා ගැටළුවලට මුහුණ පා සිටි ලියාපදිංචි මූල්‍ය සමාගමකටද මහ බැංකුව විසින් මූල්‍ය පහසුකම් සලසන ලදී. 1991 දෙසැම්බර් 31 දින අවසානය වන විට 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනතේ 20 (4) සහ 21 වගන්ති යටතේ මුදල් සමාගම් 13 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 798 ක මුළු මුදලක් ගෙවා තිබුණි. එයින් රුපියල් දශ ලක් 214.9 ක්, 1991 වසර තුළදී ගෙවන ලදී.

### පවරා ගෙන ඇති මුදල් සමාගම්වල කටයුතු ගණන් බේරා වසා දැමීම

පාලනය සහ කළමනාකරණය මහ බැංකුව වෙත පවරා ගන්නා ලදුව, තැන්පත්කරුවන්ට සහන සැලසීමේ ක්‍රමය යටතේ මුදල් ගෙවා නිම කළ, එහෙත් නැවත පුනරුත්ථාපනය කළ නොහැකි අසාර්ථක මුදල් සමාගම් 3 ක කටයුතු ගණන් බේරා වසා දැමීමට 1991 වර්ෂය තුළදී මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. ඒ අනුව සී/ස හිදෙකි පිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්, සී/ස කාසල් පිනෑන්ස් සහ සී/ස සාරභූමි ඉන්වෙස්ට්මන්ට් (පුද්ගලික) සමාගම යන මුදල් සමාගම් 3 ක කටයුතු ඇවර කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවිය වෙත අයදුම්පත් ඉදිරිපත් කරන ලදී.

### විධාන සහ රීති

මුදල් සමාගම් සඳහා යාවත් කාලීන පාලන රටාවක් සකස් කරනු පිණිස 1988 අංක 78 දරණ මුදල් සමාගම් පනත යටතේ නව විධාන සහ රීති මාලාවක් නිකුත් කිරීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. පනතේ 9 වැනි වගන්තිය යටතේ විධාන 16 ක් නිකුත් කරන ලදී. විධාන අංක හා ඒවාට අදාල විෂයයන් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| විධානය | අංක | 1- | බොල් හා අඩමාන ණය ප්‍රතිපාදන |
| ,, | | 2- | ,, ,, ,, |
| ,, | | 3- | ලියා හරින ලද ණය හා අත්තිකාරම් |
| ,, | | 4- | වත්කම් පැවරීම |
| ,, | | 5- | ඥාතීන් සමග ව්‍යාපාර ගණුදෙනු කිරීම |
| ,, | | 6- | තැන්පතු |
| ,, | | 7- | ද්‍රවශීල වත්කම් |
| ,, | | 8- | ණය දීම |
| ,, | | 9- | ප්‍රාග්ධන අරමුදල් |
| ,, | | 10- | ලියා හරින ලද ණය ලේඛනය |
| ,, | | 11- | ස්ථාවර වත්කම් |
| ,, | | 12- | ආයෝජන |
| ,, | | 13- | පොලී |
| ,, | | 14- | ව්‍යාපාර කටයුතු වසා දැමීම |
| ,, | | 15- | උපචිත පොලිය |
| ,, | | 16- | ගිණුම් විගණනය |

මුදල් මණ්ඩලය විසින් 1991 සැප්තැම්බර් මස 11 දින, 1991 අංක 1 දරන ප්‍රචාරණ රීතිය, 1991 අංක 23 දරණ මුදල් සමාගම් පනතින් සංශෝධිත 1988 අංක 78 දරණ මුදල් සමාගම් පනතේ අංක 33 (2) (ඇ) වගන්තිය යටතේ පනවන ලදී. මෙය "මූල්‍ය සමාගම් (ප්‍රචාරණ) රීතිය" යනුවෙන් හැඳින්වනු අතර මෙමගින් මූල්‍ය සමාගම්වල ප්‍රචාරක දැන්වීම්වලට ඇතුළත් විය යුතු තොරතුරු විධිමත් කිරීම අපේක්ෂා කෙරුණි.

**උසාවි වෙත යොමු කර ඇති නඩු :**

1991 වසර තුළදී මුදල් මණ්ඩලය විසින් නිකුත් කළ විධාන කඩ කිරීම නිසා මූල්‍ය සමාගම් 6 ක අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නඩු 69 ක් අදාල මහේස්ත්‍රාත් උසාවිවල පවරනු ලැබ ඇත. අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග වල විස්තර 2.7 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2.7 සංඛ්‍යා සටහන**

**1991.12.31 වැනි දායිත් අවසන් වන වර්ෂය තුලදී 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනත යටතේ වැරදි සඳහා පවරන ලද නඩු**

| වරදෙහි ස්වභාවය | සමාගම් සංඛ්‍යාව | නඩු පවරනු ලැබූ අධ්‍යක්ෂ වරුන් සංඛ්‍යාව | නඩු සංඛ්‍යාව | වෙනත් කරුණු | |
|---|---|---|---|---|---|
| | | | | වරදරකරු බවට තීන්දු | මෙතෙක් තීන්දු දී නොමැති |
| 25 (2) ඒ වගන්තිය යටතේ අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගලික වත්කම් පිළිබඳ තොරතුරු සැපයීමට අපොහොසත් වීම. | 01 | 01 | 01 | - | 01 |
| විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම. | 01 | 05 | 05 | - | 05 |
| තැන්පතු වගකීම් ගෙවා නිම කිරීමට අපොහොසත් වීම. | 04 | 16 | 63* | - | 61 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: * විවිධ වැරදි සඳහා ඇතැම් අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව කිහිපවරක් නඩු පවරා ඇත.

තවද, 1990, 1991 වර්ෂ තුළදී මුදල් සමාගම් 6 ක අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව පවරා තිබූ නඩු 38 ක් 1991 වර්ෂය තුළදී අවසන් කරන ලදී. නඩු 13 ක විත්තිකරුවන් වැරදිකරුවන් වූ අතර, නඩු 25 ක් සමථයට පත් කරන ලදී.

සමාලෝචනයට භාජනය වූ කාලය තුළදී 1988 අංක 78 දරණ මුදල් සමාගම් පනතේ 18 වැනි වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි නොකළ මුදල් සමාගමක ව්‍යාපාර කටයුතු ඇවර කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. ඒ අනුව හවුස් ඇන්ඩ් ප්‍රොපටි ට්‍රේඩ් ලිමිටඩ් සමාගමේ ව්‍යාපාර කටයුතු ඇවර කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් 1991 ජුනි 18 වැනි දින කොළඹ දිස්ත්‍රික් උසාවිය වෙත අයදුම්පතක් ඉදිරිපත් කරන ලදී.

### අනෙකුත් කටයුතු

මහජනයාට මූල්‍ය සමාගම්වල ව්‍යාපාර කටයුතු පිළිබඳ අවබෝධයක් ලබාදීමේ අදහසින්, විශේෂයෙන්ම මුදල් සමාගම්වල මුදල් ආයෝජනය කිරීමේදී ඇති විය හැකි අවදානම් පිළිබඳව තැන්පත්කරුවන් සුපරීක්ෂාකාරී වීමේ අවශ්‍යතාවය පිළිබඳව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වසර තුළදී පුවත්පත්වල දැන්වීම් පළ කරන ලදී. එම දැන්වීම්වලට තැන්පත්කරුවන් සඳහා උපදෙස් මාලාවක් ද, ස්ථාවර තැන්පත් සහතිකයක ආකෘතියක් සහ එම සහතිකයට ඇතුළත් විය යුතු අවම තොරතුරු ද අඩංගු කරන ලදී.

තවද, 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනත යටතේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කළ විධාන හා රීති ඇතුළත් පොත් පිංචක් ද බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලදී.

## සංවර්ධන මුදල්

1991 වර්ෂය තුළදී ද මැදි හා දිගුකාලීන ණය අරමුදලෙහි පරිපාලන කටයුතු සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා වූ ණය ආවරණ සහතික ක්‍රමයත් මෙහෙය වීම තවදුරටත් සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව වෙත පැවරුනු වගකීම විය.

### මැදි හා දිගුකාලීන ණය අරමුදල

1991 වර්ෂය තුළදී මහ බැංකුව අනුගමනය කළ මූල්‍ය ස්ථායීකරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීමේදී වඩාත් වරණාත්මක හා සීමාකාරී වූ ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. ඒ අනුව මැදි හා දිගුකාලීන ණය අරමුදලේ කාණ්ඩ II, III සහ IV යටතේ 1990 දී අනුමත කළ රුපියල් දශ ලක්ෂ 908 ක් වූ ප්‍රතිමූල්‍ය ප්‍රමාණය 1991 දී රුපියල් දශ ලක්ෂ 237 ක් දක්වා වේගයෙන් පහත වැටුණි. එය සියයට 74 ක අඩුවීමකි. කාණ්ඩ III සහ IV යටතේ ප්‍රතිමූල්‍ය අනුමත කිරීමෙහි පහත වැටීමක් සිදු වුවද, කාණ්ඩ II යටතේ ප්‍රතිමූල්‍ය අනුමත කිරීම 1990 දී රුපියල් දශ ලක්ෂ 22.9 සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 72.6 දක්වා වැඩි විය. (2.8 සංඛ්‍යා සටහන)

1991 දෙසැම්බර් මාසයේදී මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම නැවත දැනුම් දෙනතුරු අත්හිටුවනු ලැබීය.

**2.8 සංඛ්‍යා සටහන**

**මැදි හා දිගුකාලීන ණය අරමුදල.**
**(කාණ්ඩ II, III සහ IV යටතේ ප්‍රතිමූල්‍ය අනුමත කිරීම)**
**1988 - 1991**

(රුපියල් දශ ලක්ෂ)

| කාණ්ඩය | 1989 | | 1990 | | 1991 | |
|---|---|---|---|---|---|---|
| | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය |
| II | | | | | | |
| අපනයන අංශය | 46.2 | 32.3 | 32.7 | 22.9 | 103.7 | 72.6 |
| III සහ IV | | | | | | |
| 1. කෘෂිකර්මය | 14.7 | 8.8[අ] | - | - | - | - |
| 2. කර්මාන්ත | 35.4 | 21.2 | 72.6 | 71.6 | - | - |
| 3. හෝටල් | - | - | - | - | 79.2 | 47.5 |
| අ. අළුත්වැඩියාවන් | - | - | - | - | 75.0 | 45.0 |
| ආ. මෝටර් කෝච් රථ | - | - | - | - | 4.2 | 2.5 |
| 4. අනෙකුත් | 80.0 | 80.0 | 43.5 | 26.1 | 15.0 | 9.0 |
| අඩාල වූ කර්මාන්ත සඳහා ආධාර | 463.1 | 298.2[ආ] | 787.4 | 787.4 | 108.0 | 108.0 |
| එකතුව | 639.4 | 440.5 | 936.2 | 908.0 | 305.9 | 237.1 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) මැදිකාලීන ආයෝජන වැඩසටහන යටතේ වැවිලි භෝග ව්‍යාපෘති සඳහා ලංකා බැංකුවට 1989 දී ප්‍රදානය කළ එක් ණය මුදලක් ඇතුළත්ය.

(ආ) සංචාරක හෝටල් ව්‍යාපෘතීන් 27 කට දෙන ලද ණය මුදල් සඳහා හිඟහිට ඇති පොලිය ප්‍රාග්ධනගත කිරීම් ඇතුළත්ය.

## ණය සහතික කටයුතු

1991.12.31 වැනි දිනට මහ බැංකුව විසින් පාලනය කෙරෙන ණය සහතික යෝජනා ක්‍රමයන් හතර යටතේ වූ ණය සහතික කටයුතුවල සාරාංශයක් 2.9 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි. ක.) යෝජනා ක්‍රමය

1978 - 1981 කාල පරිච්ඡේදය තුළදී සු. පරි. ක. යෝජනා ක්‍රමය යටතේ සහතික කරන ලද 767 ක් වූ මුළු ණය සංඛ්‍යාවෙන් රුපියල් දශ ලක්ෂ 23 ක් වූ ණය 597 ක් සම්පූර්ණයෙන්ම ආපසු ගෙවා තිබුණු අතර, 1991 වර්ෂය අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 5 ක වටිනාකම ඇති සහතික 86 ක් මහ බැංකුව විසින් සහභාගිත්ව ණය දෙන ආයතන වලට (ස.ණ.ආ) නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීම නිසා, ඉවත් කරගෙන හෝ අහෝසි වී හෝ තිබුණි. රුපියල් දශ ලක්ස 4.3 ක ප්‍රමාණයක හිමිකම්පෑම් 88 ක් 1991 අවසානය වන විට ලැබී තිබුණු අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 1.7 ක ප්‍රමාණයක් සඳහා වන හිමිකම්පෑම් 63 ක් ගෙවා නිම කරන ලදී.

**සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත - I (සුමක - I) යෝජනා ක්‍රමය :**

සුමක -I යෝජනා ක්‍රමය යටතේ 1979 -1982 කාලපරිච්ඡේදය තුළදී රුපියල් දශ ලක්ෂ 286 ක ප්‍රමාණයක ණය මුදල් ආවරණය වන පරිදි නිකුත් කරන ලද මුළු සහතික සංඛ්‍යාව 1,670 කි. නිකුත් කරන ලද මුළු සංඛ්‍යාව අතුරින් 1,204 ක ණය සංඛ්‍යාවක් සම්පූර්ණයෙන්ම ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශ ලක්ෂ 30 ක ප්‍රමාණයක ණය සහතික 109 ක්, 1991 අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස.ණ.ආ. වලට නිකුත් කළ මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීම නිසා ඉවත් කරගෙන හෝ අහෝසි වී හෝ තිබුණි. 1991 අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 32 ක වගකීමක් සහිත හිමිකම්පෑම් 329 ක් ලැබුණු අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 18 ක් වන හිමිකම්පෑම් 224 ක් සමථයකට පත් කරන ලද අතර හිමිකම්පෑම් 27 ක් වෙනුවෙන් මහ බැංකුවේ වගකීමෙන් 50% ක් නොඉක්මවන පරිදි රුපියල් දශ ලක්ෂ 2.1 ක අතුරු ගෙවීමක් සිදු කොට ඇත.

1991.12.31 දිනට මෙම යෝජනා ක්‍රමය යටතේ රැස් කරන ලද මුළු ඇප වාරික මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12 ක් වූ අතර මෙම දිනය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව ලද පශ්චාත් හිමිකම් අයකර ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4.6 ක් විය.

**සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත II (සුමක II) යෝජනා ක්‍රමය :**

1982 - 1989 කාලපරිච්ඡේදය තුළදී සුමක II යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 1,392 ක ප්‍රමාණයක වටිනාකම් ඇති ණය 2,531 ක් සහතික කරන ලදී. එයින් රුපියල් දශ ලක්ෂ 233 ක වටිනාකමකින් යුත් ණය මුදල් 707 ක් ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශ ලක්ෂ 142 ක වටිනාකම ඇති සහතික 276 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස.ණ.ආ. වලට නිකුත් කරන ලද උපදෙස් අනුගමනය නොකිරීම නිසා ඉවත් කරගෙන හෝ අහෝසි වී තිබුණි.

1991.12.31 දිනට ලැබී තිබුණු රුපියල් දශ ලක්ෂ 45.7 ක වගකීමක් සහිත හිමිකම් පෑම් 180 කින් රුපියල් දශ ලක්ෂ 23.3 ක වටිනාකමක් ඇති හිමිකම්පෑම් 99 ක් සමථයකට පත් කරන ලද අතර උතුරු හා නැගෙනහිර පළාත් සම්බන්ධයෙන් වන හිමිකම්පෑම් 05 ක් සඳහා මහ බැංකුවේ වගකීමෙන් 50% ක් නොඉක්මවන පරිදි රුපියල් දශ ලක්ෂ 0.7 ක අතුරු ගෙවීමක් සිදු කොට ඇත.

1991.12.31 දින වන විට මෙම යෝජනා ක්‍රමය යටතේ රැස් කරන ලද මුළු ඇපවාරික මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 26.4 ක් වූ අතර මෙම දිනය වන විට පශ්චාත් හිමිකම් අයකර ගැනීම්වල ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3.1 ක් විය.

**සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත - III (සුමක III) යෝජනා ක්‍රමය:**

1988 ජූලි මාසයේදී ආරම්භ වුණු සුමක III යෝජනා ක්‍රමය යටතේ 1991 අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 2,373 ක වටිනාකම ඇති ණය සහතික 3,883 ක් නිකුත් කොට ඇත. මින් රුපියල් දශ ලක්ෂ 17.5 ක වටිනාකම ඇති සහතික 48 ක් සඳහා වන ණය මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කොට ඇති අතර රුපියල් දශ ලක්ෂ 102 ක වටිනාකම ඇති ණය සහතික 208 ක් මහ බැංකුව විසින් ස.ණ.ආ. වලට නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීම නිසා ඉවත් කරගෙන හෝ අහෝසි වී තිබුණි. 1991.12.31 දිනට රුපියල් දශ ලක්ෂ 3.2 ක ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමක් සහිත හිමිකම්පෑම් 11ක් ලැබුණු අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 1.6 ක් සඳහා වන හිමිකම්පෑම් 06 ක් සමථයකට පත්කොට ඇත.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික

| යෝජනා ක්‍රම සහ වර්ෂ / ශීර්ෂය | සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි. ක.) | | | | සු. ම. ක. 1 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | | 1991 | | 1990 | | 1991 | |
| | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය |
| 1.1 අනුමත කරන ලද ණය | 767 | 31.20 | 767 | 31.20 | 1,670 | 286.10 | 1,670 | 286.10 |
| 1.2 සහතික කරන ලද ණය | 767 | 23.40(ආ) | 767 | 23.40(ආ) | 1,670 | 157.50(ඇ) | 1,670 | 157.50(ඈ) |
| 2.1 සම්පූර්ණයෙන් ගෙවා නිමි ණය | 593 | 22.90 | 597 | 22.98 | 1,189 | 168.69 | 1,204 | 174.40 |
| 2.2 ඉවත් කර ගන්නා ලද හෝ අවලංගු වූ ණය සහතික | 71 | 4.04 | 86 | 4.84 | 85 | 24.5 | 109 | 29.93 |
| <u>හිමිකම්පෑම්</u> | | | | | | | | |
| 3.1 ලැබූ මුළු හිමිකම්පෑම් | 88 | 4.32(ඊ) | 88 | 4.32(ඊ) | 327 | 73.30(ඊ) | 329 | 74.22(ඊ) |
| 3.2 ශ්‍රී මහ බැංකුවේ වගකීම් | | 2.42 | | 2.42 | | 31.73 | | 32.00 |
| 3.3 <u>හිමිකම් සමථයට පත් කිරීම</u> | | | | | | | | |
| 3.3.1 සම්පූර්ණයෙන් ගෙවීම් කළ හිමිකම් | 63 | 1.68 | 63 | 1.68 | 220 | 17.62 | 224 | 17.84 |
| 3.3.2 අතුරු ගෙවීම් කළ හිමිකම් (50%) | 1 | 0.00(උ) | 1 | 0.00(උ) | 28 | 2.11 | 27(ඌ) | 2.11 |
| 3.3.3 ප්‍රතික්ෂේප කළ හිමිකම් | 7 | 0.22 | 7 | 0.22 | 26 | 4.72 | 28 | 4.78 |
| 3.3.4 හිමිකම් ඉදිරිපත් කිරීමෙන් පසු සම්පූර්ණයෙන්ගෙවා නිමකරන ලද ණය (ඔ) | 16 | 0.24 | 16 | 0.24 | 37 | 2.03 | 37 | 2.03 |
| 3.3.5 සලකා බැලීම පසුවට කල් තබන ලද හිමිකම් (ඕ) | 1 | 0.27 | 1 | 0.27 | 12 | 3.04 | 12 | 3.04 |
| 3.3.6 තීරණ ගෙන නොමැති හිමිකම් (ඕ) | | | | | 4 | 0.09 | 1 | 0.18 |
| 3.3.7 ඉවත් කර ගන්නා ලද හිමිකම් (ඕ) | | | | | | | | |
| 4.1 නොපියවන ලද ණය මුදල් | 32 | 1.14(එ) | 13 | 0.61(එ) | 122 | 17.76(එ) | 78 | 11.69(එ) |
| 4.2 (එයින් හිඟහිටි ණය) | 32 | 1.14(එ) | 13 | 0.61(එ) | 117 | 17.02(එ) | 78 | 11.69(එ) |
| 4.3 ක්‍රියාත්මක ණය සහතික මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම | 32 | 0.86(ආ) | 13 | 0.46(ආ) | 122 | 10.32(ඇ) | 78 | 7.01(ඈ) |
| 5. රැස් කරන ලද වාර මුදල් | | 0.92 | | 1.00 | | 11.84 | | 11.98 |
| 6. පශ්චාත් හිමිකම් අය කර ගැනීම් | | 0.36. | | 0.52 | | 2.75 | | 4.58 |

(අ) 1990 අවසානය වනවිට මුදාහැර ඇති බවට වාර්තා වී නොමැති රුපියල් දශ ලක්ෂ 220.8 ක මුදලක් සඳහා වූ ණය 346 ක් ඇතුළත්ය.
(ආ) ණය ශේෂයන්ගෙන් සියයට 75 ක ප්‍රමාණය.
(ඇ) ව්‍යාපෘතියකට රුපියල් දශ ලක්ෂ 0.4 උපරිමයකට යටත්ව ණය ශේෂයෙන් සියයට 60 ක ප්‍රමාණය.
(ඈ) රුපියල් දශ ලක්ෂ 2.0 ක් දක්වා වූ ණය සම්බන්ධයෙන් රුපියල් දශ ලක්ෂ 0.8 දක්වා සහ රුපියල් දශ ලක්ෂ 2.0 සිට රුපියල් දශ ලක්ෂ 4.0 දක්වා වූ ණය සඳහා රුපියල් දශ ලක්ෂ 1.2 ක් දක්වා උපරිමයකට යටත්ව ණය ශේෂයන්ගෙන් සියයට 60 ක ප්‍රමාණය
(ඉ) ව්‍යාපෘතියකට රුපියල් දශ ලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශ ලක්ෂ 2.0 ක් දක්වා වූ ණය, රුපියල් දශ ලක්ෂ 2.0 සිට 3.0 දක්වා වූ ණය සහ රුපියල් දශ ලක්ෂ 3.0 සිට 4.0 දක්වා වූ ණය සම්බන්ධයෙන් ණය ශේෂයන්ගෙන් පිළිවෙලින් සියයට 80, 60 සහ 40 ප්‍රමාණය.
(ඊ) ගෙවීම් පැහැර හැර ඇති ණය මුදල් එකතු වූ පොළියත් සමග.
(උ) රු. 4,504.75 ක හිමිකම් ගෙවා ඇත.
(ඌ) ඉහත වර්ෂ වලදී අතුරු ගෙවීම් කළ හිමිකම් පූර්ණ සමථයට පත් කිරීම.
(එ) අයකර ගත් ණය වාරික හැර.
(ඒ) රු. 7200.00 ක් අය වී ඇත.
(ඔ) 2.1 යටතේ අඩංගු වී ඇත.
(ඕ) 4.1 යටතේ අඩංගු වී ඇත.

## ක්‍රමයත්හි 1991.12.31 දිනට පැවති සාරාංශය.

(රුපියල් දශ ලක්ෂ)

| සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සු. ම. ක. 11 | | | | සු. ම. ක. 111 | | | |
| 1990 | | 1991 | | 1990 | | 1991 | |
| සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය |
| 2,531 | 1,392.54 | 2,531 | 1,392.54 | 2,340(අ) | 1,383.23 | 3,883 | 2,373.20 |
| 2.531 | 713.63(ඇ) | 2,531 | 713.63(ඇ) | 2,340 | 955.88(ඉ) | 3,883 | 1,660.65(ඉ) |
| 487 | 149.90 | 707 | 232.78 | 12 | 7.81 | 48 | 17.50 |
| 238 | 129.96 | 276 | 142.24 | 97 | 74.91 | 208 | 101.70 |
| 144 | 66.25(ට) | 180 | 80.55(ට) | 3 | 1.35(ට) | 11 | 5.02(ට) |
| | 36.17 | | 45.71 | | 0.89 | | 3.22 |
| 76 | 18.73 | 99 | 23.26 | 1 | 0.01 | 6 | 1.60 |
| 8 | 0.82 | 5(උ) | 0.71 | | | | |
| 32 | 7.61 | 39 | 9.08 | 1 | 0.56 | 1 | 0.56 |
| 2 | 0.58 | 2 | 0.58 | | | | |
| 22 | 6.54 | 25 | 7.12 | 1 | 0.32 | 2 | 0.46 |
| 4 | 1.07 | 5 | 1.69 | | | 2 | 0.59 |
| | | 5 | 2.26 | | | | |
| 1,690 | 604.61(එ) | 1,405 | 422.71(එ) | 1,883 | 975.58(එ) | 3,620 | 1,825.42(ඒ) |
| 739 | 192.51(එ) | 897 | 184.05(එ) | 181 | 18,02(එ) | 395 | 36.37(ඒ) |
| 1,690 | 337.69(ඇ) | 1,405 | 265.49(ඇ) | 1,883 | 604.70(ඉ) | 3,620 | 1,284.42(ඉ) |
| | 22.69 | | 25.42 | | 8.32 | | 18.79 |
| | 0.67 | | 3.11 | | - | 1 | 0.00(ඒ) |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## සු. ම. ක. II සහ III ණය සහතික ක්‍රම

| යෝජනා ක්‍රම / කර්මාන්තය | සු. ම. ක. 11 සහ 111 1982 - 1991 | | | | | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රදානය කළ ණය | | ණය මුදල් | | සහතික කළ මුදල් | |
| | සංඛ්‍යාව | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| 1. ආහාර වර්ග සැකසීම | 1688 | 26.3 | 1,024,798 | 27.2 | 607,393 | 25.6 |
| 2. වෙනත් කෘෂි කර්මාන්ත | 154 | 2.4 | 71,536 | 1.9 | 47,631 | 2.0 |
| 3. රබර් නිෂ්පාදන | 173 | 2.7 | 154,494 | 4.1 | 93,001 | 3.9 |
| 4. ලෝහ නිෂ්පාදන | 572 | 8.9 | 267,513 | 7.1 | 167,021 | 7.0 |
| 5. ඉදිකිරීම් ද්‍රව්‍ය | 499 | 7.8 | 258,280 | 6.9 | 179,310 | 7.6 |
| 6. ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු | 66 | 1.0 | 56,726 | 1.5 | 33.281 | 1.4 |
| 7. දැව කර්මාන්ත | 423 | 6.6 | 165,353 | 4.4 | 111,779 | 4.7 |
| 8. ඇඟළුම් | 499 | 7.8 | 383,226 | 10.2 | 247,796 | 10.4 |
| 9. රෙදිපිළි | 156 | 2.4 | 126,204 | 3.4 | 75,833 | 3.2 |
| 10. අළුත් වැඩියා කිරීමේ වැඩපලවල් | 236 | 3.7 | 101,614 | 2.7 | 67,131 | 2.8 |
| 11. වෙනත් | 1,948 | 30.4 | 1,155,992 | 30.7 | 744,100 | 31.3 |
| එකතුව | 6,414 | 100.0 | 3,765,736 | 100.0 | 2,374,276 | 100.0 |

**2.10 සංඛ්‍යා සටහන**

## - 1991 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත අනුව වර්ගීකරණය.

(රුපියල් දහස් ගණනින්)

| සු. ම. ක. III 1988 - 1991 | | | | | | සු. ම. ක. III - 1991 | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රදානය කළ ණය | | ණය මුදල් | | සහතික කළ මුදල් | | ප්‍රදානය කළ ණය | | ණය මුදල් | | සහතික කළ මුදල් | |
| සංඛ්‍යාව | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | සංඛ්‍යාව | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| 850 | 21.9 | 571,661 | 24.1 | 376,160 | 22.7 | 359 | 23.3 | 250,447 | 25.3 | 170,372 | 24.2 |
| 105 | 2.7 | 48,513 | 2.0 | 35,898 | 2.2 | 34 | 2.2 | 15,174 | 1.5 | 11,539 | 1.6 |
| 100 | 2.6 | 99,423 | 4.2 | 65,739 | 4.0 | 38 | 2.5 | 33,002 | 3.3 | 24,102 | 3.4 |
| 329 | 8.5 | 150,858 | 6.4 | 108,279 | 6.5 | 118 | 7.6 | 54,311 | 5.5 | 38,706 | 5.5 |
| 338 | 8.7 | 168,280 | 7.1 | 129,805 | 7.8 | 89 | 5.8 | 49,150 | 5.0 | 37,220 | 5.3 |
| 38 | 1.0 | 22,526 | 0.9 | 15,821 | 1.0 | 7 | 0.5 | 10,616 | 1.1 | 6,293 | 0.9 |
| 256 | 6.6 | 107,678 | 4.5 | 79,729 | 4.8 | 83 | 5.4 | 36,422 | 3.7 | 26,578 | 3.8 |
| 368 | 9.5 | 310,017 | 13.1 | 211,408 | 12.7 | 150 | 9.7 | 130,523 | 13.2 | 89,616 | 12.7 |
| 101 | 2.6 | 80,430 | 3.4 | 52,711 | 3.2 | 47 | 3.0 | 35,101 | 3.5 | 24,628 | 3.5 |
| 134 | 3.5 | 61,137 | 2.6 | 44,472 | 2.7 | 47 | 3.0 | 25,040 | 2.5 | 17,232 | 2.4 |
| 1,264 | 32.6 | 752,673 | 31.7 | 540,624 | 32.6 | 571 | 37.0 | 350,177 | 35.4 | 258,482 | 36.7 |
| 3,883 | 100.0 | 2,373,196 | 100.0 | 1,660,646 | 100.0 | 1,543 | 100.0 | 989,963 | 100.0 | 704,768 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1991.12.31 දිනට මෙම යෝජනා ක්‍රමය යටතේ රැස් කරන ලද මුළු ඇපවාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 18.8 ක් විය.

මෙම වසර තුළදී ජාතික සංවර්ධන බැංකුව සමග මහනුවර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව (ප්‍රා. ග්‍රා. සං. බැ.) සහභාගිත්ව ගිවිසුමක් අත්සන් කරන ලදී. දැනට ස.ණ.ආ. වශයෙන් ක්‍රියා කරනු ලබන ලංකා බැංකුව, මහජන බැංකුව, කුරුණෑගල හා කෑගල්ල ප්‍රදේශීය සංවර්ධන බැංකු, සංවර්ධන මූල්‍ය සමායතනය, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, සීමාසහිත ලංකා වාණිජ බැංකුව, සීමාසහිත සම්පත් බැංකුව සහ සීමාසහිත සෙලාන් බැංකුවට අමතරව, එම ආයතනයට ද ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික ක්‍රමය යටතේ සුමක ණය මුදල් ප්‍රදානය කිරීමේ සුදුසුකම් තිබිච්ණි. සුමක II සහ III යන ණය ක්‍රම යටතේ මූල්‍ය පහසුකම් ලද ව්‍යාපෘතීන් වල කර්මාන්ත අනුව කරන ලද වර්ගීකරණයක් 2.10 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## බස්රථ මිලදී ගැනීමේ ණය (බමීණ) ක්‍රමය

මහා භාණ්ඩාගාරයේ ඉල්ලීමක් පරිදි පෞද්ගලික බස් රථ ධාවකයින්ට ආසන 30 කට නොඅඩු බස් රථ මිලදී ගැනීම සඳහා ස.ණ.ආ. විසින් ප්‍රදානය කරනු ලබන ණය මුදල් ආවරණය වන පරිදි ණය සහතික ක්‍රමයක් මහ බැංකුව විසින් 1990 නොවැම්බර් මස දී හඳුන්වා දෙනු ලැබීය. මෙම ක්‍රමය යටතේ 1991.12.31 දින වන විට රුපියල් දශ ලක්ෂ 848 ක ප්‍රමාණයක ණය මුදල් 1,511 ක් ආවරණය කිරීම සඳහා ණය සහතික නිකුත් කොට ඇත. මේ අතරින් ණය මුදල් 02 ක් සඳහා වූ රුපියල් දශ ලක්ෂ 0.96 සම්පූර්ණයෙන්ම ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශ ලක්ෂ 7.3 ප්‍රමාණයකින් යුත් ණය සහතික 16 ක් ස.ණ.ආ. විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීමේ හේතුවෙන් 1991.12.31 දින වන විට අහෝසි විය. (2.11 සංඛ්‍යා සටහන)

1991.12.31 දින වන විට මෙම ණය ක්‍රමය යටතේ එකතු කළ වාර මුදල් වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 3.1 ක් විය.

## පසු විපරම් කිරීම සහ ව්‍යාපෘති පරීක්ෂණ

අවශ්‍ය අවස්ථා වන්හිදි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් ගැනීමේ අරමුණ පෙරදැරි කොට ගෙන මෙන්ම ස.ණ.ආ. විසින් ඉදිරිපත් කරන ලද හිමිකම් සමරයකට පත් කිරීම සඳහා ද සුමක ණය ක්‍රමය යටතේ වූ ව්‍යාපෘතීන් 246 ක් 1991 වර්ෂය තුළ පරීක්ෂාවට ලක් විය. මෙම ව්‍යාපෘති වලින් වැඩි සංඛ්‍යාවක් කොළඹ, ගම්පහ, මහනුවර, කෑගල්ල, පුත්තලම සහ ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි පිහිටුවා තිබුණි.

## සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත IV (සුමක IV ) යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.ස) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආ.සං.බැ) ඒකාබද්ධව අරමුදල් සපයනු ලබන ඩොලර් දශ ලක්ෂ 75 ක ණය මුදලින් ජාතික සංවර්ධන බැංකුව විසින්, IV වැනි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය යටතේ සපයනු ලබන ප්‍රතිමූල්‍ය ණය සඳහා වූ ණය සහතික ක්‍රමයක් මුදල් මණ්ඩලය විසින් 1991 නොවැම්බර් මස දී අනුමත කරන ලදී. ජාතික සංවර්ධන බැංකුව සමග සහභාගිත්ව ගිවිසුම්

අත්සන් කළ සෑම වාණිජ බැංකුවටම සහ ණය දෙන ආයතනයකටම මහ බැංකුව විසින් මෙම ණය සහතික ක්‍රමය යටතේ ණය සහතික ලබාදෙනු ඇත.

**2.11 සංඛ්‍යා සටහන**

**බස්රට මිලදී ගැනීමේ ණය ක්‍රමය 1991.12.31 දිනට සාරාංශය.**

(රුපියල් දශ ලක්ෂ)

| | 1991 | |
|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම |
| 1.1 ප්‍රදානය කරන ලද ණය | 1,511 | 847.94 |
| 1.2 සහතික කරන ලද ණය | 1,511 | 674.82 (අ) |
| 2.1 සම්පූර්ණයෙන්ම ආපසු ගෙවා ඇති ණය | 2 | 0.96 |
| 2.2 ඉවත්කර ගන්නා ලද හෝ අවලංගු වූ ණය සහතික | 16 | 7.35 |
| 3.1 නොපියවන ලද ණය මුදල් | 1,493 | 679.36 (ආ) |
| 3.2 නොබේරූ ණය සහතික මත බැංකුවේ වගකීම | 1,493 | 541.17 |
| 4. එකතු කරනු ලද වාර මුදල් | | 3.08 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ව්‍යාපෘතියකට රුපියල් දශ ලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශ ලක්ෂ 2.0 ක් දක්වා, රුපියල් දශ ලක්ෂ 2.0 සිට 3.0 දක්වා සහ රුපියල් දශ ලක්ෂ 3.0 සිට 4.0 දක්වා වූ ණය සම්බන්ධයෙන් පිළිවෙලින් 80%, 60%, සහ 40% ප්‍රමාණයන් මත.

(ආ) අයකර ගත් ණය වාරික හැර.

පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර මෙම ණය සහතික ක්‍රමය මීට පෙර පැවති සුමක ණය සහතික ක්‍රමයන්හි නියමයන් හා කොන්දේසි වලට සමානය :-

(අ) ස.ණ.ආ. විසින් අනුමත කරනු ලබන කාලීන ණය මුදල් වල සමස්ථ වටිනාකම සුමක III ක්‍රමය යටතේ පැවති රුපියල් දශ ලක්ෂ 4.0 සිට රුපියල් දශ ලක්ෂ 8.0 දක්වා ඉහළ දැමීම.

(ආ) නිකුත් කරනු ලබන ණය සහතිකයෙන් ආවරණය වන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව උප - ණය මුදලේ ප්‍රමාණයට පහත සඳහන් පරිදි තීරණය කිරීම.

| උප - ණය මුදලේ ප්‍රමාණය (රුපියල්) | ණය සහතිකයේ ප්‍රමාණය |
|---|---|
| 500,000/- ට අඩු | 90% |
| 500,000/- සිට 1,000,000/- අඩු | 80% |
| 1,000,000/- සිට 2,000,000/- අඩු | 70% |
| 2,000,000/- සිට 8,000,000/- දක්වා | 60% |

(ඇ) ණය සහතික සඳහා වාර මුදල් වාර්ෂිකව ගෙවිය යුතුය මුල් වර්ෂයේ ආරම්භක වාර මුදල වශයෙන් ණය මුදලේ සහතික කළ ප්‍රමාණයෙන් සියයට 1 ක් ගෙවිය යුතු අතර, පසුව එළඹෙන එක් එක් වර්ෂයක් සඳහා ඊට පෙර වර්ෂය අවසානයේදී ණය ගිණුමේ පැවති ශේෂය මත වාර මුදල පදනම් වීම.

**සුමක හා බමිණ ණය සහතික අරමුදල් ආයෝජනය කිරීම**

සුමක හා බමිණ ණය සහතික අරමුදල් ප්‍රාථමික හා ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොලෙහි ආයෝජනය කිරීම, පිළිවෙලින් 1988 ජූලි සහ 1991 ජනවාරි මාස වලදී ආරම්භ විය. 1991.12.31 වැනි දිනට අරමුදල් දෙකෙහිම පැවති ආයෝජිත මුළු මුදල ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 300 ක් විය. වර්ෂය තුළ මෙම ආයෝජන වලින් උපයන ලද පොළී ආදායම රුපියල් දශ ලක්ෂ 27 ක් විය.

**ව්‍යවසායකත්ව සංවර්ධන වැඩපිළිවෙල**

වර්ෂය තුළදී ව්‍යවසායකයින් සංවර්ධන කිරීමේ වැඩ සටහන් 03 ක් පවත්වන ලදී. මෙයින් පළමු වැඩසටහන, පාසල් හැර යන්නන් සහ ජනසවි ලාභීන්ට ස්වයං රැකියා අවස්ථා පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දී පැවැත් වූ අතර, ඒ සඳහා 102 ක් සහභාගී විය. දෙවැනි වැඩ සටහන, මොණරාගල දිස්ත්‍රික්කයෙන් තෝරා ගත් ව්‍යවසායකයින් 130 දෙනෙකු වෙනුවෙන් ඔවුන්ගේ කුසලතාවයන් වර්ධනය කිරීම සඳහා මොණරාගල පවත්වන ලදී. තුන්වැනි වැඩසටහන, ලුහු කර්මාන්තයන්හි නියැලි කාර්මිකයින් අතුරින් තෝරා ගත් 35 දෙනෙකුගේ තාක්ෂණික හා කළමනාකරණ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සංවිධානය කෙරුණි. මෙම සියළුම පුහුණු වැඩසටහන්, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහ පොළොන්නරුව, මොණරාගල හා හම්බන්තොට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වල සහයෝගය ඇතිව පවත්වන ලදී.

## ග්‍රාමීය ණය

විදේශීය ආයතන විසින් අරමුදල් සපයන ලද පහත සඳහන් ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමෙහිලා ණය මෙහෙයුම් ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව 1991 වසරතුලදී තවදුරටත් කටයුතු කරන ලදී.

1. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘජාඅ) මගින් අරමුදල් සපයන ලද බදුල්ල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය.
2. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘජාඅ) මගින් අරමුදල් සපයන ලද කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය.
3. ආසියාතු සංවර්ධන බැංකුව (ආ.සං.බැ.) මගින් අරමුදල් සපයන ලද කිරිදිඹය වාරිමාර්ග සහ පදිංචි කරවීමේ ව්‍යාපෘතිය (දෙවන අදියර)
4. ආසියාතු සංවර්ධන බැංකුව (ආ.සං.බැ.) අරමුදල් සපයන කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය.
5. ආසියාතු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන, මැදරට බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය.
6. ආසියාතු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයනු ලබන කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය.

බදුල්ල සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති යටතේ 1991 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 26.4 ක ණය මුදලක් ප්‍රදානය කරනු ලැබිණි.

නව පදිංචිකරුවන්ගේ ණය අවශ්‍යතාවයන් සපුරාලීම සම්බන්ධයෙන් සහභාගී වන ණය දෙන ආයතනවල (ස.ණ.දෙ.ආ.) ක්‍රියාකාරීත්වය අගැයීම සඳහා කිරිදිඹය වාරිමාර්ග හා පදිංචි කරවීමේ ව්‍යාපෘතියේ දෙවන අදියරට අයත්වන ව්‍යාපෘති බල ප්‍රදේශවල ණය දෙන ආයතන පිළිබඳ විමර්ශනයක් 1991 ජූලි මාසය තුළ සිදු කරනු ලැබිණි.

ආසියාතු සංවර්ධන බැංකුවෙන් (ආ.සං.බැ.) ලබාගත් ණය අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලබන කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමයේ ණය කොටස සඳහා ප්‍රධාන මෙහෙයුම් ආයතනය වශයෙන් ක්‍රියාකරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව 1991 වසර තුළදී ද එම අරමුදලින් ක්ෂේත්‍ර සංවර්ධනය, තවාන් සංවර්ධනය සහ තේ කර්මාන්ත ශාලා පුනරුත්ථාපනය සඳහා ලංකා බැංකුව, මහජන බැංකුව, වානිජ බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සම්පත් බැංකුව, සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ මහනුවර, කෑගල්ල සහ කළුතර දිස්ත්‍රික්කයන්හි පිහිටි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මගින් ප්‍රතිමූල්‍ය පහසුකම් සපයමින් එම කාර්යය තවදුරටත් ඉටු කරන ලදී. 1991 වසර අවසන් වන විට මෙම යෝජනා ක්‍රමය යටතේ සපයන ලද ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 18.9 ක් විය.

බදුල්ල, මහනුවර, මාතලේ සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි බහුවාර්ෂික භෝගවල විශේෂයෙන්ම සුළු අපනයන භෝග සහ ආහාර භෝග වගාවන්හි නිෂ්පාදනය ඉහළ නැංවීමත්, ඒවායේ වානිජමය මට්ටම වැඩි දියුණු කිරීමත් අරමුණු කොට ගෙන ආසියාතු සංවර්ධන බැංකුවෙන් ලබාගත් ණය අරමුදල් වලින්, ගොවීන්ට ණය පහසුකම් සැපයීම සඳහා බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනාක්‍රමය සැලසුම්කොට ඇත.

ලංකා බැංකුව, මහජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ලංකා වානිජ බැංකුව සහ මහනුවර, කෑගල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල ග්‍රාමීය සංවර්ධන බැංකු මෙම ණය යෝජනාක්‍රමය යටතේ සහභාගීවන ණය දෙන ආයතන වශයෙන් කටයුතු කරනු ලැබේ.

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ බහු වාර්ෂික භෝග සම්බන්ධ ගොවිපොළ භෝග සංවර්ධනය, පුද්ගලික පැල තවාන් සංවර්ධනය, ගොවිපොලෙහිදීම අස්වනු ලබාගැනීම සහ සැකසීමේ කටයුතු සඳහා ණය පහසුකම් සැපයේ. 1991 අග වන විට මහ බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 5.6ක ප්‍රමාණයක් ප්‍රතිමූල්‍ය වශයෙන් මුදා හැර තිබුණි.

ආසියානු සංවර්ධන බැංකු අරමුදලින් ක්‍රියාත්මක වන කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය සහ බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනාක්‍රමය යටතේ අරමුදල් නිකුත් කිරීම සම්බන්ධ ගැටළු හඳුනාගැනීමට හා යෝජනාක්‍රමවල ප්‍රගතිය විමර්ශනය කිරීම සඳහා 1991 නොවැම්බර් මසදී මහනුවර, කෑගල්ල හා මාතලේ යන දිස්ත්‍රික්කවල අධ්‍යයනයක් සිදු කරන ලදී.

මහ බැංකුවේ දේශීය බිල්පත් යෝජනාක්‍රමය යටතේ 1991 වර්ෂය තුල රුපියල් දශ ලක්ෂ 13.7 ක වටිනාකමකින් යුත් ප්‍රතිග්‍රහණ ණයවර සීමාවන් 11 ක් අනුමත කරන ලදී. තේ වගා අංශය තුල අමු තේ දළු සැපයුම්කරුවන් හා තේ දළු කම්හල් හිමියන්ට සහායදීම සඳහා 1989 දී මෙම යෝජනාක්‍රමය හඳුන්වා දෙන ලදී.

අනතුරුව කිරි මිළදී ගන්නන්හට සහ විකුනන්නන්හට අවශ්‍ය මූල්‍ය පහසුකම් නුවරඑළිය ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව මගින් සැපයීම සඳහා මෙම යෝජනාක්‍රමය ව්‍යාප්ත කරන ලදී.

## ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැං.)

1985 වර්ෂයේදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැං.) ස්ථාපනය කිරීමෙහි සිට දක්නට ලැබුණු ප්‍රවණතාවය තවදුරටත් පවත්වා ගනිමින් සහ එම බැංකු, ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා වන ආයතනික පද්ධතියෙහි ප්‍රධානතම ආයතනයක් බවට පත් වෙමින්, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කටයුතු, එනම් තැන්පතු රැස් කිරීම, ණය පහසුකම් සැපයීම, සහ ග්‍රාමීය ආර්ථිකයෙහි සංවර්ධනය සඳහා අවශ්‍ය වෙනත් පහසුකම් හා සේවාවන් සැපයීම, 1991 වර්ෂයේදී ද තවදුරටත් පුළුල් විය.

### ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවීම හා ශාඛා ව්‍යාප්තිය

මෙම වර්ෂය තුළ පොලොන්නරුව, මාතලේ සහ රත්නපුර යන පරිපාලන දිස්ත්‍රික්කවල නව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු තුනක් පිහිටුවීමත් සමඟ මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 12 සිට 1991 වසර අවසානය වන විට 15 දක්වා වැඩි විය. මේ අතර 1990 වසරේ 101ක් ව තිබූ මුළු ශාඛා ගණන 124 බවට පත් කරමින් නව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා 23 ක් 1991 වසර තුළදී විවෘත කරනු ලැබින.

### තැන්පතු රැස්කිරීම

පසුගිය හය වසර තුළ පැවැති උපනතිය දිගටම පවත්වාගෙන යමින් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් රැස් කරන ලද ග්‍රාමීය ඉතිරිකිරීම් 1991 වසරේදී තවදුරටත් ව්‍යාප්ත විය. 1990 වසරේදී ගිණුම් 309,616 ක රුපියල් දශ ලක්ෂ 314 ව පැවති, ඉතිරිකිරීමේ ගිණුම් සහ ස්ථාවර තැන්පත් ගිණුම් යන දෙවර්ගයෙන් සමන්විත වූ මුළු තැන්පතුවල වටිනාකම 1991 වසරේදී, ගිණුම් 423,680 ක රුපියල් දශ ලක්ෂ 438 ක සමස්ත වටිනාකමක් දක්වා වැඩිවිය. පසුගිය වසරේ වාර්තා වූ අදාළ දත්තයන්ට අනුව මෙය අනුපිළිවෙලින් ගිණුම් 114,064 ක හෝ සියයට 37 ක රුපියල් දශ ලක්ෂ 124 ක හෝ සියයට 39 ක වැඩිවීමකි. නව ඉතිරිකිරීමේ යෝජනා ක්‍රම හඳුන්වාදීම, තැන්පතු සඳහා ආකර්ෂණීය පොලී අනුපාතයන් ගෙවීම, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පද්ධතියේ ව්‍යාප්තිය, ග්‍රාමීය ආර්ථික කටයුතුවල දක්නට ලැබුණ වර්ධනය සහ යහපත් වූ ආරක්ෂක තත්ත්වය යන කරුණු 1991 වසරේ දී ඇති වූ මෙම වාසිදායක සංවර්ධනයට දායක වූ සාධක විය. 1991 වසරේ තැන්පතුවල මුළු වටිනාකමින් ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 388 ක් වූ අතර ඉතිරි අගය වූ රුපියල් දශ ලක්ෂ 50 ස්ථාවර තැන්පතු වලින් යුක්ත විය.

**ණය සැපයීම**

ග්‍රාමීය අංශයට ණය පහසුකම් ලබාදීමේ අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා දිගු කාලයක් තිස්සේ පැවැති අවශ්‍යතාවයට ප්‍රතිචාර දක්වමින් 80 දශකයේ මැද භාගයේ සිට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ණය යෝජනාක්‍රම කිහිපයක් මගින් එම අංශයට ණය ගලායෑම නිරතුරුව වැඩිකර තිබේ. පුළුල් වූ ආර්ථික කටයුතු සමුදායක් සඳහා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් ලබාදෙන ලද මුළු ණය (නොපියවූ) වටිනාකම සියයට 56 ක වර්ධනයක් පෙන්නුම් කරමින් 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 517 සිට 1991 වසරේදී රුපියල් දශලක්ෂ 806 දක්වා වැඩි විය. මෙම වසර තුළදී ලබාදුන් ණය, කෘෂිකර්ම, කුඩා කර්මාන්ත, වෙළඳ හා වානිජ සහ ස්වයං රැකියා ව්‍යාපෘති යන අංශ සඳහා විය. මීට ඉහතදී දක්නට ලැබුණ උපනතිය හා අනුකූලව 1991 වසර අවසානයේදී නොපියවූ මුළු ණය වටිනාකමෙන් සියයට 45 ක් වූ වැඩි කොටස ප්‍රධාන වශයෙන් වී වගාව සහ විවිධ අතිරේක ආහාර භෝග සඳහා වූ කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් ලබා දී ඇත. කෙසේ වුවද, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල මුළු ණය සංයුතියේ කෘෂිකාර්මික ණය සඳහා වන ප්‍රතිශතය 1990 වර්ෂයේ සියයට 52 සිට මෙම වර්ෂය අවසාන වන විට සියයට 45 දක්වා පහත වැටුණි. 1991 වසරේ දී රුපියල් දශ ලක්ෂ 86 ක් වූ වෙළඳ හා වාණිජ අංශ සඳහා වූ නොපියවූ ණය, මුළු ණය සංයුතියෙන් සියයට 11 ක් පමණක් විය. මේ අනුව මුළු ණය ප්‍රමාණය නිෂ්පාදනය සම්බන්ධ වූ කටයුතු සඳහා වැඩි නැඹුරුවක් පිළිබිඹු කර ඇත. රන් භාණ්ඩ උකස් ලෙස තබා ගෙන ප්‍රදානය කළ ණය වටිනාකම වාර්ෂිකව නොකඩවා වැඩිවීම පසුගිය අවුරුදු කිහිපය තුළ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල ණය මෙහෙයුම් කටයුතුවල වූ විශේෂ ලක්ෂණය විය. විවිධ කටයුතු රැසක් වෙනුවෙන් ලබාදුන් මෙම ණය 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 94 සිට 1991 වසරේදී රුපියල් දශ ලක්ෂ 154 දක්වා වැඩි විය. මෙය, ග්‍රාමීය ජනතාව ඉහළ පිරිවැයක් සහිත අවිධිමත් මූල්‍ය අංශයෙන් මුදවා ගැනීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇත.

**අනෙකුත් කාර්යයන්**

ආදායම් ඉපයීමේ කටයුතුවලට මූල්‍ය පහසුකම් සැපැයීම මගින් ග්‍රාමීය අංශයේ දිළිඳුකම පිටුදැකීමේ රජයේ අරමුණ ඉටුකර ගැනීම සඳහා මෙම වසර තුළදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සිය කටයුතු තවදුරටත් ව්‍යාප්ත කොට ඇත. විමසුමට ලක් කෙරෙන වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන දීප ව්‍යාප්ත ස්වයං රැකියා යෝජනාක්‍රමය යටතේ ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා රුපියල් දශ ලක්ෂ 112 ක් ණය ලාභීන් 9222 ක් වෙත ප්‍රදානය කරන ලදී. 1990 වසරේදී රැකියා අවස්ථා 1779 ක් උත්පාදනය කරමින් ප්‍රදානය කළ රුපියල් දශ ලක්ෂ 18 ක ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී මෙම යෝජනාක්‍රමය යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කාර්‍යක්ෂමතාවයේ සැළකියයුතු වර්ධනයක් 1991 වසරේදී ලබා ඇති බව මින් පිළිබිඹු කරයි. ජනසවි යෝජනාක්‍රමයේ පළමු වටය අවසානයේදී එම යෝජනා ක්‍රමය හා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ක්‍රියාත්මක වන දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු, සාමූහිකව රැකියා අවස්ථා 4102 ක් උත්පාදනය කරමින්, රුපියල් දශ ලක්ෂ 20 ක වටිනාකමින් යුත් ණය 3197 ක් ප්‍රදානය කර ඇත. මෙම වසර අවසානයේදී ජනසවි යෝජනා ක්‍රමයේ දෙවන වටය යටතේ රැකියා අවස්ථා 2329 ක් උත්පාදනය කරමින් රුපියල් දශ ලක්ශ 12 ක වටිනාකම ඇති ණය, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් ලබා දී ඇත.

ගොවීන් විසින් මුහුණ පා ඇති අලෙවිකරණ ගැටළු විසඳීම සඳහා ඵලදායී පියවර ගැනීමට ඇති අවශ්‍යතාවය හඳුනා ගනිමින්, විමසුමට ලක් කෙරෙන කාලපරිච්ඡේදය තුළ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු, කෘෂිකාර්මික අලෙවිකරණ උපාය මාර්ග ශක්තිමත් කිරීමට හා වැඩි දියුණු කිරීමට පියවර කිහිපයක් ගෙන ඇත. ගොවීන්ගේ නිෂ්පාදන, අස්වනු නෙළීමෙන් පසුව ඉහළ මිල ගණන්වලට විකිණීම සඳහා ගොවීන්ට සහාය වීමේ අදහස ඇතිව 1991 වර්ෂය තුළදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 05 ක් විසින්, වී සහ වෙනත් අතිරේක ආහාර භෝග ගබඩා කිරීම සඳහා ගබඩා පහසුකම් සපයන ලදී. සිය ගනුදෙනුකරුවනට ගබඩා පහසුකම් සැපැයීම සඳහා රාජාංගනය, මිගලෑව, මොරයාය, ආනමඩුව, සූරිය-ආර, හිඟුරක්ගොඩ, ගලේවෙල සහ වීරවිල පිහිටි ගබඩා 08 ක් ප්‍රාදේශීය

## 2.12 සංඛ්‍යා සටහන

### ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා ව්‍යාප්තිය

| ප්‍රා. ග්‍රා. සං. බැංකුවේ නම | ප්‍රාදේශීය ග්‍රා. ස. බැංකුව ආරම්භ කළ දිනය | ප්‍රධාන කාර්යාලය | විවෘත කරන ලද ශාඛා සංඛ්‍යාව | | | | | | | 1991 අවසානය එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 1985 | 1986 | 1987 | 1988 | 1989 | 1990 | 1991 | |
| 1. කළුතර | 85.07.13 | බුලත්සිංහල | 4 | 3 | 4 | 1 | - | - | 1 | 13 |
| 2. මාතර | 85.07.28 | මාතර | 5 | 2 | - | 1 | - | - | - | 8 |
| 3. කුරුණෑගල | 85.08.10 | කුලියාපිටිය | 6 | 4 | 2 | 1 | 1 | 1 | - | 15 |
| 4. අනුරාධපුරය | 85.0812 | අනුරාධපුරය | 2 | 4 | 1 | - | - | - | 3 | 10 |
| 5. හම්බන්තොට | 85.12.13 | අම්බලන්තොට | | 2 | 2 | 2 | | 1 | - | 7 |
| 6. කෑගල්ල | 87.02.08 | කෑගල්ල | | | 8 | 1 | 2 | -1 | 1 | 11 |
| 7. පුත්තලම | 87.07.11 | හලාවත | | | 5 | 1 | - | 2 | 1 | 9 |
| 8. ගාල්ල | 87.08.17 | ඇල්පිටිය | | | 1 | 7 | 1 | - | - | 9 |
| 9. මහනුවර | 87.10.03 | මහනුවර | | | 6 | 3 | - | 2 | - | 11 |
| 10. නුවරඑළිය | 88.10.10 | නුවරඑළිය | | | | 1 | 3 | 2 | - | 6 |
| 11. මොණරාගල | 88.10.11 | බුත්තල | | | | 1 | 2 | 1 | 2 | 6 |
| 12. බදුල්ල | 90.10.13 | බදුල්ල | | | | | | 4 | 2 | 6 |
| 13. පොලොන්නරුව | 91.05.17 | පොලොන්නරුව | | | | | | | 4 | 4 |
| 14. මාතලේ | 91.06.21 | මාතලේ | | | | | | | 5 | 5 |
| 15. රත්නපුරය | 91.09.30 | රත්නපුරය | | | | | | | 4 | 4 |
| එකතුව | | | 17 | 15 | 29 | 19 | 9 | 12 | 23 | 124 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් වී අලෙවි මණ්ඩලයෙන් ලබාගත්තා ලදී. ගනුදෙනුකරුවනට සිය නිෂ්පාදන විකිණීම සඳහා අවස්ථා සහ පහසුකම් ද ඔවුන්ගේ හදිසි මුදල් අවශ්‍යතා පිරිමසා ගැනීම පිණිස, ගබඩා කර ඇති නිෂ්පාදන ඇපයට තබාගෙන කෙටිකාලීන ණය ද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් ලබා දී ඇත. සාධාරණ පිරිවැයකට කෘෂිකාර්මික යෙදවුම් ගොවීනට සැපයීම, 1991 වසරේදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් ලබා දී ඇති තවත් පහසුකමකි. මෙම වර්ෂයේ අවසානය වන විට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් රුපියල් දශ ලක්ෂ 4.2 ක වටිනාකමකින් යුත් බිත්තර වී, පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය හා කෘෂිකාර්මික උපකරණ බෙදා හැර ඇත.

ග්‍රාමීය අංශය තුළ ගනුදෙනු සඳහා නව උපකරණයක් ජනප්‍රිය කිරීමේ අදහස් ඇතිව හා කිරිපට්ටි පාලන අංශයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා දේශීය බිල්පත් යෝජනාක්‍රමයට නුවරඑළිය ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව 1991 වසරේ මාර්තු මාසයේදී සම්බන්ධ විය. මෙම යෝජනාක්‍රමය ක්‍රියාත්මක වූ මාස 09 ක කාපරිච්ඡේදය තුළ කිරි ලීටර් 246,538 ක් සකස් කිරීම සඳහා අවශ්‍ය මුදල් ලබාදීමට, ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 1 ක වටිනාකම ඇති දේශීය බිල්පත් 1299 ක් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් නිකුත් කර ඇත.

ජනහමු තුලින් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් ලබා දෙන බැංකු පහසුකම්, ඉතිරිකිරීමේ පුරුදු යනාදිය පිළිබඳව ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීම, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් 1991 වසරේදී ද අඛණ්ඩව කරගෙන යනු ලැබිණ.

## ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

මහ බැංකුවේ ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පුද්ගලයින් 2,385 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලා 97 ක් 1991 වර්ෂය තුළදී පවත්වන ලදී. 1990 වර්ෂයේ, පුද්ගලයින් 1,608 දෙනෙකු වෙනුවෙන් මෙහෙයවන ලද පුහුණු පාඨමාලා 50 හා සසඳා බලන කල මෙය කැපී පෙනෙන වර්ධනයකි. මෙහෙයවන ලද පුහුණු පාඨමාලා 97 න් 63 ක්ම පිට පළාත්වල පවත්වන ලද අතර ඒ සඳහා සුළු පරිමාණ ව්‍යවසායකයින්, සහ ස්වයං රැකියාවන්හි නියුතු පුද්ගලයින් 1,700 දෙනෙකු සහභාගි විය. මෙසේ සහභාගි වූවන්ගෙන් 1198 ක්ම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වල ප්‍රතිලාභීන් විය. ඉතිරි පුහුණු පාඨමාලා 34 පවත්වන ලද්දේ බැංකු සහ ඒ ආශ්‍රිත අංශයන්හි යෙදී සිටින නිලධාරීන් වෙනුවෙන් වන අතර, ඒ සඳහා නිලධාරීන් 685 දෙනෙකු සහභාගි විය. මොවුන්ගෙන් 272 දෙනෙකු ශ්‍රී ලංකා මහ බැංකුවෙන්ද, 266 දෙනෙකු වානිජ බැංකු වලින්ද, 74 දෙනෙකු ප්‍රාදේශීය සංවර්ධන බැංකු වලින් සහ 68 දෙනෙකු විවිධ සේවා සමුපකාර සමිති වලින් සහ මූල්‍ය සමාගම්, ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඉඩම් නොමැති සුළු ගොවීන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය වැනි අනෙකුත් මූල්‍ය ආයතන සහ නියෝජ්‍යායතන වලින්ද විය.

ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින්, 1991 වර්ෂයේදී පවත්වන ලද පුහුණු පාඨමාලා අතර ග්‍රාමීය බැංකු ක්‍රමය, යෝජනා ක්‍රම සංවර්ධනය, වානිජ බැංකු ක්‍රමය, ජාත්‍යන්තර වෙළඳාම, විදේශ විනිමය කටයුතු, කුලී සින්නක්කර සහ බදු සින්නක්කර මූල්‍ය කරණය, කළමනාකරණය, පුහුණු කරන්නන් පුහුණු කිරීම, ව්‍යාපෘති ක්‍රියාකාරීත්වය සහ ඇගයීම, සත්ත්වවේදනය සහ සුළු පරිමාණ ව්‍යවසායක සංවර්ධනය, යන විෂය ක්ෂේත්‍රයන් මූලික විය. 1991 වර්ෂයේ නියමිත පාඨමාලා සටහනට අතිරේකව ජාතික ඉතිරි කිරීමේ බැංකුව මෙහෙයවන මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන ග්‍රාමීය ණය මූලික යෝජනා ක්‍රමයෙහි ප්‍රතිලාභීන් වෙනුවෙන්, ඉඩම් නොමැති සුළු ගොවීන් සඳහා වූ ණය යෝජනා ක්‍රමයට අනුයුක්ත නිලධාරීන් වෙනුවෙන් සහ රත්නපුර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවෙහි ආධුනිකයින් සඳහාද ඔවුනගේ ඉල්ලීම මත අභ්‍යාස විද්‍යාලය මගින් විශේෂ පුහුණු පාඨමාලාවන් කිහිපයක් ද පවත්වන ලදී.

වර්තමාන සංවර්ධන ක්‍රියාදාමය තුළ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් මෙහෙයවන පුහුණු පාඨමාලාවන්හි උචිතතාවය විමර්ශනය කිරීම සඳහා වර්ෂය තුළදී කමිටුවක් පත් කරන ලදී. මෙම කමිටු වාර්තාව 1991 ඔක්තෝම්බර් මසදී ඉදිරිපත් කරන ලද අතර, එහි නිර්දේශිතයන් 1992 වැඩසටහන සම්පාදනය කිරීමේදී අනුගමනය කරන ලදී.

## සේවක අර්ථ සාධක අරමුදල

සේ.අ.අ. පනතේ විධි විධානයන් අනුව සේවක අර්ථසාධක අරමුදලට කෙරෙන දායක මුදල් සහ අධිභාර මුදල් ලබා ගැනීම, අරමුදල සතු මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම් ලබා ගැනීම, අරමුදලේ ලියා පදිංචි සේව්‍යයන්ගේ හා ඒ ඒ සාමාජිකයින්ගේ ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වා ගෙන යාම සහ ප්‍රතිලාභ මුදල් සාමාජිකයින් වෙත ආපසු ගෙවීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනමය කටයුතු භාරව සිටින කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය සමඟ සමීප සහයෝගීතාවයකින් යුතුව මෙම කටයුතු කර ගෙන යනු ලැබේ.

### දායක මුදල්

1990 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 3,909.5 හා සසඳා බලන කල 1991 වර්ෂය තුළදී අරමුදලට ලැබුණු දායක මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,421.3 ක් විය. මෙය කලින් වර්ෂයේ ලද දායක මුදල් මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 511.8 කින් හෙවත් සියයට 13 ක වැඩිවීමකි.

### සාමාජිකයින්ගේ ශේෂ

අදාල වර්ෂය සඳහා පොළී එකතු කිරීමට පෙර, 1991 දෙසැම්බර් 31 වැනි දිනට සාමාජිකයින්ගේ ශේෂයන්හි මුළු ගණන රුපියල් දශ ලක්ෂ 43,768.7 ක් ව පැවති අතර, එය 1990 වර්ෂයේ ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 7,471.0 ක හෙවත් සියයට 20.5 ක වැඩිවීමකි.

### ආයෝජන

1990 වර්ෂයේ ආයෝජනය කල රුපියල් දශ ලක්ෂ 11,044.7 සමඟ සසඳා බලන කල සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී, අරමුදල මගින් රජයේ සුරකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් සහ අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි (1991 ඔක්තෝම්බර් මස 21 දින සිට) ආයෝජනය කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ 16,014.4 කි. මෙය 1990 දී පැවති ආයෝජන මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 4,967.7 ක වැඩි වීමකි. 1991 දෙසැම්බර් 31 වන විට අරමුදල සතු මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 46,246.3 ක් වූ අතර එය 1990 මුළු ආයෝජන මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 7,779.6 ක වැඩිවීමකි. මෙයට අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි ආයෝජනය කරන ලද රුපියල් දශ ලක්ෂ 20.0 ක මුදලද ඇතුලත් වේ.

### ආයෝජන වලින් ලැබූ ආදායම

1989 දේශීය ආදායම් සංශෝධිත පනතේ වගන්ති අනුව සේ.අ.අ. ට දෙන ලද ආදායම් බදු නිදහස ඉවත් කරන ලදී. මේ අනුව 1989.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයෝජන මගින් උපයන ආදායම සියයට 10 ක රඳවා ගැනීමේ බද්දකට යටත්වේ. 1991 වර්ෂය සඳහා ආයෝජන ආදායම් වෙනුවෙන් අඩු කරන ලද රඳවා ගැනීමේ බද්ද රුපියල් දශ ලක්ෂ 564.8 ක් විය.

1990 වර්ෂයේ ආයෝජන මගින් ලැබූ රුපියල් දශ ලක්ෂ 4,187.6 සමඟ සසඳා බලන කල 1991 වර්ෂයේදී ආයෝජන මගින් ලද ආදායම රුපියල් දශ ලක්ෂ 904.1 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 5,091.7 ක් විය.

**ප්‍රතිලාභ ගෙවීම**

1990 වර්ෂය තුළදී සාමාජිකයින්ට ප්‍රතිලාභ වශයෙන් ගෙවන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 1,209.3 ක් වූ අතර, එය 1991 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 1,344.2 ක් විය. මෙය රුපියල් දශ ලක්ෂ 134.9 කින් හෙවත් සියයට 11.1 ක වැඩිවීමකි. 1990 වර්ෂයේදී ගෙවා නිම කරන ලද 44,813 ක් වූ ප්‍රතිලාභ හා සසඳන කල 1991 වර්ෂය තුළදී ප්‍රතිලාභ ඉල්ලුම් 38,910 ක් සඳහා ගෙවීම් කරණ ලදී.

**සාමාජිකයින්ගේ ශේෂයන් සඳහා වූ පොළිය**

සේවක අර්ථසාධක අරමුදල මගින් සෑම වර්ෂයකම අවසානයේ සාමාජිකයින්ගේ ගිණුම් වල ඇති ශේෂයන් සඳහා අරමුදලේ ආයෝජනයන් මගින් ලැබෙන ආදායමෙන් පොළී ගෙවිය යුතු වේ. 1991 වර්ෂය අවසානය වන විට සාමාජිකයින්ගේ ශේෂයන් සඳහා ගෙවිය යුතු වූ පොළී අනුපාතය වසරකට සියයට 11.5 ක් විය.

වර්ෂය අවසානය වන විට සාමාජිකයින්ගේ ගිණුම් වල බැරට ඇති සමුච්චිත ශේෂයන් සඳහා පොළී ගෙවනු ලැබේ. සාමාජික මුදල ලැබූ දිනය නොසලකා, වර්ෂය තුළ ලද සියළුම දායක මුදල් වෙනුවෙන් මුළු වර්ෂය සඳහාම පොළී හිමිවේ. උදාහරණයක් වශයෙන් වසරේ දෙසැම්බර් මාසයේදී ලැබුණු දායක මුදල් වලටද, එම වර්ෂයේ ජනවාරි මාසයේ ලැබුණු දායක මුදල් වලට මෙන්ම මුළු වර්ෂය සඳහාම පොළිය ගෙවනු ලැබේ. එම නිසා මෙම අරමුදල් ශේෂ වලට ගෙවන සඵල පොළී අනුපාතිකය තරමක් දුරට ඉහළ මට්ටමක පවතී.

**සේවක අර්ථසාධක අරමුදල් නිවාස ණය යෝජනා ක්‍රමය**

සාමාජිකයින්ගේ ගිණුම් වල බැරට ඇති ශේෂයන්ගෙන් සියයට 75 ක් දක්වා ආවරණය වන පරිදි නිවාස තැනීම් කටයුතු වෙනුවෙන් සමහර ණය දෙන ආයතන වලින් ණය ලබාගත හැකි වන පරිදි 1988 අංක 42 දරණ පනතින් සේ.අ.අරමුදල් පනත සංශෝධනය කරන ලදී. මෙම යෝජනා ක්‍රමය සඳහා සහභාගී වන ණය දෙන ආයතන වනුයේ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ රට තුල විසිරී පවතින විවිධ සේවා සමුපකාර සමිති වේ.

1991 දෙසැම්බර් 31 දින වන විට සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත ශේෂයන් තහවුරු කිරීම සඳහා ලැබුණු මුළු අයදුම් පත් සංඛ්‍යාවෙන් අයදුම්පත් 38,761 ක කටයුතු අවසාන කොට ආදාල කම්කරු කාර්යාලයන් වෙත යවන ලදී.

අරමුදලෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව සංසන්දනාත්මක ප්‍රකාශනයක් දැනට තිබෙන දත්ත පදනම් කර ගෙන 2.13 සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

**2.13 සංඛ්‍යා සටහන**

**සේවක අර්ථසාධක අරමුදල් සංඛ්‍යාන 1990 - 1991**

| | 1990 | 1991 |
|---|---|---|
| 1. ලැබුණු දායක මුදල් (රු.ද.ල.) | 3,909.5 (අ) | 4,421.3 (අ) |
| 2. ආයෝජන (රු.ද.ල.) | 11,044.7 (ආ) | 16,014.4 (ආ) |
| 3. ආයෝජන වලින් ලද ආදායම (රු.ද.ල.) | 4,187.7 | 5,901.7 |
| 4. ප්‍රතිලාභ ආපසු ගෙවීම් (රු.ද.ල.) | 1,209.4 | 1,344.5 |
| 5. ගෙවූ ප්‍රතිලාභ සංඛ්‍යාව | 44,813 | 3,891.0 |
| 6. පොළී අනුපාතිකය (%) | 11 1/2 % | 11 1/2 % |
| 7. සාමාජික ශේෂයන් සඳහා පොලී ප්‍රතිපාදන (රු. ද. ල.) | 4,174.2 | 5,041.2 |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) අවිනිශ්චිත ගිණුම් වලට බැර කල දායක මුදල් හැර
(ආ) රජයේ සුරකුම් පත් වල ප්‍රති-ආයෝජනය කළ කල් පිරුණු ප්‍රේෂණ ඵලයන් හා කෙටි කාලීන හා ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළඳ පළේ සහ ඒක්ෂණ මුදල් වෙළඳ පළේ ආයෝජනය කළ මුදල්ද ඇතුලත්ය.

## විනිමය පාලන

1991 වර්ෂය තුලදී මහ බැංකුව විසින් විනිමය පාලන ක්‍රියා මාර්ගයන් සම්බන්ධයෙන් පහත සඳහන් වෙනස්කම් ඇති කරන ලදී.

### 1. ආනයන

(අ) බන්ධිත ගුදම් ක්‍රමය යටතේ අමුද්‍රව්‍ය ආනයනය.

මෙම ක්‍රමය මූලික පෙරහුරුවක් ලෙස ආරම්භ කරන ලද්දේ අපනයනය සඳහා නැඹුරු වූ නිමි ඇඳුම් නිෂ්පාදකයින් සඳහා දින 120 ක් ප්‍රමාද වී ගෙවීම් කිරීමේ පදනම මත හා ණයවර ලිපි විවෘත නොකොට ගෙවීම් මත ලියවිලි පදනම මත (23.01.90 දින දරණ මෙහෙයුම් පත්‍රිකා අංක ඊසී/4/90 (බී) ) අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වන අතර එය කාලීනව දීර්ඝ කරන ලදී. එසේම අපනයනය පදනම් වූ වර්ග කරන ලද මැණික් ගල් කර්මාන්තය සඳහා දියමන්ති හැරුණු කොට රළු මැණික් ගල් ආනයනය කිරීම සඳහා දින 90 ක් දක්වා අඩු කල කාලයක් සහිතව ඉහත සහනයම ලබා දෙනු ලැබිණ. එහෙත් ලබා දෙන ලද මෙම පහසුකම ක්‍රියාත්මක කරන ලද කාල පරිච්ජේදය තුලදී කර්මාන්ත කරුවන් විසින් මෙය ප්‍රයෝජනයට නොගන්නා ලද හෙයින් 1991 මාර්තු මස අවසානයේදී එය අහෝසි වීමට ඉඩ හරින ලදී. කෙසේ වුවද අපනයනය පදනම් වූ දියමන්ති කර්මාන්ත කරුවන් විසින් කරන ලද ඉල්ලීම් අනුව මෙම ක්‍රමය සංශෝධනය කොට දියමන්ති ආනයනයද මෙම විෂය සීමා ව යටතට ගන්නා ලදී. (1991.12.11 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/113/91/බී).

(ආ) ප්‍රමාද වී ගෙවීමේ පදනම මත (D/A) ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම.

ප්‍රමාද වී ගෙවීමේ පදනම මත ඉහළ ප්‍රමුඛතා අංශ සඳහා (උදා: අපනයන, සංවර්ධනය පදනම් වූ කර්මාන්ත සහ කෘෂිකර්මාන්තය) සහ ඉතා අත්‍යාවශ්‍ය භාණ්ඩ (උදා: - ළදරු කිරි පිටි, ඖෂධ වර්ග සහ අධ්‍යාපනය) ආනයනය සඳහා පහසුකම් ලබාදීම බලයලත් වෙළඳුන් වෙත පවරන ලදී. (11.12.91 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/112/91 (බී) ) කෙසේ වුවද, ඉහත සඳහන් කළ ආනයන කාණ්ඩයන් යටතේ ඇතුලත් වුවද, විදේශීය හිමිකමක් සහිත සමාගම් (උදා: කොටස් වලින් සියයට 50 කට වඩා අනේවාසිකයින් සතු වූ) ආනයනය කරන

ප්‍රාග්ධන භාණ්ඩ සඳහා මෙම පහසුකම ලබා නොදෙන ලදී.

(ඈ) නැව තෙක් වියදම් සහිත පදනම් මත (නැ.වි.ස.) සහ පිරිවැය සහ රක්ෂණය පදනම මත (මි.ර.) ණයවර ලිපි විවෘත කිරීම.

නැ.වි.ස. සහ මි.ර. පදනම මත විනිමය පාලන දෙපාර්තමේන්තුවේ පූර්ව අවසරයකින් තොරව ඕනෑම නැවකින් හෝ ගුවන් යානයකින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම පිණිස ණයවර ලිපි විවෘත කිරීමට බලයලත් වෙළෙඳුන් වෙත අවසර දී ඇත. (1991.05.23 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී /33/91 (බී) ) මෙම සංශෝධනය මගින්, ජාතික ප්‍රවාහන සේවාවන් මගින් පමණක් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ වෙනත් ප්‍රවාහන සේවාවන් මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේදී ජාතික ප්‍රවාහන සේවයෙන් අවසර ගැනීමද තව දුරටත් අවශ්‍ය නොවේ.

(ඇ) ට්‍රැක්ටර්

වර්ෂ පහකට වඩා පැරණි නොවූ රෝද හතරේ ට්‍රැක්ටර් ආනයනය කිරීම සඳහා වූ කොන් දේසිය 1990 නොවැම්බර් මස 30 වෙනිදායින් අවසන් වූ වසරකට ක්‍රියාත්මක වූ අතර එය 1991 නොවැම්බර් 30 වෙනිදායින් අවසන් වන තවත් වසරක් සඳහා දීර්ඝ කරන ලදී. (1991.05.31 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී /04/91 (බී) )

(ඉ) ආරක්ෂක හිස්වැසුම්

ප්‍රවාහන සහ මහා මාර්ග අමාත්‍යාංශය මගින් දක්වන ලද රෙගුලාසි හා නියමයන්ට අනුකූලව, දැනට ආනයනය කරනු ලබන ආරක්ෂක හිස්වැසුම් ශ්‍රී ලංකා ප්‍රමිති 517 : 1981 දක්වන ලද "වාහන පාවිච්චි කරන්නන්ට ආරක්ෂක හිස්වැසුම් පිළිබඳ නියමයන් ව අනුකූල විය යුතුය. (1991.05.31 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී /34/91 (බී))

(ඊ) ආනයනකරුගේ පාවිච්චිය සඳහා භාණ්ඩ ආනයනය කිරීම.

ආනයනකරුගේ පාවිච්චිය සඳහා භාණ්ඩ, කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සඳහා යන්ත්‍රසූත්‍ර සඳහා අමතර කොටස් (වෙළඳ තොග වශයෙන් නොවන) ආනයනය කිරීම සඳහා ඇති සීමාව මිල රක්ෂණය සහ නැව් කුලී පදනම යටතේ ඇමෙරිකානු ඩොලර් 500 සිට 1000 දක්වා ප්‍රමාණයක් වැඩි කරන ලදී. (1991.07.12 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී /47/91 (බී) )

**2. අපනයන**

(අ) පහත දැක්වෙන කටයුතු බලයලත් වෙළෙඳුන් වෙත පවරන ලදී.

1. කෝපි සහ කැබලි ලෝහ අපනයනය
(1991.11.28 දින දරණ ඊසී /108/91 (එච්)

11. අළුත් වැඩියා කිරීමේ ගාස්තු, දළ සේයාපට සේදීම, මුද්‍රණය කිරීම සහ වර්ණ සංයෝජන ගාස්තු ප්‍රේෂණය
(1991.11.25 දින දරණ ඊසී /100/91 (එච්)

111. අළුත්වැඩියාව සඳහා යවන ලද භාණ්ඩ ආපසු ගෙන ඒම, පුද්ගලික ස්වර්ණාභරණ, පෞද්ගලික භාණ්ඩ අපනයනය, එතෙර සේදීම සහ මුද්‍රණය කිරීම පිණිස අපනයනය කරනු ලබන සිනමාත්‍රූපී දළ සේයා පට,

iv. ලැබුණු විදේශ ප්‍රේෂණයන් වෙනුවෙන් කෙරෙන වාණිජමය නොවන අපනයන, ජාත්‍යන්තර ණය කාඩ්පත් මගින් රට තුළට ගෙනෙන මුදල්
(9ඊසී/105/91 (එච්)

v. ඇමෙරිකානු ඩොලර් 3500 ක් දක්වා ත්‍යාග සහ වෙළෙඳ සාම්පලයන්
(1991.11.28 දින දරණ ඊසී /106/91 (එච්))

vi. අපනයනයන් වෙනුවෙන් හිමිකම්පෑම් ප්‍රේෂණය කිරීම (අඩු බර සහ ගුණය)
(1992.02.28 දින දරණ ඊසී /107/91 (එච්)

(ආ) මගීන් විසින් ගෙනෙන ලද පුද්ගලික අයිතමයන් ප්‍රති අපනයනය කිරීම.

විදේශයන්හි සිට ශ්‍රී ලංකාවට පැමිණෙන මගීන් විසින් ගෙන එනු ලබන පුද්ගලික අයිතමයන් (උදා: කුඩා පරිගණක සහ විද්‍යුත් උපකරණ) විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමකින් තොරව ප්‍රති අපනයනය කිරීම සඳහා අවසර දෙන ලෙසට ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජෙනරාල් වෙත දැනුම් දෙන ලදී.

(ඇ) අපනයනකරුවන්ට දෙනු ලබන විදේශ මුදල් ණය

අපනයනකරුවන් වෙත සපයනු ලබන රුපියල් ණය ප්‍රතිමූල්‍ය පහසුකම් සීමා කිරීමෙන් අනතුරුව, ඔවුන්ගේ අපනයන ඇනවුම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වාණිජ බැංකු වල විදේශ මුදල් බැංකු ඒකකයන් මගින් විදේශ මුදල් ණය ලබාදීම සඳහා වාණිජ බැංකු වල අවසර දෙන ලදී. මෙම පහසුකම ස්ථිර කරන ලද අපනයන ඇනවුම් වල මුළු වටිනාකමින් සියයට 70 ක් දක්වා සීමාවේ.
(1991.09.20 දින දරණ අංක ඊසී/66/91 (මි.ගැ.)

1991 අගෝස්තු මසදී විදේශ මුදල් ණය ගැනීමේ පහසුකම් තේ අපනයන කරුවන්ටද ලබාදුන් අතර පෙර තැව් ගත ණය අවශ්‍යතාවය මේ සඳහා වන ඉන්වොයිසි වටිනාකමෙන් සියයට 75 ක් දක්වා මූල්‍යකරණය කරනු ලැබේ. මෙම පහසුකම 1991.12.31 දින අවලංගු විය. (1991.09.26 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/70/91 (මි.ගැ.)

**3. චාරිකා**

(අ) 1991 මාර්තු මසදී ඉන්දියානු කලාපයේ සංචාරය කළ හැකි වාර ගණන වර්ෂ දෙකකට එක් වාරයක සිට වර්ෂයකට වරක් දක්වා ලිහිල් කරන ලදී. (1991.03.28 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/22/91 (කේ)). එසේම ඉන්දියානු කලාපයෙන් බාහිර සංචාරයන්හි වාර ගණනද වසරකට එක් වතාවක සිට ඕනෑම වතාවක් දක්වා 1991 ජූනි මසදී ලිහිල් කරන ලද අතර එය කොන්දේසි කිහිපයකට යටත් විය. එනම් මූලික විදේශ විනිමය හිමිකම නොඉක්මවීම හා සංචාරය එක වතාවකදී හැර ජාතික ප්‍රවාහන සේවය මගින්ම වීම. (1991.06.14 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/40/01 (කේ) ඉන්දියානු නොවන කලාපය සඳහා මූලික සලාකය 1991 නොවැම්බර් මස 1 වෙනි දින සිට ඇමෙරිකානු ඩොලර් 2500 ක් දක්වා වැඩි කරන ලදී. ( (1991.10.31 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/91/91 (කේ) මෙම මූලික හිමිකමට අමතරව රු.200,000 ක ආදායම් බදු ගෙවන නේවාසික වෘත්තීයික ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් උපරිම දින 14 කට යටත්ව ඉන්දීයනු කලාපීය රටවල් වෙනුවෙන් දිනකට ඇමරිකානු ඩොලර් 150 ක් ද, ඉන්දියානු කලාපීය නොවන රටවල් වෙනුවෙන් දිනකට ඇමෙරිකානු ඩෝලර් 225 ක් ද වශයෙන් විශේෂ දීමනාවක් දෙනු ලැබේ. ( (1991.03.20 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/15/91 (කේ)

(ආ) ඉන්දියාව සහ නේපාලයේ සංචාරය කිරීමට බලාපොරොත්තු වන වන්දනා කණ්ඩායම් සඳහා එක් පුද්ගලයෙකුට ඇමෙරිකානු ඩොලර් 600 ක විශේෂ දීමනාවක් ගෙන යෑමට අවසර ලැබේ. මෙම පහසුකම සියළුම ආගම් ලබ්ධිකයින් සඳහා හිමිවේ. (1991.03.28 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/22/91 (කේ)

(ඇ) මූලික හිමිකම් දීමනාව ලබා ගැනීම සඳහා අවශ්‍ය වන හය මසක අඛණ්ඩව පදිංචි වී සිටීමේ කාලසීමාවද ඉවත් කරන ලදී. (1991.03.27 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/19/91 (කේ)

(ඈ) ව්‍යාපාරික කටයුතු සඳහා සංචාරයන්හිදී වූ දෛනික හිමිකම් දීමනාවද වැඩි කරන ලදී. (1991.06.24 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/42/91 (කේ)

(ඉ) රේගුව වෙත විදේශ විනිමය හෙළිදරව් කිරීම ලිහිල් කිරීම

ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය ගමන් බලපත්‍ර හිමි කරුවන් හට ඇමරිකානු ඩොලර් 5000 ක් දක්වා හෝ වෙනත් පිළිගත හැකි විදේශ මුදල් වර්ගයකින් ඒ හා සමාන මුදලක් හෙළි දරව් නොකොට රට තුලට ගෙන ආ හැකිය. ( (1991.05.02 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/29/91 (ඩී) ශ්‍රී ලංකික නේවාසිකයින් හටද, විදේශ මුදල් ඇමරිකානු ඩොලර් 5000 දක්වා හෝ ඒ සමාන මුදලක් වෙනත් පිළිගත විදේශ මුදල් වර්ගයකින් හෙළිදරව් නොකොට හා චාරිකා කරන වාර ගණන නොසලකා තමන්ට රට තුළට ගෙන ඒමට හෝ පිටතට ගෙන යාමට අවසර ලැබේ. (රේගුව වෙත අමතන ලද ලිපියක්) එසේම මොවුන්ට පරිවර්ත්‍ය විදේශ මුදල් වලට අමතරව අපරිවර්තික නොවන විදේශ මුදල්ද රේගුවට හෙළිදරව් කිරීමෙන් රටතුළට ගෙන ආ හැකිය. (1991.03.27 දින දරණ ඊසී/18/91 (ඩී)

(ඊ) ප්‍රති පරිවර්තනය

පිටවීමේ ස්ථානයේ දී රේගුව වෙත හෙළිදරවු කරන ලද හෝ නොකරන ලද බව නොසලකා, මුදල් මාරු කිරීමේ රිසිට්පත් ඉදිරිපත් කිරීමට යටත්ව, විදේශීය ගමන් බලපත් හිමියන්, විසින් මෙරටට ගෙන එන ලද හෝ හය මසක් තුල ලැබූ, වියදම් නොකර ඉතිරිව ඇති ඇමෙරිකානු ඩොලර් 5000 ක් හෝ ඒ සමාන වෙනත් විදේශ මුදලක් දක්වා ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් නැවත පරිවර්තනය කල හැකිවේ. (28.08.91 දින දරණ ඊසී/62/91 (ඩී)) මෙසේ බැංකු මාර්ගයෙන් ලබාගත් මුදල් පිටවන ස්ථානයට අමතරව බලයලත් වෙළෙඳුන්ගේ ශාඛා වලින් බැංකු අණකර, විදුලි පැවරුම් සහ සංචාරක චෙක් පත් වලට මාරු කිරීමටද අවසර ලැබේ. ඇමරිකානු ඩොලර් 5000 ක් ඉක්මවන හෝ ඊට සමාන විදේශ මුදල් නැවත පරිවර්තනය කල හැකි වනුයේ රට තුලට ගෙන ආ හෝ ප්‍රේෂණය කල විදේශ මුදල් වලට අදාල කුවිතාන්සි ඉදිරිපත් කිරීමෙන් පමණක් වේ. (1991.11.12 දින දරණ ඊසී/111/91 (ඩී))

## 4. අධ්‍යාපන

එක්සත් රාජධානිය වෙත යන ශිෂ්‍යයින් වෙනුවෙන් ලබා දෙන ජීවන වියදම් දීමනාව 1991.03.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි පූර්ව උපාධි, වෘත්තීයික සහ කාර්මික අධ්‍යයනය සඳහා පවුම් 3120 සිට පවුම් 4800 ක් දක්වා ද පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා වාර්ෂිකව පවුම් 3840 සිට පවුම් 5400 දක්වාද වැඩි කරන ලදී. (1991.03.20 දින දරණ ඊසී/16/9/ (ඊ)) රුසියාව වෙත යන ශිෂ්‍යයන් හට ඇමරිකානු ඩොලර් 200 ක් දක්වා වූ මුදල් නෝට්ටු රැගෙන යාමේ අවසරය ඇත. (1991.10.17 දින දරණ ඊසී/79/91 (ඊ))

**5. ආයෝජන**

(අ) අනේවාසික විදේශ මුදල් ගිණුම් හිමියන්ට (අ.වි.මු.ගි.) එම මුදල් මහ කොළඹ ආර්ථික කොමිසම මගින් අනුමත කරන ලද ව්‍යවසායයන්හි ආයෝජනය කල හැකි අතර එවැනි ආයෝජන විකිනීමෙන් ලැබෙන විදේශ මුදල් ආදායම් ස්වකීය අ.වි.මු. ගිණුමට බැර කිරීමට අවසර ලැබේ. (1991.11.25 දින දරණ ඊසී/17/91 (ඩි))

සමස්ත ණය සීමාව සහ ගුණාත්මක ණය පිළිබඳ කොන්දේසි පාලනය, බැංකු මගින් තහවුරු කිරීමකට යටත්ව තුන්වන පාර්ශව කරුවන් වෙත අනේවාසික ගිණුම් ශේෂයන්ට එරෙහිව රුපියල් ණය ලබාදීමද කළ හැක. (1991.12.12 දින දරණ ඊසී/115/91 (ඩි))

(ආ) නේවාසික විදේශ විනිමය ගිණුම් (නේ.වි.වි.ගි.)

ඇමරිකානු ඩොලර් 500 ක් හෝ ඊට සමාන වටිනාකමින් යුත් වෙනත් විදේශ මුදල් තැන්පත් කල හැකි ශ්‍රී ලාංකික නේවාසිකයින්ට සහ අනේවාසිකයින්ට විදේශ මුදල් ගිණුම් පවත්වා ගැනීමට අවසර දෙන ලදී. මෙම විදේශ විනිමය ලැබුණු මාර්ගය කුමක් වුවත් ඒවා පිළිගැනීමට බලයලත් වෙළෙඳුන්ට අවසර ලැබේ. කෙසේ වුවත් ගිණුම් කළ යුතුය යන පදනම මත නිකුත් කරන ලද විදේශ මුදල් මෙම ගිණුමට බැර කිරීමට අවසර නොලැබේ. එසේම පසුගිය වර්ෂයට වඩා, පවත්නා වර්ෂයේ ඉහළ අපනයන ආදායමක් පෙන්නුම් කල සමාගම් වෙත, නේවාසික විදේශ විනිමය ගිණුම් පහසුකම් හිමිවේ. වාර්ෂික අපනයන ඉපයුම් වර්ධක වලින් සියයට 5 ක ප්‍රමාණයක් නේවාසික විදේශ මුදල් ගිණුම් වලට බැර කළ හැක. (1991.08.01 දින දරණ ඊසී/52/91 (ඩි) සහ (1991.08.13 දින දරණ ඊසී/60/91 (ඩි))

(ඇ) සුරකුම් වල ආයෝජනය කිරීම

1991.05.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදේශයන්හි සංස්ථාපිත සමාගම් වලට කොළඹ ව්‍යාපාර වස්තු වෙළඳපොලේ හුවමාරු වන සුරකුම්සඳහා ආයෝජනය කල හැක. අනුමත කළ දේශීය අරමුදල්, කලාපීය අරමුදල් සහ විදේශයන්හි නේවාසික ශ්‍රී ලාංකිකයින් ඇතුළු අනේවාසික පුද්ගලයන් මෙම ආයෝජනය කිරීමේදී ආදල වන කොන්දේසි සහ වගන්ති ඉහත සමාගම් වලට ද අදාල වේ.
(1991.07.03 දින දරණ අංක ඊසී/44/91 (සී සහ එප්) ).

**6. නැව් බඩු භාරදීමේ සේවා**

1990 ජුනි මස 20 වෙනි දින ප්‍රකාශිත අංක 615/15 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ගරු මුදල් අමාත්‍යතුමාගේ අණ පරිදි නැව් බඩු බාර දීමේ සේවාව, පිළිගත් සේවාවක් බවට පත් කරන ලදී. විනිමය පාලන පනතේ 29 බී ජේදයේ වගන්ති ප්‍රකාර විනිමය පාලක විසින් ශ්‍රී ලංකික නැව් බඩු භාරදීමේ සේවාවේ නියුතු පුද්ගලයන් සඳහා සමහර කොන්දේසි සහ අවශ්‍යතාවන් දක්වා ඇත. 1990 දෙසැම්බර් 20 වන දින අංක 641/15 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අවශ්‍යතා වගන්ති අනුව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයින් වෙනුවෙන් කරනු ලබන නැව් බඩු භාරදීමේ සේවාවන් නැව් ගත කළ දින සිට දින 30 ක් ඇතුලතදී ලියා පදිංචි කළ යුතුය. මෙසේ ලියා පදිංචි කිරීමේදී ප්‍රධාන ගුවන් බිල්පත, දේශීය ගුවන් බිල්පත, ප්‍රධාන නාවික බිල්පත, දේශීය නාවික බිල්පත සමඟ ගිණුම් ප්‍රකාශනයද අභ්‍යන්තර ප්‍රේෂණ ලැබීම් සහතික කර ඇති බැංකු පත්‍රිකාවද ඉදිරිපත් කළ යුතු වේ.

## 7. නේවාසික අමුත්තන්ගේ යෝජනා ක්‍රමය

මෙම ක්‍රමය ක්‍රියාත්මක කරන ආයතනය මගින් අනුමත කරන ලද නේවාසික අමුත්තන් වෙනුවෙන් ආයෝජන සහ නඩත්තු වියදම් සඳහා ශ්‍රී ලංකාවට එවන ලද විදේශ මුදල් සඳහා නේවාසික අමුත්තන්ගේ විදේශ මුදල් ගිණුම් (නේ.අ.වි.වි.ගි.) විවෘත කිරීමට බලයලත් වෙළෙඳුන් වෙත විනිමය පාලන දෙපාර්තමේන්තුව මගින් අවසර දී ඇත.

(1991.02.20 දින දරණ ඊසී/08/91 (සී සහ එප්) )

## 8. අවහිර කරන ලද අර මුදල්

විගමනය වූ හෝ විදේශීය රටක පුරවැසි බව ලබා ගත් ශ්‍රී ලාංකික පුරවැසියන් හා නැවත සිය රටට පැමිණිනු ඉන්දියානු හා පකිස්ථානු අය හැර අනේවාසික විදේශීය පුරවැසියන් සහ විදේශීය සමාගම් නමට බැර වූ අවහිර කරන ලද අරමුදල් නිදහස් කරන ලදී. (1991.02.20 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/24/91 (සී සහ එප්) )

## 9. මුදල් මාරු කරන්නන්

ශ්‍රී ලංකාවේ මුල් වරට මුදල් මාරු කරන්නන් පත් කරන ලද අතර ඔවුනට ශ්‍රී ලංකා රුපියල් හෝ අනෙකුත් විදේශීය මුදල් වලින්, විදේශ මුදල් නෝට්ටු හෝ කාසි මිලට ගැනීම හා හුවමාරු කිරීමේ බලය ලබා දුනි. (1991.02.18 දින දරණ මෙහෙයුම් උපදෙස් අංක ඊසී/07/91 (විමන) )

## රාජ්‍ය ණය

මුදල් නිති පනතේ 113 වැනි වගන්තිය ප්‍රකාර රජය වෙනුවෙන් රාජ්‍ය ණය පරිපාලනය තවදුරටත් මහ බැංකුව විසින් කරගෙන යනු ලැබිණි. මේ සම්බන්ධයෙන් රජයේ සුරකුම්පත්/ණය, භාණ්ඩාගාර බිල්පත්, බදු සංචිත සහතිකපත් සහ භාණ්ඩාගාර තැන්පතු සහතිකපත් ප්‍රධාන උපකරණ ලෙස යොදා ගන්නා ලදී. රජයේ "විදේශ ණය" පරිපාලනය හා සේවාකරණය කිරීමද දෙපාර්තමේන්තුව මගින් කරන ලදී. තවද රාජ්‍ය ණය පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය කිරීමද දත්ත බැංකුවක් පවත්වාගෙන යාම ද මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබිණ.

1991 අවසානය වන විට නොපියවූ දළ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 375,140.7 ක් වූ අතර එය වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 59,608.1 ක වැඩිවීමක් පෙන්නුම් කරනු ලැබිණි. 1991 අවසානය වනවිට නොපියවා තිබූ විදේශ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 214,348.7ක් විය. වර්ෂය තුළදී විදේශීය ණය වගකීම රුපියල් දශ ලක්ෂ 37,466.0 කින් වැඩි වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 15,902.9 ක් විදේශ විනිමය අනුපාතයේ අගය හීනවීම හේතුකොටගෙන සිදු වූ වැඩිවීමක් විය. නොපියවා තිබූ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 57.2 ක් විදේශීය ණය වූ අතර, දේශීය ණයවල කොටස සියයට 42.8 ක් විය.

අයවැය අවශ්‍යතා සපුරාලීම සඳහා වර්ෂය තුළ රුපියල් දශ ලක්ෂ 26,004.2 ක රුපියල් සුරකුම් පත් නිකුත් කරන ලදී. 1991 වර්ෂය තුල රුපියල් ණය ආපසු ගෙවීම් මුළු ප්‍රමාණය සහ පොලිය පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 13,857.3 ක් හා රුපියල් දශ ලක්ෂ 7,695.5 ක් විය. වසර අවසාන වන විට නොපියවා තිබුණු මුළු රුපියල් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 71,355.6 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 4,532 ක් ආරක්ෂක බැඳුම්කර වලින් සමන්විත විය. කලින් වර්ෂවල මෙන් 1991 වර්ෂයේදී ද සේවක අර්ථසාධක අරමුදල රුපියල් ණය සඳහා ප්‍රධාන දායකයා වූ අතර එය මුළු ප්‍රමාණයෙන් සියයට 51.39 කි. 1991 දී ජාතික ඉතිරි කිරීමේ බැංකුව මුළු ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 9,794 ක් හෝ සියයට 37.66 ක් සපයමින් සැහෙන ප්‍රමාණයකින් දායක විය.

1990 ඔක්තෝබර් 29 දින රුපියල් දශ ලක්ෂ 65,000 සිට රුපියල් දශ ලක්ෂ 90,000 දක්වා වැඩි කරන ලද භාණ්ඩාගාර බිල්පත් සඳහා වන අනුදත් සීමාව 1991 වසරේදී නොවෙනස්ව පැවතිනි. කල්පිරීමේ කාලසීමාව මාස 3, මාස 6 සහ මාස 12 සඳහා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මහ බැංකුව විසින් දිගටම කරගෙන යන ලදී. එසේම 1991 වර්ෂයේ පෙබරවාරි, මාර්තු, නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසවලදී ශ්‍රී ලංකා මහ බැංකුවට මාස 3 ට වඩා අඩු කාලපරිච්ඡේදයකින් කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් ද ඒ සමඟ නිකුත් කරන ලදී. ප්‍රාදේශීය කාර්යාලවලට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවද බලය ලත් වානිජ බැංකු හා මුදල් තැරැව්කරුවන් මගින් කොළඹදී ටැප් ක්‍රමය යටතේ මහජනයාට භාණ්ඩාගාර බිල්පත් විකිණීම අඛණ්ඩව කරගෙන යනු ලැබිණි. සමාලෝචනයට ලක්වන කාලය තුළ ජනතාව අතර භාණ්ඩාගාර බිල්පත් ජනප්‍රිය කරවීමේ කටයුතු තවදුරටත් කරගෙන යන ලදී. ප්‍රාථමික වෙළෙඳපොලේ මහ බැංකුව දැරූ කොටස 1990 වර්ෂයේ සියයට 45 සිට 1991 වර්ෂය අවසානයේදී සියයට 48 දක්වා වැඩි විය. වර්ෂය අවසාන වන විට, නොපියවා තිබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 72,968 ක් විය. වර්ෂය තුළ ගෙවූ මුළු පොලී ප්‍රමාණය දශ ලක්ෂ 10,419.5 ක් විය. මහ බැංකුව විසින් 1991 දී මිලදී ගත් නව නිකුත් කිරීම්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 5,000 ක් විය.

1990 මැයි 23 දා සිට ආරම්භ කරන ලද මාස 6, මාස 12 සහ මාස 24 කින් කල්පිරෙන භාණ්ඩාගාර තැන්පතු සහතිකපත් නිකුතුව නොකඩවා මහ බැංකුව විසින් කරගෙන යන ලදී. 1991 අවසාන වන විට නොපියවා තිබූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 152.5 ක් විය.

1991 දී රජය විසින් ලබාගත්තා ලද මැදිකාලීන හා දිගුකාලීන විදේශ ණය ප්‍රමාණය රුපියල් ලක්ෂ 25,740.8 ක් වූ අතර, ආපසු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 4,912.3 ක් විය. විදේශ ණයවල ව්‍යාපෘති

ණය ප්‍රමාණය සියයට 77.4 ක් වූ අතර ඉතිරි ප්‍රමාණය ව්‍යාපෘති නොවන ණය නියෝජනය කරන ලදී. විදේශීය ණය සඳහා මුළු පොලී ගෙවීම් හා අනිකුත් ගාස්තු ප්‍රමාණය 1991 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 4,122.2 ක් විය.

## ප්‍රාදේශීය කාර්යාල - මාතර, අනුරාධපුර සහ මාතලේ

1991 වර්ෂයේදී, මාතර, අනුරාධපුර සහ මාතලේ ප්‍රාදේශීය කාර්යාල ඒවාට පැවරී ඇති සම්ප්‍රදායික මහ බැංකු කටයුතු ඉටුකිරීමට අමතරව තම බල ප්‍රදේශවල සංවර්ධන කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

ඵලදායී ව්‍යාපෘති හඳුනාගැනීම, ඇගැයීම හා මූල්‍යකරණය සඳහා ණය දෙන ආයතන වෙත නිර්දේශ කිරීම, එවැනි ව්‍යාපෘති පසු විපරම් කිරීම; මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍යණය කරන ලද ග්‍රාමීය ණය යෝජනා ක්‍රම මෙහෙයුම් අධීක්ෂණය කිරීම; ප්‍රතිලාභීන් පුහුණු කිරීමේ වැඩසටහන් හා සම්මන්ත්‍රණ පැවැත්වීම; ප්‍රදේශවල ඇති සම්පත් හඳුනාගැනීම සහ ඒ ඒ ප්‍රදේශවල සංවර්ධන කටයුතු වලට සහභාගි වන රජයේ දෙපාර්තමේන්තු හා ආයතන සහ සංවිධාන අතර සම්බන්ධීකරණය ආදිය ප්‍රාදේශීය කාර්යාල මගින් කරන ලද සංවර්ධන කාර්යයන්ට ඇතුළත් වේ.

මෙම සංවර්ධන බැංකු කටයුතු අතරින් ප්‍රාදේශීය කාර්යාල වැඩි අවධානයක් යොමු කරන ලද්දේ දීප ව්‍යාප්ත ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම කෙරෙහිය. මෙම යෝජනා ක්‍රමය යටතේ මාතර ප්‍රාදේශීය කාර්යාලය 1991 වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 5.6 ක් වටිනා ණය ව්‍යාපෘති 575 ක් මූල්‍යකරණය සඳහා ණය යෝජනා ක්‍රමයට සහභාගි වන ණය දෙන ආයතන වෙත නිර්දේශ කරන ලදී. තවද මාතර ප්‍රාදේශීය කාර්යාලය අනෙකුත් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම යටතේ, ගොවිපල අයවැය හා මුදල් ප්‍රවාහ ලේඛන පිළියෙළ කිරීම, යෝජනා ක්‍රම වලට සහභාගි වන බැංකු, අනෙකුත් ආයතන හා මහජනතාවට අවශ්‍ය මඟපෙන්වීම ලබාදීම වැනි සේවාවන් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. මෙම අනෙකුත් ප්‍රතිමූල්‍ය ණය ක්‍රමයට, කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය හා මැද රට නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය ඇතුළත්ය. තවද, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය හා එක්ව, කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනවල නිලධාරීන්ට මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනුම වර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණයක් මාතර ප්‍රාදේශීය කාර්යාලයේදී පවත්වන ලදී.

අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය රුපියල් දශලක්ෂ 4 ක් වටිනා කුඩා සංවර්ධන ව්‍යාපෘති 217 ක් දීප ව්‍යාප්ත ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ නිර්දේශ කර ඇත. එම ප්‍රාදේශීය කාර්යාලය, 1991 වර්ෂයේදී, පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති 68 ක්ද දීප ව්‍යාප්ත ගොවිපල උපකරණ ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති 8 ක්ද මූල්‍යකරණය සඳහා නිර්දේශ කර ඇත. මෙම ප්‍රාදේශීය කාර්යාලය විසින් උසස් තත්ත්වයේ ගවයින් බෝකිරීම සහ ලොකු ළූණු වගාව තහා සිටුවීම සඳහා දිරිගැන්වීම් කටයුතු ද කරන ලදී.

මාතලේ ප්‍රාදේශීය කාර්යාලය, 1991 වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 10.1 වටිනා ස්වයං රැකියා ව්‍යාපෘති ණය 690 ක්, දීප ව්‍යාප්ත ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ ණය දෙන ආයතන වෙත නිර්දේශ කරන ලදී. පශු සම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශලක්ෂ 2.6 වටිනා ව්‍යාපෘති 168 ක්ද දීප ව්‍යාප්ත ගොවිපල යන්ත්‍රෝපකරණ ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශලක්ෂ 1.1 වටිනා ව්‍යාපෘති 59 ක්ද 1991 වර්ෂය තුළදී, මාතලේ ප්‍රාදේශීය කාර්යාලය විසින් නිර්දේශ කරනු ලැබිය. එමෙන්ම, මෙම ප්‍රාදේශීය කාර්යාලය කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘති 143 ක් පරීක්ෂා කර බලා මූල්‍යකරණය සඳහා අදාළ බැංකු වෙත නිර්දේශ කරන ලදී. අර්තාපල් වගාව සඳහා නියමු ව්‍යාපෘතියක් 91/92 වගා කන්නයේදී ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා ගොවීන් 31 දෙනෙකුට පුහුණුවීම් හා ණය පහසුකම් ලබාදෙන ලදී. පසුගිය වසරේ මෙන්ම මේ වසරේද මාතලේ ප්‍රාදේශීය කාර්යාලය, තමන් විසින් මූල්‍යකරණය සඳහා බැංකු වෙත

තිරිදේශ යොමු කරන ලද කුඩා පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන, අලෙවිය සඳහා සහාය විය. ඒ සඳහා මෙම වර්ෂය තුළදී සාර්ථකව විකුණුම් ප්‍රදර්ශන තුනක් සංවිධානය කරන ලදී.

තව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ කෘෂිකාර්මික ණය දීම හා අයකර ගැනීම සඳහා "ණය කඳවුරු" පැවැත්වීම ප්‍රාදේශීය කාර්යාල විසින් තවදුරටත් කරගෙන යන ලදී. 1991 වර්ෂය තුළදී, අනුරාධපුර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාල පිළිවෙළින් ණය කඳවුරු 9 ක් හා 17 ක් සිය බල ප්‍රදේශ තුළ පැවැත්වූහ. තවද, ගොවීන්, රැකියා විරහිත තරුණ තරුණියන් සහ ජනසවිලාභීන් සඳහා ප්‍රතිලාභී පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ කීපයක්ද ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වනු ලැබූහ. බැංකු මගින් සලසන සේවාවන් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහාත් ණය ලබාදීමේදී පැනනගින අවහිරතාවයන් හඳුනාගැනීම සඳහාත් ප්‍රාදේශීය කාර්යාල විසින් ගම් මට්ටමේ රැස්වීම් හා 'ජනහමු' තවදුරටත් පවත්වනු ලැබූහ. මෙම කාර්යයන්ට අමතරව, ප්‍රාදේශීය කාර්යාල, තම බල ප්‍රදේශවල සම්පත් සමීක්ෂණ පැවැත්වීමට අදාළ කටයුතු ආරම්භ කළහ. මෙම සමීක්ෂණ වල අරමුණ වන්නේ ප්‍රදේශයෙහි ඇති සම්පත් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමත් ඒවා ආදායම් උත්පාදනය කිරීමේ කටයුතු සඳහා යොදාගැනීම සැලසුම් කිරීමට ආධාර වීමත්ය.

1990 වර්ෂයේ මාතර හා අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයන්හි ආරම්භ කරන ලද ව්‍යවහාර මුදල් ඒකක, ඒ ප්‍රදේශවල වාණිජ බැංකු, ආයතන හා සාමාන්‍ය මහජනතාවගේ ව්‍යවහාර මුදල් අවශ්‍යතා සපුරාලීමෙහි තවදුරටත් නිරත වූහ. මෙයට අමතරව, මෙම ප්‍රාදේශීය කාර්යාල වල මුදල් සුරක්ෂිතාගාරවල මුදල් තැන්පත් කිරීමටත්, එම මුදල් ආපසු ගැනීමටත් වානිජ බැංකුවලට පහසුකම් සැලසූහ. තවද සංසරණයේ පවතින මුදල් නෝට්ටුවල පවිත්‍රතාව රැකගැනීමේ අවශ්‍යතාව පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් "පවිත්‍ර මුදල් නෝට්ටු සතියක්" පවත්වන ලදී. මෙම වැඩ සටහන අනෙකුත් ප්‍රදේශවලද ඉදිරියේදී ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ප්‍රාදේශීය කාර්යාල 1991 වර්ෂය තුළදීද, භාණ්ඩාගාර බිල්පත් විකිණීම තවදුරටත් කරගෙන යන ලදී. මාතර ප්‍රාදේශීය කාර්යාලය, පසුගිය වසර හා සසඳන කල සියයට 43 ක වැඩිවීමක් පෙන්වමින්, රුපියල් දශලක්ෂ 182 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් 1991 වසරේදී අලෙවි කරන ලදී. අනුරාධපුර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාල පිළිවෙළින් රුපියල් දශලක්ෂ 142 ක් හා රුපියල් දශලක්ෂ 102 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් විකුණූ අතර 1990 වසරෙහි දත්ත හා සසඳන කල මෙය අඩුවීමක් පෙන්නුම් කරයි.

ප්‍රාදේශීය කාර්යාල විසින් වාණිජ බැංකු සඳහා ලබාදෙන ලද ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශන පහසුකම් 1991 වර්ෂය තුළදීද තවදුරටත් ලබාදෙන ලදී. මාතර පිහිටි ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශනාගාරය විසින් රුපියල් දශලක්ෂ 2020 වටිනා චෙක්පත් 135,314 ක් නිශ්කාශණය කළ අතර අනුරාධපුර නිෂ්කාශණාගාරය රුපියල් දශලක්ෂ 550 වටිනා චෙක්පත් 89,791 ක් නිෂ්කාශනය කළේය. මාතලේ ප්‍රාදේශීය කාර්යාලයට අනුබද්ධිත මහනුවර හා මාතලේ නිෂ්කාශනාගාර 1991 දී, රුපියල් දශලක්ෂ 8707 වටිනා චෙක්පත් 387,647 ක් නිෂ්කාශනය කරන ලදී.

ප්‍රාදේශීය කාර්යාල විසින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් කටයුතු අතර මහ බැංකුවේ දීප ව්‍යාප්ත දත්ත එක්රැස් කිරීම අධීක්ෂණය කිරීම හා මහ බැංකුව විසින් කරනු ලබන ප්‍රාදේශීය සමීක්ෂණ සඳහා දත්ත එක්රැස් කිරීමට සහාය වීමද අන්තර්ගතය.

## ප්‍රවෘත්ති සහ ප්‍රකාශන

සංවර්ධන ප්‍රයත්නයන්ට, සංවර්ධන උපාය මාර්ගයන්ට හා එම කාර්යයෙහි ලා බැංකුව දැක්විය යුතු සහාය සම්බන්ධයෙන්, ප්‍රකාශයට පත් කරන ලද හා මෙතෙක් පත් නොකළ අදාළ දත්ත එක්රැස් කරගන්නා/බෙදා හරින්නා වශයෙන් පැවරී ඇති කාර්යභාරය ඉටුකරලීම සඳහා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ලෙස පෙරමුණෙහි විය. සාමාජික, ආර්ථික කරුණු පිළිබඳ

මැතකලීන උපනතීන් ඉතා සමීපව ග්‍රහණය කරගනිමින් දෙපාර්තමේන්තුව පර්යේෂකයන්ට හා ශිෂ්‍යයින්ට අදාළ තොරතුරු ලබාදීමෙහි නියුක්තව සිටියේය. මෙම අරමුණ සාක්ෂාත් කරගනු පිණිස දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ප්‍රකාශන මුද්‍රණය කොට මහජනතාව අතර ඒවා බෙදා හැරීමට කටයුතු සම්පාදනය කළේය.

1. වාර්ෂික වාර්තාව 1990 - (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි)
2. ආර්ථික සමීක්ෂණය - 1991 ප්‍රථම භාගය (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි)
3. මාණ්ඩලික පත්‍රිකා - වෙළුම 19 අංක 1 හා 2 (ඉංග්‍රීසි) වෙළුම 20 අංක 1 හා 2 (ඉංග්‍රීසි)
4. මාසික විවරණිකාව - සිංහල, දෙමළ හා ඉංග්‍රීසි.
5. ද්විමාසික ආර්ථික විවරණය (ඉංග්‍රීසි)
6. 1990 ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික ප්‍රගතීන්.
7. ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය සංඛ්‍යාලේඛන 1991
8. ශ්‍රී ලංකාවේ වර්ධනය සහ සමාජ ප්‍රගතිය.
9. තුන් වසරක අඛණ්ඩ ප්‍රගතිය.
10. බැංකු නොවන මූල්‍ය ආයතනවල රෙගුලාසි.
11. ශ්‍රී ලංකාවේ මූල්‍ය විකාශ ක්‍රමය පිළිබඳ නිබන්ධනය 1977-1985

දෙපාර්තමේන්තුව "සටහන", "නිව්ස් සර්වේ", "බැංකු පුවත්" නොකඩවා පළකල අතර, ලිහිල් කරන ලද ශ්‍රී ලංකා ආර්ථිකයේ විවිධාංශ පිළිබඳව සවිස්තරාත්මක පත්‍රිකාවක් ද නිකුත් කළේය.

වැදගත් දත්ත හා තොරතුරු සැපයීමේ මූලික පදනමක් වන පුස්තකාලයට, පොත්පත් හා පත්‍රිකා 858 ක් අළුතෙන් එක්රැස් කළ අතර, වර්ෂය තුළදී වාර ප්‍රකාශන 244 කට ද දායක විය. ආසියා පදනම, බැංකු හා වෙනත් ආයතන සමඟ පවතින හුවමාරු වැඩපිළිවෙළ හා ත්‍යාග යටතේ පොත්පත් සහ පත්‍රිකා 153 ක්ද පුස්තකාලයට ලැබිණි. මෙය, වසර තුළදී දත්ත පදනම තවදුරටත් පුළුල් කරගැනීමට උපකාරී විය.

ජනමාධ්‍ය සමඟ කිට්ටු සබඳතාවයක් පවත්වාගෙන යමින් අදාළ වර්ෂය තුළදී පුවත්පත් සාකච්ඡා කීපයක් ම පැවැත්වූ අතර, පුවත්පත් නිවේදන ගණනාවක් ද නිකුත් කරන ලදී.

තවද තොරතුරු බෙදාහැරීමේ එක් මාර්ගයක් වූ වාණිජ දැන්වීම් පිළියෙළ කිරීම්, බාහිර විශේෂඥයින්ගේ සහාය නොලබා සිදුකළ අතර, නිර්මාණය කළ දෘෂ්‍යරූප සැකසුම් වෘත්තීය මට්ටමක පැවතිනි.

බැංකුවට අදාළ වැදගත් සිද්ධීන් විඩියෝ පටගත කරන ලදුව, ඒවා බොහොමයක් ප්‍රවෘත්ති වැඩසටහන් සඳහා රූපවාහිනී සංස්ථාවට බාරදෙනු ලැබිණි. මීට අමතරව දෘෂ්‍ය රූප ඒකරාශි කර තැබීමෙහි ද වර්ධනයක් ඇතිකරගත හැකි විය.

ගුවන් විදුලිය හා රූපවාහිනී මාධ්‍යයන් ඔස්සේ අධ්‍යාපනික වැඩසටහන් මාලාවක් ද දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. නිදහස් ආර්ථිකයේ කාර්යක්ෂමතාවය හා එහි ප්‍රතිවිපාක එළි දක්වන වැඩසටහනක් ගුවන් විදුලිය හා රූපවාහිනිය ඔස්සේ ඉදිරිපත් කරන ලදී. ද්විභාෂා වැඩසටහන් මාලාවක් වූ මේ වැඩ සටහන්, බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරීන් 27 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදුවූ අතර, එම වැඩසටහන් සාකච්ඡා මණ්ඩප ස්වරූපයෙන් සැකසිණි.

බැංකුවේ මුද්‍රණ කටයුතුවලින් සියයට 75 ක්ම බැංකු මුද්‍රණාලය මගින් ඉටු කරනු ලැබූ අතර, ඉහත සඳහන් ප්‍රකාශන එම කාර්යයේ කොටසක් විය. 1991 වසර තුළ භාරගත් මුද්‍රණ කටයුතු සඳහා බැංකුව විසින් වැය කරන ලද නියම මුදල් ප්‍රමාණය, වෙළඳ පොළ මිළ ගණන්වලට සාපේක්ෂව සැලකිල්ලට ගැනීමේදී 1991 වසර තුළ මුද්‍රණ කටයුතු සඳහා රුපියල් ලක්ෂ 15 ක පමණ අවම ඉතිරියක් බැංකුවට ලබාගත හැකි විය. සමාලෝචිත වසර තුළදී මුද්‍රණාල ව්‍යාප්තියේ ප්‍රථම අදියර සම්පූර්ණ කරන ලදී. නව මුද්‍රණ යන්ත්‍ර ස්ථාපනයත් සමඟම වර්ණ හතරක් සහිත මුද්‍රණ පවා මෙහි සිදුකළ හැකි විය.

වසර තුළදී අලෙවි මධ්‍යස්ථාන පද්ධතිය තවදුරටත් පවත්වාගෙන යනු ලැබූ අතර, අළුතින් විවෘත කරන ලද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විකුණුම් කටයුතු කරගෙන යාමේ මධ්‍යස්ථානයක් ලෙස පවත්වා ගැනීමෙන් සිය සේවා විශාල පාඨක සංඛ්‍යාවක් දක්වා පුළුල් කරනු ලැබිණි.

## පර්යේෂණ කටයුතු

බැංකුවේ නිලධාරීන්, ස්වකීය මූලිකත්වයෙන් සහ අනෙකුත් ආයතනවල ඉල්ලුම් අවශ්‍යතා ඉටුකිරීම පිණිස පර්යේෂණ අධ්‍යයන ගණනාවක් කරනු ලැබිණ. ඒවාට ප්‍රතිපත්ති මූලික පර්යේෂණ මෙන්ම ශාස්ත්‍රීය වැදගත්කමකින් යුත් අධ්‍යයන ද ඇතුළත් ය. මෙයින් අධ්‍යයන අටක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික පත්‍රිකා වෙළුම් 20 හා 21 හි ප්‍රකාශයට පත් කර තිබේ.

## කළමනාකාරීත්ව විගණන

1991 වර්ෂය තුළ, කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව, එහි වැඩසටහනට අනුව, අනුරාධපුරය, මාතර සහ මාතලේ යන ප්‍රාදේශීය කාර්‍යාල ඇතුළුව බැංකුවෙහි විවිධ දෙපාර්තමේන්තුවල විගණනයන් පවත්වාගෙන යන ලදී. එසේම මෙම කාලපරිච්ඡේදය තුළ, දෙපාර්තමේන්තුව මගින් ගාල්ල සහ අනුරාධපුර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කටයුතු පිළිබඳව පුළුල් විගණනයක් කරනු ලැබිත.

විගණන කටයුතුවලදී වැඩි අවධානයක් යොමු වූයේ බැංකුවේ නීති හා රෙගුලාසිවලට අනුකූලතාවයක් නොදක්වා කටයුතු කර ඇති අවස්ථා පෙන්වා දීමටය.

විගණන කටයුතු හැරුණු විට, සලකා බලන කාලය තුළ, දෙපාර්තමේන්තුවේ කළමනාකාරිත්ව සේවා අංශය බැංකුවේ පරිපාලනය හා සම්බන්ධ විෂයයන් පිළිබඳව වැදගත් අධ්‍යයන හා සමීක්ෂණ කිහිපයක් ද සිදු කරන ලදී. මේ අධ්‍යයනවලට මහ බැංකුවේ මිනිස් බල උපයෝජනය, බැංකුවේ සවිකර ඇති දුරකථන, සුළු සේවක වේලාව සහ ගමන් පිළිබඳ අධ්‍යයනය, අතිකාල දීමනා අඩු කිරීම, වේලාව වාර්තාවන යන්ත්‍ර සවිකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නියමිත වේලාවට සේවයට වාර්තා කිරීම වැඩිදියුණුවීම ආදිය ඇතුළත් විය.

## සමීක්ෂණ, දත්ත එක්රැස් කිරීම සහ විශේෂ ප්‍රකාශන

### ජාතික ගිණුම්

1991 දී නිෂ්පාදන අංශයෙන් මෙන්ම වියදම් අංශයෙන් ද ජාතික ආදායම් ඇස්තමේන්තුවල ගුණත්වය තවදුරටත් වැඩි දියුණු කිරීමට මහ බැංකුව විසින් පියවර ගනු ලැබිත. මෙම ඇස්තමේන්තු සකස් කිරීමේදී ද්විතියික මූලයන්ට අමතරව ප්‍රාථමික මූලයන්ගෙන් ලබාගත් දත්ත වැඩි වශයෙන් උපයෝගී කරගන්නා ලදී. ආර්ථිකයේ විවිධ අංශ මෙන්ම අළුතින් බිහිවන ආර්ථික කටයුතු පිළිබඳ තොරතුරු ග්‍රහණය කිරීම පිණිස ප්‍රාථමික මූලයන්ගෙන් දත්ත රැස්කිරීම තවදුරටත් වැඩිදියුණු කරනු

ලැබිණ. ජාතික ගිණුම් සඳහා වූ දත්ත පදනම වැඩිදියුණු කිරීමට හා වසර තුළදී පැවති ආර්ථික උපනතීන් පිළිබඳ දර්ශක සැපයීම සඳහා විමසුමට ලක්වන වර්ෂය තුළදී හැකි සෑම අවස්ථාවකදීම කාර්තු පදනමක් මත දත්ත රැස්කරන ලදී.

**දිප ව්‍යාප්ත රැස්කිරීමේ ක්‍රමය**

1978 ආරම්භ කළ, දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ ක්‍රමය 1991 වර්ෂයේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල, ප්‍රධාන කෘෂිකාර්මික භාණ්ඩවල නිෂ්පාදන මිල, අසංවිධිත තේ, රබර් හා පොල් වගාව යන අංශවල හා ඉදිකිරීම් අංශයන්හි වැටුප් අනුපාතික හා ප්‍රධාන කෘෂිකාර්මික යෙදවුම් මිළ පිළිබඳ දත්ත දිවයින පුරා පිහිටි තෝරාගත් මධ්‍යස්ථාන 100 කින් පමණ ක්‍රමික පදනමක් යටතේ රැස් කරනු ලැබිණි.

මේ ක්‍රමය යටතේ, රජයේ පාසැල් ගුරුවරුන් විසින් තොරතුරු එකතු කරන ලදී. ආර්ථික ව්‍යුහයේ සහ භාණ්ඩවල සාපේක්ෂ වැදගත්කම පිළිබඳ වූ වෙනස්වීම් හේතුකොටගෙන මේ ක්‍රමය යටතේ දත්ත රැස්කරනු ලැබූ අයිතමයන් 1991 දී මුළුමනින්ම ප්‍රතිශෝධනය කළේය.

**පාරිභෝගික මූල්‍ය හා සමාජ-ආර්ථික සමීක්ෂණය 1986/87**

1991 දී, පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය - 1986/87 වාර්තාවේ දෙවැනි කොටස නිකුත් කරන ලදී. පුළුල් විෂය ප්‍රමාණයක් විග්‍රහ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සපයන මෙම වාර්තාවෙහි ජන විකාශ ලක්ෂණ, සමාජ ආර්ථික තොරතුරු, සේවා නියුක්තිය හා වියුක්තිය, ආදායම, වියදම, ඉතුරුම්, ආයෝජන සහ ණය හ සම්බන්ධ සවිස්තරාත්මක සංඛ්‍යා වගු 1126 සපයා ඇත.

දත්ත විග්‍රහයක් ඇතුළත් වාර්තාවේ පළමුවන කොටස මුද්‍රණයේ පවතී.

**ආදායම් වර්ධන කාර්යයන් සහ ප්‍රජා ණය නියාමක යෝජනා ක්‍රමය පිළිබඳ සමීක්ෂණය**

මහ බැංකුව ප්‍රජා ණය නියාමක ක්‍රමයේ බලපෑම අධ්‍යයනය කිරීමට 1990 දී ක්ෂේත්‍ර පරීක්ෂණයක් කරන ලදී. මාතලේ, මහනුවර, නුවරඑළිය සහ කැගල්ල යන දිස්ත්‍රික්කවල මෙම ක්ෂේත්‍ර සෝදිසිය පවත්වන ලදී. 1991 දී, මෙම පරීක්ෂණය පිළිබඳ වාර්තාවක් සකස් කොට ඉදිරිපත් කරනු ලැබිණ.

**ආනයන සුපරීක්ෂණය**

මුළු ආනයන හා එහි සංයුතිය පිළිබඳව පෙරදර්ශකයක් සැපයීමේ අරමුණින් සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, වානිජ බැංකුවල ණයවර ලිපි සහ ණය ලිපිවලට අමතරව ලැබුණු බිල් පදනම් කරගෙන එකතු කරගත් දත්ත මගින් ආනයන පිළිබඳව සුපරීක්ෂණය කිරීම දිගටම කරගෙන යන ලදී.

**විශේෂ ප්‍රකාශන**

නිදහස ලද දා සිට ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධන අවස්ථා සහ සමාජ වෙනස්වීම් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් "ශ්‍රී ලංකාවේ වර්ධනය හා සමාජ ප්‍රගතිය" නම් වූ ප්‍රකාශනය 1991 නොවැම්බර් මාසයේදී ප්‍රකාශයට පත්කරන ලදී. මෙම ප්‍රකාශනය ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ දියුණුව පිළිබඳ මෑත කාලීන සංවර්ධනයන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම වැඩි කිරීම අරමුණු කොට ගෙන මීට පෙර සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව නිකුත් කළ ප්‍රකාශන මාලා දෙකට අනුගත වූවකි.

ආර්ථික වර්ධනය, ජීවන තත්ත්වය ඉහළ යෑම, ඉතුරුම් සහ ආයෝජන, සේවා නියුක්තිය, විදේශ වෙළෙඳාම, ගෙවුම් ශේෂය, රාජ්‍ය මූල්‍යය සහ ආර්ථික සංවර්ධනයෙහි මහ බැංකුවේ කාර්‍ය්‍ය භාරය වැනි වැදගත් මාතෘකාවන්ගේ සවිස්තරාත්මක තොරතුරු වලින් මෙම කෘතිය සමන්විතය.

## පුහුණු කිරීම්

විමසුමට ලක්වන වර්ෂය තුලදී, මහ බැංකුව අධ්‍යාපනික මෙන්ම අධ්‍යාපනික නොවන ක්ෂේත්‍රයන්හි නිලධාරීන් පුහුණු කිරීමේ ස්වකීය ප්‍රතිපත්තිය දිගටම ක්‍රියාත්මක කරන ලදී. අධ්‍යාපනික පුහුණුවීම් යටතේ, පිළිගත් විදේශීය විශ්ව විද්‍යාලවල ආර්ථික විද්‍යාව හා අදාල ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන සලසනු ලැබිණි. ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධි ප්‍රමුඛ පාඨමාලා මීට ඇතුළත් විය. 1991 වර්ෂයේදී නිලධාරීන් 10 දෙනෙකු පශ්චාත් උපාධි අධ්‍යයනයන් සඳහා එතෙර යවනු ලැබිය.

අධ්‍යාපනික නොවන අංශයන්හි පුහුණු කිරීම්වලට මහ බැංකුවට ප්‍රයෝජනවත් විශේෂිත ක්ෂේත්‍රයන්හි දෙනු ලැබූ දේශීය හා විදේශීය කෙටිකාලීන පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩ මුළු සහ අධ්‍යාපන චාරිකා ආදිය ඇතුළත් විය. සලකා බලන කාලය තුළ කෙටිකාලීන පුහුණුවීම් සඳහා නිලධාරීන් 49 දෙනෙක් එතෙර යවනු ලැබිය. එම කාලය තුලදීම, නිලධාරීන් 117 දෙනෙකු ශ්‍රී ලංකාවේ විවිධ ආයතනවල දේශීය පුහුණු පාඨමාලාවලට සහභාගි වූ අතර, නිලධාළන් 246 දෙනෙකු ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වන ලද පාඨමාලා සඳහා සහභාගි විය.

පශ්චාත් උපාධි පුහුණු කටයුතු සඳහා විදේශවලට යෑමට බලාපොරොත්තුවන නිලධාරීන් සඳහා බැංකුව මගින් ආර්ථික විද්‍යාව හා ගණිත විෂයයන් ඇතුළත් පංති ද මෙහෙයවන ලදී. කොළඹ විශ්ව විද්‍යාලය මගින් මෙහෙයවනු ලබන "විදේශ අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි" පාඨමාලාව හැදෑරීම තවදුරටත් කරගෙන යෑමට විශ්ව විද්‍යාලය සමඟ කටයුතු පිළියෙල කරන ලදී. පුහුණු දෙපාර්තමේන්තුව, පශ්චාත් උපාධි සඳහා එතෙර යෑමට බලාපොරොත්තුවන නිලධාරීන්ට හා අළුතින් පත්වූ මාණ්ඩලික නිලධාරීන්ට ප්‍රයෝජනවත් වන පරිදි මෑතකාලීන ආර්ථික සංසිද්ධීන් ඇතුළත් මාතෘකා හා අදාලව පවත්වනු ලබන සම්මන්ත්‍රණ මාලාව අඛණ්ඩව කරගෙන යන ලද අතර අළුතින් පත්වීම් ලබාදුන් මාණ්ඩලික නිලධාරීන්ගේ යහපත සඳහා "බැංකු කටයුතු හා එහි ක්‍රියාකාරිත්වය" අළලා නේදිනක විශේෂ පුහුණු පාඨමාලාවක් ද පවත්වා යන ලදී.

බැංකුවේ පුහුණු සේවා වැඩ පිළිවෙළේ කොටසක් වශයෙන්, ගිණුම් හා මූල්‍ය පරිපාලනය පිළිබඳව පුහුණුවක් ලබාදීමට "සංස්ථාපිත මූල්‍ය මූලධර්ම" නම් වූ විශේෂිත පාඨමාලාවක් සංවිධානය කිරීම ද 1991 දී ආරම්භ විය.

දෙපාර්තමේන්තුව තම සුපුරුදු කටයුතු ලෙස මාණ්ඩලික හා මාණ්ඩලික නොවන ශ්‍රේණි සඳහා කාර්‍ය්‍යක්ෂම කඩඉම් පරීක්ෂණ සහ ශිල්පීය ශ්‍රේණි සඳහා උසස්වීම් පරීක්ෂණ ද පවත්වන ලදී.

## පරිශ්‍ර

පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය නඩත්තු කිරීම් කටයුතු සහ බැංකු කාර්‍ය්‍යාල නඩත්තු-කැර පවත්වාගෙන යෑමට අමතරව, කරගෙන යනු ලැබූ විශේෂ ව්‍යාපෘති පිළිබඳ වාර්තාවක් මෙහි පහත දක්වේ.

### 1. වත්මන් බැංකු ගොඩනැගිල්ල විශාල කිරීම සඳහා අළුතින් කොටසක් ඉදිකිරීම

මේ ව්‍යාපෘතිය වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබූ ටෙන්ඩර්, අගය කිරීමේ කමිටුව මගින් අගැයීමකට භාජනය කරන ලදුව එහි වාර්තාව කැබිනට් මණ්ඩලය විසින් පත් කරනු

ලැබූ ටෙන්ඩර් මණ්ඩලය වෙත භාර දෙන ලදී. ටෙන්ඩර් මණ්ඩලය සිය නිර්දේශය 1992 පළමුවැනි කාර්තුව තුළ කැබිනට් මණ්ඩලය ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කර ඇත.

## 2. මහනුවර කාර්යාල සංකීර්ණයේ 1 වැනි අදියර තැනීම

1991 වර්ෂයේ ප්‍රථම භාගයේදී මහනුවර කාර්යාල සංකීර්ණයේ I වැනි අදියර සැලසුම් කිරීමේ කටයුතු අවසන් කරන ලදී. 1991 අගෝස්තු මාසයේදී එහි තැනීම් කටයුතු ආරම්භ කරන ලදුව වසර අවසාන වනතුරු එහි වැඩ සාර්ථකව කරගෙන යන ලදී. I වැනි අදියරේ කටයුතු 1992 මැයි අවසානයේදී නිම කිරීමට අපේක්ෂිතය. 1991 වර්ෂය තුළ II වැනි අදියරේ සැලසුම් ද අදින ලදුව අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

## 3. බහු මහල් කාර් නැවතුම්පොළ

ප්‍රා.ග්‍රා.සං.බැංකු විසින් ආධාර සපයන ලදුව ස්වයං රැකියාවල නියුක්තවූවන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වෙළෙඳසැල් වශයෙන් යොදා ගැනීමට හැකි කඩ කාමර ගණනාවකින් ද යුක්ත බහු-මහල් මෝටර් රථ නැවතුම් පොළ තැනීමේ කටයුතු 1990 දෙසැම්බර් මස ආරම්භ කළ අතර 1991 වර්ෂයේදී ද එම කටයුතු සාර්ථකව කරගෙන යනු ලැබිණි. 1992 පළමුවැනි කාර්තුවේදී මේ ව්‍යාපෘතියේ කටයුතු අවසාන කිරීමට බලාපොරොත්තු වනු ලැබේ.

## 4. නුවරඑළියේ සංචාරක බංගලාව සහ නිවාඩු නිකේතනය

1990 දී තැනීම ආරම්භ කරන ලද සංචාරක බංගලාවේ කටයුතු 1991 ජූනි මාසයේදී නිම කරන ලදී. ඒ විගසම කාමර 15 කින් යුක්ත වූ නිවාඩු නිකේතනය ගොඩනැගීමේ කටයුතු ආරම්භ කරන ලදී. 1991 දෙසැම්බර් මස අවසානය වන විට එහි දෙවැනි මහල දක්වා තැනීමේ කටයුතු කර තිබුණි.

## 5. නුවරඑළියේ සමාකාර බංගලාව

1991 අගෝස්තු මාසයේදී සමාකාර බංගලාව සැලසුම් කිරීමේ කටයුතු සූදානම් කරන ලදුව, 1991 ඔක්තෝබර් මාසයේදී එහි තැනීම් කටයුතු ආරම්භ කරන ලදී. 1991 දෙසැම්බර් මාසයේදී, එනම් මාස 3 ක් ඇතුළත, එහි සියළුම තැනීම් කටයුතු නිම කරන ලදී.

## 6. මාතර කළමනාකරුගේ නිල නිවාසය

1991 වර්ෂය ආරම්භයේදී මාතර ප්‍රාදේශීය කළමනාකරු සඳහා නිල නිවාසයක් තැනීම ආරම්භ කරන ලදුව, කලින් නියම කරගත් පරිදි වර්ෂය අවසානවීමට පෙර එහි කටයුතු නිමකරන ලදී.

## 7. රාජගිරියේ අළුත් ගොඩනැගිලි සංකීර්ණයක් හා වැඩපලක්

අළුත් ගොඩනැගිලි සංකීර්ණයක් හා උපකරණ සියල්ලෙන්ම සම්පූර්ණ වැඩපලක් තැනීම සඳහා රාජගිරිය ප්‍රදේශයෙන් අතිරේක ඉඩම් කොටසක් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගන්නා ලදී. 1991 වර්ෂයේදී මූලික සැලසුම් කටයුතු සූදානම් කර අවසාන කරන ලදී. 1991 ඔක්තෝබර් මාසයේදී පටන් ගත් වැඩපල තැනීමේ කටයුතු 1991 දෙසැම්බර් මාසයේදී අවසන් කරන ලදී.

## සුභ සාධන

සුභ සාධන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන් සඳහා වූ පහත සඳහන් සුභ සාධන සේවාවන් පරිපාලනය කරනු ලැබේ.

1. නිවාස ණය ක්‍රමය
2. කාර්ය මණ්ඩල සුභ සාධන ක්‍රමය
3. වාහන ණය ක්‍රමය
4. වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය
5. අර්ථසාධක ණය ක්‍රමය.

සුභ සාධන ක්‍රම යටතේ දෙනු ලබන සියළුම ණය 1991 දෙසැම්බර් මස සිට සියයට 40 ක අවම අතට ලැබෙන වැටුප් සීමාවකට යටත් වනු ඇත.

බැංකු චිකිත්සාගාරයෙහි සෑම වැඩ කරන දිනයකදීම මුළු කාර්යාල වේලාවේදී වෛද්‍ය වරියකගේ පූර්ණ සේවාවක් ලබා දෙයි. එහි ඖෂධාගාරයේ වට්ටෝරු සහ පොදු බෙහෙත් ලබාගැනීමට ඇත. තවද චිකිත්සාගාරයෙහි විද්‍යාත්කන්තු රේඛා පරීක්ෂණය, නිරාහාර රුධිර ශර්කරා (මට්ටම), සහ අතරින් පතර රුධිර ශර්කරා පරීක්ෂණ ලබා දීමටද පහසුකම් සපයා ඇත

# කාර්ය මණ්ඩල පුවත්

1991 වර්ෂයේදී අධිපති ආචාර්ය එච්.එන්.එස්. කරුණාතිලක මහතා පහත සඳහන් සම්මේලන හා රැස්වීම්වලට සහභාගි විය.

(1) ඉන්දුනිසියාවේ පැවති 26 වැනි අග්නිදිග ආසියාතික මහ බැංකු (සියැසන්) අධිපතිවරුන්ගේ සම්මේලනය.

(2) පකිස්තානයේ පැවති ආසියානු නිෂ්කාශණ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම.

(3) නෙදර්ලන්තයේ පැවති අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ සමාජය පිලිබඳ ලෝක සමුළුව.

(4) ලන්ඩන්හි පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපතිවරුන්ගේ වාර්ෂික රැස්වීම.

(5) පිළිවෙලින් මලයාසියාවේ සහ තායිලන්තයේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය මුදල් ඇමති වරුන්ගේ හා මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ/ලෝක බැංකුවේ අධිපති මණ්ඩලයේ වාර්ෂික රැස්වීම්.

(6) ජපානයේ පැවති සියැන්සා මහ බැංකු අධිපතිවරුන්ගේ මණ්ඩලයේ 19 වැනි රැස්වීම.

අධිපති ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටි අවස්ථාවන්හිදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් පත්කරනු ලැබූ නියෝජ්‍ය අධිපති ආචාර්ය එස්.ටී.ජී. ප්‍රනාන්දු මහතා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියා සහ මුදල් මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරණ ලදී.

මුදල් අමාත්‍යාංශයේ ලේකම් නොමැති අවස්ථාවලදී ඔහු වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් එච්.බී. දිසානායක මහතා මුදල් මණ්ඩල රැස්වීම්වලට සහභාගි විය.

## පත්වීම්

උපදේශක එස්.රීප්පරදාසන් මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

මහ බැංකු සේවාවට නැවත පැමි එච්.එම්.ආර්. ඇල්ලේපොල මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

ප්‍රධාන ගණකාධිකාරී එන්.ඒ.ධර්මබන්දු මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

විනිමය පාලක පී. අමරසිංහ මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ ජී.එම්.පී.ඩී.ද සිල්වා මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උපදේශක තනතුරට පත්කරන ලදී.

එස්. පට්ටිවිදාන මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සුභ සාධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

සුභසාධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සී. අබේනායක මෙනෙවිය 1991 ජනවාරි මස 1 දින සිට බලපැවැත්වෙන පරිදි ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

දත්ත සැකසුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එම්.අයි.එෆ්. හමීඩ් මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්.ආර්. ප්‍රනාන්දු මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විනිමය පාලක වශයෙන් පත්කරන ලදී.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එස්.එස්. කොළඹගේ මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි දත්ත සැකසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

අතිරේක ප්‍රධාන ගණකාධිකාරී එම්.බී. දිසානායක මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන ගණකාධිකාරී තනතුරට පත් කරන ලදී.

පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජී.ඒ. පෙරේරා මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

සේවක අර්ථසාධක අරමුදලේ වැඩබලන අතිරේක අධිකාරී කේ.සී.එම්. ගුණසේකර මහතා 1991 ජනවාරි මස 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී වශයෙන් පත්කරන ලදී.

බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ සී.ටී. ජයසූරිය මහතා 1991 සැප්තැම්බර් මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වූ ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මහතා 1991 සැප්තැම්බර් මස 10 වැනි දින සිට වැඩබලන අතිරේක ව්‍යවහාර මුදල් අධිකාරී වශයෙන් පත්කරන ලදී.

නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී ආර්.ජී. ජයරත්න මහතා 1991 සැප්තැම්බර් මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත්කරන ලදී.

නියෝජ්‍ය විනිමය පාලක එච්.ඒ.ජී. හෙට්ටිආරච්චි මහතා 1991 සැප්තැම්බර් මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ලේකම් වශයෙන් පත්කරන ලදී.

සුභ සාධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ටී.එච්.ඩී. පීරිස් මහතා 1991 සැප්තැම්බර් මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සුභ සාධන දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

නියෝජ්‍ය අධ්‍යක්ෂ, සී.අයි. ප්‍රනාන්දු මෙනෙවිය 1991 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

අතිරේක විනිමය පාලක, ඩී.එල්. ජයමාන්න මහතා 1991 ඔක්තෝබර් මස 8 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

ග්‍රාමීය බැංකු හා මණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජේ.ටී.ඩී. කරුණාරත්න මහතා 1991 ඔක්තෝබර් මස 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

## මුදා හරිනු ලැබ සිටි නිලධාරීන් (1991 දෙසැම්බර් මස 31 වැනි දිනට)

පහත නම් සඳහන් බැංකු නිලධාරීහු අමාත්‍යාංශවල රජයේ දෙපාර්තමේන්තුවල රාජ්‍ය සංස්ථාවල සහ ජාත්‍යන්තර සංවිධානයන්හි තනතුරු සඳහා මුදාහරින ලැබ සිටියහ.

ඒ.එස්. ජයවර්ධන මහතා, ලේකම් වශයෙන් කටයුතු කිරීම සඳහා කර්මාන්ත විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය වෙත

ආචාර්ය එල්.ටී.එන්. ප්‍රනාන්දු, බංගලා දේශය, භූතානය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව යන රටවල විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත

පී.එම්. නාගහවත්ත මහතා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා සැළසුම් අධ්‍යක්ෂ වශයෙන්, කටයුතු කිරීම සඳහා නිවාස හා ඉදි කිරීම් අමාත්‍යාංශය වෙත

ආචාර්ය ආර්. ජයමහ මහත්මිය මූල්‍ය හා බැංකු කටයුතු පිළිබඳ ජනාධිපති කොමිසමේ ලේකම් වශයෙන්,

එම්. රාමනාදන් මහතා ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට.

සී.ද එස්. ජයවර්ධන, සී. ලියනගේ, ඩබ්ලිව්.ඒ.ඩී.ටී. වීරසිහ, එන්.එම්. දයාරත්න යන මහතුන් සහ කේ. සරවනමුත්තු මෙනෙවිය මුදල් අමාත්‍යාංශය වෙත.

එස්.එම්.ඒ. සිරිවර්ධන මහතා සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වූ ණය ව්‍යාපෘතියේ පුත්තලම දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී වශයෙන්.

ජී.එච්. ප්‍රනාන්දු සහ එන්.එම්. ජයසේකර යන මහතුන් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වෙත.

## විශ්‍රාම ගැනීම්/ඉල්ලා අස්වීම

විධායක අධ්‍යක්ෂ, පී. වත්තේගම මහතා 1991 ජනවාරි මස 10 දින සිට ක්‍රියාත්මකවන පරිදි ශ්‍රී ලංකා මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

අතිරේක රාජ්‍ය ණය අධිකාරී, වී. සිවසුබ්‍රමනියම් මහතා 1991 මාර්තු මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

ව්‍යවහාර මුදල් අධිකාරී ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්. වනිගසිංහ මහතා 1991 ඔක්තෝබර් මස 29 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

උපදේශක වී.එන්.ඩී. නානායක්කාර මහතා 1991 නොවැම්බර් මස 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.